
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

2015 ජූනි මස 02 වැනි අඟහරුවාදා



# ආමිස පූජාවේ වැදගත්කම

ප්‍රතිපත්ති පූජාව තරම් උසස් සත්පුරුෂයක් තවත් නැත. නිර්වාණයට යා යුත්තේ මධ්‍යම ප්‍රතිපදාව නමැති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙනි. ඒ ගමනට ආමිසය ආධාරයකි. ප්‍රතිපත්ති පූජාව ආමිසයෙන් සකස් වන සැටි නිදර්ශනයකින් වටහා ගත හැකිය. මේ නිදර්ශනය බෝධි පූජාවයි.

බෝධි පූජාව යනු බෝධීන් වහන්සේට පුද සත්කාර කිරීමය. පහන් දල්වා, මල් පූජා කොට, බෝධිය මුලට ජලය වත්කිරීම සිදුකෙරේ.

ආදී කාලීන සමාජයේ මිනිස්සු රුක් වන්දනා කළහ. බෝධියට පිදීමද ඇතිවූයේ ඒ පිළිවෙතිනි. බුදුන් වහන්සේ මේ යාතු කර්මයට බෞද්ධ මුහුණුවරක් දුන්හ. උන්වහන්සේ කළේ බෝධි පූජාව සමාජයට අර්ථවත් ක්‍රියාවක් බවට පත්කිරීමය.

බුදුන් වහන්සේට බුදුවීමට බෝධිය උදව් විය. බෝධිය උන්වහන්සේගේ බුදුවීමට ආධාර කළහ. ඒ ආධාරය නිසා බුදු බවට පත් උන්වහන්සේ සතියක් මුළුල්ලෙහි බෝධිය දෙස බලාගෙන සමාධි සුවය වින්දහ. (අනිමිස ලෝචන පූජාවෙනි.)

බෝධි පූජාවට බෞද්ධ ආමිසයක් ලෙස සකස් වූයේ මේ කෘතඥතා ගුණය ඉස්මතු කරන ක්‍රියා පද්ධතියක් ලෙසය.

## සමථ භාවනාව

බෝධි පූජාවට බෝ මළුව පිරිසිදු කොට පහන් දල්වා මල් පුදති. ඒ ආමිසය ප්‍රතිපත්තියක් බවට පැමිණෙන්නේ යෝගාත්ම පහන් දල්වීම ආමිසයේ නිවන අවබෝධ කරන්නට උදව් වන විටය.

මල් පූජාව නිකම්ම මල් පූජාවක් නොකොට අනිත්‍ය ගැන උගන්වන අවස්ථාවක් කරගැනීම වැදගත්ය. මේ මල් සේම මගේ නිතත් නැතිව යන්නේ යයි සිතා මල් පුදා සමථ භාවනාවේ යෙදෙයි. ආමිසයෙන් මේ මිනින් දානමය ප්‍රතිපත්තියට ළං නොවන්නේය.

බුදු දහමේ ආමිසය පුද්ගලයකුට නොව ඉලක්කයක් සමූහයටම බෙදී යයි. දානයක් දෙනවිට පමණක් ආහාර පිළියෙළ කිරීමේ සිරක් තවත් අය තමන් හැකි පමණ ආහාර ද්‍රව්‍ය හා තවත් පිරිකර ගෙනැත් දෙති. ඒ අනුව දානයේ අනුමෝදනාව විශාල පිරිසකට හිමි වන්නේය.

ආමිසය සමාජ අර්ථය පතින් ඉතා වැදගත් වන අතර ප්‍රතිපත්ති පූජාවට මග හෙළිකරයි. දන්දී ලබන කුසල මිතු ජීවිතය සාර්ථක කර ගන්නට උදව් දෙයි. පියවිය විට යහපත් තැනක ඉපිද නිවන් අවබෝධ කරගන්නට අවස්ථාව සලසන්නේ මේ ආමිසයෙන් ලබාගත් කුසල් සම්භාරයයි. ලංකාවේ බිලවන්ට තිබූ මිථ්‍යා දෘෂ්ටි අතර පැතිරී ගිය දේව ආදී විශ්වාසවලින් බුදු දහම ගලා ගියේද එසේ පැතිරී යාමේ ලක්ෂණය හැටියට දැකගත හැකි වන්නේ පින් අනුමෝදන් කිරීමය. දෙවිවරුන්ට බුද්ධාග



මේ හැටියට මිනිස්සු පින් කොට ඒ පින් අනුමෝදන් කරති. ඉන්දියාවේ මෙන් අපේ රටේ දෙවියන් අදහන්නේ නැත.

කතරගම වන්දනාවේ යන අය කරන්නේ ප්‍රථමයෙන් කිරි වෙහෙරට ගොස් මල් පහන් පුදා, බුදුරදුන් වැඳ ඒ ලබාගන්නා පින් කතරගම දේවාලයට පැමිණ කතරගම දෙවියන්ට අනුමෝදන් කරවීමය.

අපේ අවශේෂ පන්සල්වලද දේව ප්‍රතිමා ඇත්තේ ඒ දේව විශ්වාසයන් හදු දුරන්නේ මේ පින් අනුමෝදන් නිසාය. දෙවියන් ඒ පින් බාරගෙන පින් කළ අයට ආරක්ෂාව ලබා දෙති.

ඒ ඒ දෙවියන් සම්බන්ධ වැදගත් කාග කර්ම මේ ආත්දමින් බෞද්ධ ආමිසය බවට පත්විය. කතරගම දෙවියන් වෙනුවෙන් දෙන දානය දෙස සිතා බලන්න.

මේ දානය දෙන්නේ කුඩා දරුවන් හිමිහි කරගෙන. දානයට යන්නේ කිරි, පලතුරු හා ධාන්‍ය වර්ගයි. ගමේ පොහෙට පෝෂණ ගුණය හිඟ දරුවන්ට ඒ දෙන දානය ඉතා වැදගත්ය. මෙවැනි දෙන මසක හත් අට වතාවක් කරගෙන දෙන දානය සිදුවූ නිසා ඒ මිනින් ගමේ සමාජයට ඇති කළ පෝෂණය වැදගත්ය.

සත්තිනි හා කිරි අම්මාවරුන්ට අම්මාගේ දානය ගැන කියති. මේ දානය දෙනු ලබන්නේ කිරි අම්මලාටය. අද නම් අපි කිරිඅම්මලා කියන්නේ වයසක උදවියට වුවත් පැරණි සමාජයේ දරුවන්ට කිරි දෙන අම්මලා කිරි අම්මාවරු ලෙස සලකනු ලැබිණි.

## පින් අනුමෝදන් කිරීම

කිරි දෙන අම්මලාට පෝෂණය අවශ්‍ය වෙයි. ධාන්‍ය, කිරි හා පලතුරු පෝෂණ ගුණයෙන් සාරය. එවා කිරි දෙන අම්මලාට ලබාදීම ඒ අම්මලාගේ පෝෂණය ගුණය නංවාලීමට යෝග්‍ය ක්‍රියාවක් විය. දානය මේ සමාජමය කාර්යය ඉටුකළ සෙයකි.

එබඳු දාන සමාජමය කාර්යයන් ඉටු කළ අතර ඒ දානයෙන් ලබන පින් දෙවියන්ට අනුමෝදන් කිරීමෙන් ආමිස පූජාව සිදුවිය. ආමිසය මෙසේ සමාජයීය අර්ථයක් ගෙන සකස් වූයේ බුදු දහම හේතු කොටගෙනය.

ඉන්දියාවේ සමාජය මේ ආත්දමේ දේවදාන කෙරෙහි මේ සමාජ අර්ථය හා පැමිණවීමේ ක්‍රියාව දක්නට නැත. බුදුදහම අපේ ජන ඇදහිලි හා විශ්වාසයන්හි ගලා ගිය නිසා මේ තත්ත්වය ඇතිවිය.

ආමිසය ජන ජීවිතයට ඉතා වැදගත් විය. පැරණි කෘෂිකර්මාන්තයට අවශ්‍ය වැවක් හදවන විට මෙන්ම වැවේ ජලය පරිහරණය කරන විටත් ප්‍රධාන තැනක් ගත්තේ ආමිසයයි. ජලය ගෙන අසල පන්සලේ බෝ ගස නාවනු ලැබිණි.

ඉන් පසුවයේ කවදත් මෙසේ වැවේ ජලය කුඹුරුවලට මිනිසුන්ට බෙදාගත් බවත්, වැවේ ජලය පිරිසිදු කොට රකින බවටත් කියවෙයි.

මහාචාර්ය නන්දසේන රත්නපාල

"මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."

දුඃඛ සත්‍යය දෙසූ දම්සක් පැවතුම් සූත්‍රයේදී ප්‍රාථමික ලෙසට තිබෙන්නේ (ඉපදීම දුකක් බව ප්‍රකාශ වන) 'ජාතිපි දුක්ඛා' යන පාඨයයි. ඉපදීම එසේ දුකක් සේ දැක්වෙන්නේ අප උපන් දිනය සිහිපත් කරනු ලබන්නේ මහත් සතුටින් බව රහසක් නොවේ. ළමා හා තරුණ වියේ සිටින අය පමණක් නොව මහල්ලෝද, සැමරුම් මඟින් සන්තර්පණය වෙමින්, සුබපැතුම් කරගනිමින් සැලසුම් විනෝද වී උපන් දිනය ආශිර්වාදයෙන් සිහිපත් කරති. මහා සංඝයා වහන්සේලා පවා උපන් හේතු වීමද යි සැලසෙන ජන්මෝත්සවය ප්‍රචලිත පිරිකර දානම් කරමින් අනුමෝදනා කරනු ලැබේ. අප සමහරෙක් 'තිබේ උපන් දිනය ඔබට ආශිර්වාදයක් අවශ්‍යවෙයිද?' යි ඇසුවොත් ප්‍රබවාදී පිළිතුරක් ලබාගැනීම අඩු නැත.

මෙලොවුතුරා බුදුරදුන්ගේ උපත සමරන්නේ ආමිස ප්‍රතිපත්ති පූජාවන්ගෙන් අති උත්කර්ෂයට පත්කරමිනි. එසේනු, ඉපදීම ආගම් අදහන්නන්ද සලකන්නේ තම ආගමික නායකයාගේ උත්පත්තිය ප්‍රීති උත්සවයන්ගෙන් සමරිය යුතු බවයි. එසේ නම් ජාතිය හෙවත් උපත දුකක් බව නැතිද?

උපත පිළිබඳ සඳහන් වන ජරා ව්‍යාධිභාවය සෝක පරිදේව දුක දෝමනස්සාදී උපන්නාගේ දුක්ඛතා වන නිසා දුකක් වන බව සමහරු සඳහන් කරති. ලෞකික සැප සම්පත් ආස්වාදය කරමින් ජරා ව්‍යාධි ආදී අප්‍රමාදී පක්ෂය අමතක කොට ලොව තමන් අමරණීය ලෙස ගත කරන පැන්න ගැන සිතා තමන්ට එම අවස්ථාව තිබිවුයේ ඉපදීම නිසා නොවේදැයි පැනන උත්පත්තිය ගැන ප්‍රමෝදයට පත්වෙයි.

එසේනම් බුදුරදුන් ඉපදීම දුකක් බව දේශනා කොට වදාළේ ඇයි?

සත්වයා විවිධ ආකාරයෙන් උපත ලබන බව ධම්මපදයේ එන

ගබ්භමෙකෙ උප්පජ්ජන්ති
නිරයං පාපකම්මිනො
සග්ගං සුගතිනො යන්ති
පරිනිබ්බන්ති අනාසවා

යන ගාථාවෙන් ප්‍රකාශ වේ. එනම් ඇතැම්හු මව් කුසෙහි උපදිති. පව් කළ තැනැත්තෝ අපායෙහි උපත ලබති. පින් කළ අය සුගතිවල උපදිති. ආශ්‍රව නැති රහත්හු පිරිනිවන් පාති යනුවෙනි.

සුගතියාමට මිනිස, දිව්‍ය, බ්‍රහ්ම වැනි ආත්ම භාවයන්හි ඉපදීම දුකක් වන්නේ කිම ද යන්න බව අපට පිළිගැනීමට සිදුවේ. 'කිච්ඡො මනුස්ස පටිලාභො' යනුවෙන් මනුෂ්‍යාත්ම ප්‍රතිලාභය දුර්ලභ බව බුදුරදුන් දේශනා කොට ඇත. කණ කැස්බෑවා විය සිදුරින් අහස දැකීම මෙන් මිනිසත් බවක් ලැබීම අතිශයින් විරල බව දේශනා කොට ඇත. මහ පොළොවෙහි ඇති පස් නියපිටට වන ප්‍රමාණය සුගතිවල උපත ලැබීමට උපමා කළ හැකි නම් ඉතිරි මහ පොළොවේ ඇති පස දුගතිවල ඉපදීම සිදුවේ යැයිද වර්ණනාවේ සඳහන් වේ.

ඉපදීම සුගතියට පමණක් සීමා වන්නක් නොවන බව වටහාගැනීමෙන් තේරුම් ගත යුත්තකි. ධර්මානුකූලව පලකතොත් සුගතියක උපත ලැබීම ඉතා දුර්ලභ වන අතර දුගතියට යෑමේ අවදානම ඉතා වැඩිය. සප්ත කාම ස්වර්ගයන්හි හා බ්‍රහ්ම ලෝකයන්හි ඉපදීමට ප්‍රාර්ථනා කරමින් මිනිස්සු පින් දහම් කරති. එහෙත් දුගතිය පතන්නෙක් නැත. දුගතියක උපන්නා පරන්ම ඇති විඳීමට සිදුවන්නේ සා පිපාසා, වද හිංසා ආදියමය. දුකම උරුම කරගත් දුගතියකි සත්වයාට නම් උපත ගැන සිහිපත්වීම සැනසීමක් නැත. එම දුකින් අත් මිදීමම ඔහු බලාපොරොත්තු වන කාලයයි.

සැරියුත් මහ රහතන් වහන්සේ සච්ච විභංග සූත්‍රයේදී 'ජාතිය' හඳුන්වා ඇත්තේ ඉපදීමත් ස්කන්ධයන්හි පහළ වීමත් හා දොළොස් ආයතනයන්ගේ ප්‍රතිලාභයත් වශයෙනි. එම ඉපදීම දුක්ඛානුභූතියක් බලන නොදන්වන බව පැහැදිලිය. ජරා යන්න විස්තර කරන්නේ දිරීම, දත් වැටීම, කෙස් රැවුල් පැසීම, ඉඳුරන් දුබලවීම යනුවෙන් දුක්ඛානුභූතියක් ලෙසිනි. එසේ නම් ඉපදීම දුකක් වන්නේ ජරා ව්‍යාධාදිය පැවතීමේ හේතුව නිසාය යනුවෙන් සැලකීම යුක්ති යුක්ත නොවේ. ඉපදීම දුකක් සේ විදුන්නට ගෙන දැකිය හැක්කකි. ඒ දුගතිවල ඉපදීම දුකක්ම වන බැවිනි.



# ඉපදීම සතුටක්ද? නැතිනම් දුකක්ද?

'යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිතැතින්ම දුකට හේතු වේ.'


අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ සියලු බෞද්ධයන් සලකන්නේ දෙවන බුදුන් ලෙසටය. උන්වහන්සේ ලක්දිව මිස්සක පව්වට වැඩම නොකරන්නට ලංකාවේ අද දක්නට ඇති බෞද්ධ ප්‍රබෝධය මෙන්ම හෙළ සංස්කෘතිය හා සභ්‍යත්වයද උදා නොවන්නට ඉඩ තිබිණ. එමනිසා අනුබුදු මිහින්දගමනය බෞද්ධයන් වූ අප සැමට අතිමහත් පූජනීය හා අමරණීය සිදුවීමකි. උන්වහන්සේ සිරිලකට වැඩම කළේ හුදකලාව නොවීමද වැදගත්ය. සුමන සාමණේරයන් හා භණ්ඩුක උපාසකවරයාද උන්වහන්සේ සමග ශ්‍රී ලංකාද්වීපයට පැමිණි බව වංශකථාවල සඳහන්ය. ඔවුන් දෙපළ මිහිඳු හිමියන්ගේ ළඟම ඥාතීහුද වූහ.

එද චිත්ත ප්‍රීතිය උදෙසා දඩ කෙළියේ ගොස් සිටි දේවානම්පියතිස්ස මහරජුට මිහිඳු හිමියන්ගේ ශාන්ත රූපය දකගන්නට ලැබුණේ අද වන් උතුම් පොසොන් පොහෝ දිනකදීය. මෙබඳු උතුම් දවසක රජතුමා දඩ කෙළියේ ගියේ ඇයිද යන ප්‍රශ්නය කෙනෙකුගේ හිත තුළ ජනිත විය හැකිය. එයට අනුමාන වශයෙන් අපට සිතාගත හැකි පිළිතුර වන්නේ එද පොසොන් පුන් පොහෝ දිනය ශ්‍රේෂ්ඨ දිනයක් ලෙසට එද සිටි රජතුමා ඇතුළු ජනතාව සලකන්නට නැති බවය. එසේ සැලකීමට තරම් අවබෝධයක් දෙවන පෑතිස් රජුට තිබුණේ නම් ඔහු එදින සතුන් මරා සතුටු වීම පිණිස දඩයමේ නොයනු ඇත. ඒ කෙසේ වෙතත් ඔහුගේ මිතුරු අශෝක මහරජුගෙන් හෙතෙම බුද්ධාගම පිළිබඳව යම්කිසි හැඟීමක් ඇති කරගෙන සිටීම නිසා එද මිහින්තලා ගල මුදුනට වැඩි අනුබුදු මිහිඳු හිමියන්ව දුටු එතල බිම දමා මහත් ගෞරවයෙන් පිළිගත් බව බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ.

රජතුමාගේ ධර්මය අවබෝධය දැනගැනීමේ අටියෙන් මිහිඳු හිමියන් ප්‍රකට "අඹ ප්‍රශ්නය" හා "ඥාති ප්‍රශ්නය" අසන්නට ඇති බව අපට අනුමාන කළ හැකිය. මෙය එක්තරා විදියකට ප්‍රථම මනෝමය බුද්ධි පරීක්ෂණයක් ලෙසටද අර්ථ ගැන්විය හැකිය. මෙම ප්‍රශ්නවලට රජතුමා ඉතා සාර්ථක ලෙස පිළිතුරු දීම නිසා මිහිඳු හිමියන් එම අවස්ථාවේ රජු ඇතුළු පිරිසට "චුල්ලහත්ථිපදෝපම" සූත්‍රය දේශනා කරන්නට තීරණය කළහ. මෙකී සූත්‍රයෙන් විස්තර කරනු ලබන්නේ යම් අයෙක් බුදුදහම පිළිගෙන භික්ෂුවක් වන ආකාරයයි.

එසේම භික්ෂුවකගේ අපිස් ජීවිත පැවැත්මට අවශ්‍ය මූලික කරුණුද උතුම් වත්පිළිවෙත් ගැනද මෙම සූත්‍රයෙන් කරුණු දක්වේ. බුද්ධ, ධම්ම, සංඝ

# අසිරිමත් මහින්දාගමනය



"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි, පරලොවත් ශෝක කරයි, දෙලොවම ශෝක කරයි."


යන තුන්රුවන පිළිබඳව මහා අවබෝධයක්ද ගෙන දෙන මෙම වටිනා සූත්‍රය ඒ අනුබුදු මිහිඳු හිමියන් තම ප්‍රථම ධර්ම දේශනාව ලෙසට එදා තෝරාගන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැකිය. බුදුමගේ ප්‍රධානතම ඉලක්කය වන රහත් ඵලය පිළිබඳවද ඉතා වටිනා කරුණුවලින් චූලහත්ථිපදෝපම සූත්‍රය සමන්විත වේ. චතුරාර්ය සත්‍යය වැනි බුදුදහමේ ඉගැන්වෙන වැදගත් ආර්ය මාර්ග සියල්ලම පාහේ මීට ඇතුළත් වේ. මෙහිදී මිහිඳු හිමියන්ගේ මූලික අරමුණ වූයේ බුදුදහම හා භික්ෂු ජීවිතය පිළිබඳව රජතුමා තුළ මහා අවබෝධයක් ඇතිකරලීම බව ඉතා පැහැදිලිය. මෙම දේශනාවට මහත් භක්තියෙන් සවන් දුන් දේවානම්පියතිස්ස රජතුමා බුදුදහම වැළඳ ගන්නට කැමැත්ත පළ කළේ අනුබුදු මිහිඳු හිමියන් ඉදිරියේ දෙගොත් මුදුන් දී වැඳ වැටීමෙනි.

ඉන්පසු පෙහෙතම මිහිඳු හිමි ඇතුළු මෙම පිරිසට අනුරාධපුර මහමෙව්නා උයනට වඩින ලෙසට ආරාධනා කළ අතර, එය පිළිගත් මිහිඳු හිමිපාණෝ ස්වකීය පිරිසක් සමඟ අනුරාධපුරයට වැඩම කළහ. අපේ බෞද්ධ ජනතාව දහස් ගණනින් පොසොන් පොහෝ දින මිහින්තලාවට හා අනුරාධපුර අටමස්ථානය වන්දනා මාන කරන්නට විශාල වශයෙන් යන්නේ මිහිඳු හිමියන්ට කරන ගෞරවයක් වශයෙනි. පොසොන් අසිරියෙන් මෙම පුදබිම් දෙකම මේ වන විට එකම සිල් ගොඩක් බවට පත්වී අවසානය. සිල් සුවඳින් හා මල් සුවඳින් ඒකාලෝක වන මේ පූජා භූමි වන්දනා කරන්නට හැකිහැකි ජනතාව සිව්දිගින් අද අනුරාධපුරයට හා මිහින්තලයට ඇදී එති. ඔවුනට ආහාර පානාදියෙන් සංග්‍රහ කරන්නට දන්සල් රාශියක්ම මෙම පුදබිම් පරිශ්‍රයේ ඉදිකොට තිබීමද විශේෂත්වයකි. අපේ බෞද්ධයන්ගේ සිත් සතන් තුළ දන්දීමට ඇති කැමැත්ත ප්‍රකාශ වන්නේ මෙබඳු පුණ්‍ය ක්‍රියා මගිනි.

දේවානම්පියතිස්ස රජු බුද්ධ ධර්මය කෙරෙහි අතිශයින් පැහැදුණු අතර, බුදුදහම ශ්‍රී ලංකාද්වීපය තුළ පිහිටුවන ලෙසට අනුබුදු හිමිගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටියහ. දන් වැළඳීමෙන් අනතුරුව මිහිඳු හිමිපාණෝ රජ මැදුරේ රැස්ව සිටි පිරිසට ධර්ම දේශනා කළහ. මේ සඳහා උන්වහන්සේ තෝරාගත්තේ "විමානවත්ථුවේ" හා "ප්‍රේත වස්තුවේ" එන කථාය.

අනුබුදු මිහිඳු හිමියන් දින 26 ක් අනුරාධපුර මහමෙව්නාවේ වැඩ සිටි බව වංශකතාවල සඳහන්ය. අවිද්‍යාවෙන් ගිලී සිටි ජනතාවට බුදුදහම පිළිබඳව නිසි අවබෝධයක් ලබාදෙන්නට උන්වහන්සේ ධර්ම දේශනා රැසක්ම ගමින් ගමට වැඩම කරමින් දේශනා කළහ. මෙම දින 26 පසුව උන්වහන්සේ වස් විසීම සඳහා මිහින්තලාවට වැඩම කළ අතර ඒ සඳහා රජතුමා අවශ්‍ය පහසුකම් සලසා දුන් බව වංශකතාවල සඳහන් වේ. ඒ අනුව මිහින්තලේ කණ්ටක චෛත්‍යය අවට ගල්ලෙන් පවිත්‍ර කොට ආවාස සකසා දුන් බවද එහි වැඩිදුරටත් දක්වේ.

ලංකාවේ මෙහෙණි සසුන ඇතිවූයේ මිහින්දාගමනයෙන් පසුවය. අනුබුදු මිහිඳු හිමියන් අප රටට ගෙනාවේ නිර්මල බුදුදහම පමණක් නොවේ, අක්ෂර විද්‍යාව, කලා ශිල්ප,




ගෘහ නිර්මාණ කලාව, භාෂා සාහිත්‍යය වැනි දේවල්ද අපට ලැබුණේ මිහිඳු හිමියන්ගේ ශ්‍රී ලංකාගමනයේ ප්‍රතිඵලයක් වශයෙනි.

මිහ සහ කැලෑවල පිහිටි යෝධ ගල් පර්වතවලට බුදුන් වහන්සේගේ මෙත් කරුණා ගුණ කැටි කරමින් අපරිමිත භක්තියෙන් නෙලූ බුද්ධ ප්‍රතිමා වහන්සේලා ගෙළ කලාකරුවන් අතින් නිමවූ ශ්‍රේෂ්ඨ නිර්මාණයන්ය. "සමාධි" සහ "අව්කන" බුදු පිළිම වහන්සේලා දෙනම ඊට කදිම නිදසුනකි. එම ප්‍රතිමා අනුබුදු හිමි ශ්‍රී ලංකාවට ගෙන දුන් මහඟු දායාදයක් ලෙසට හැඳින්විය හැකිය. අද පොසොන් පොහෝ දින අනුරාධපුරයට හා මිහින්තලයට යන ඔබට මෙබඳු වටිනා බුදු පිළිම වහන්සේලා හා අසිරිමත් කලා නිර්මාණ දැක බුදු බැතිය වඩවා ගත හැකිය. "ඉසුරුමුණි පෙම් යුවළ හා සඳකඩ පහන" ඒ අතරින් සුවිශේෂිතය.

අහස් කුස සිඹින රුවන්වැලි මහා සෑය, ජේතවනාරාමය, මිරිසවැටිය, අභයගිරිය, සෝමාවතිය වැනි මහා චෛත්‍ය රාජයාණන් ඉදිකිරීමට එකල රජ කළ රජවරු පියවර ගත්තේ මිහිඳු හිමියන්ගෙන් ලද සංස්කෘතික, ආගමික හා කලාත්මක ආභාෂයෙන් සමගය. මිහිඳු සංස්කෘතිය අප සියලු බෞද්ධ ජනී ජනයාගේ හද ස්පන්දනයයි.

**නිව්ටන් ගුණසේකර**

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# දූකෙළියේ විපාක

පුද්ගල ආධ්‍යාත්මය හා ධනය විනාශ කරන දූකෙළිය සිව්වන දෝෂයයි. මෙයද කරුණු හයක් යටතේ විනාශයට පිරිහීමට හේතුවන ආකාරය පෙන්වා දිය හැකිය. එම කරුණු හය වන්නේ,

1. සූදුවෙන් දිනූ පසු සතුරන් ඇතිවීම
2. පැරදුණ පසු සිත් තැවීම ඇතිවීම
3. වස්තුව නාස්ති වීම
4. සමාජය විසින් සූදුකාරයන්ගේ වචන නොපිළිගැනීම
5. මිත්‍රාමාත්‍යාදීන්ගේ අවඥාවට ලක්වීම
6. අවාහ විවාහ අවස්ථාවන් ප්‍රතික්ෂේප වීම යන හයයි.

දූකෙළියේ යෙදීම නිසා ඉහත අලාභයන්ට පුද්ගලයා පත්වන බව සිගාල ගෘහපතියාට බුදුන් වහන්සේ දේශනා කොට ඇත. සූදුව යනු සමාජයේ බලවත්ම උවදුරකි. සමාජයට එය ඉතා බරපතළ පිළිලයක් සේ විපත්, විනාශයන් ගෙන දේ. කෙනකු සූදුව සඳහා යොමුවන්නේ දිනීම පරමාර්ථ කරගෙනයි. කිසිවකු හෝ පරාජය අපේක්ෂාවෙන් සූදු කෙළියේ නොයෙදේ. ඇතැම් පුද්ගලයන් පවසන්නේ විනෝදය සඳහා සූදු කෙළියේ යෙදෙන බවයි. එහෙත් සූදු කෙළියෙන් ලබන විනෝදය කුමක්ද? සූදුවේ යෙදෙන පුද්ගලයන් සියලු දෙනාට දිනුම් නොලැබෙන අතර ඇතැම් අයෙක් දිනන විට තව කෙනෙක් පරාජයට පත්වේ. දිනූ අය පරාජය වූ අයට ආශිර්වාද කිරීමක් හෝ පරාජය වූ අය දිනූ අයට ආශිර්වාද කිරීමක් නොකෙරේ. පරාජය වූ අය සාප කරමින්, හූල්ලමින් තම ධනය විනාශ වීම පිළිබඳ බලවත් පසුතැවිල්ලෙන් ක්‍රියා කරයි. සූදු කෙළියේදී ජය පරාජය දෙකම අයත් වන අතර එය දෙපිරිසක් අතර කලකෝලාහල වාදභේද ඇතිවීමටද බලපානු ලබයි.

සූදු කෙළිය යනු යහපත් ජීවන වෘත්තියක් නොවන අතර එය හොඳ ක්‍රියාවක්ද නොවේ. එමගින් ඇතිවන දෝෂ අතර පළමුවැන්න දිනූ කල සතුරන් ඇතිවීමයි. සූදුවෙන් ධනය ලබන තැනැත්තාට සතුරන් බහුල වේ. ජය ලබාගත් කල පරාජිතයන් එම ධනය නැවත ලබාගැනීමට විවිධ ක්‍රම මගින් උත්සාහ දරන අතර සමාජයේ එකී පුද්ගලයන්ට සතුරන් වැඩි වේ. සූදු කෙළියේ යෙදෙන පුද්ගලයන්ට සතුරන් බහුල වේ. ඔවුන් සමාජයේ ධනය පමණක් නොව සතුරන්ද උපයා ගනිති. තමන්ට මිතුරන්ට වඩා සතුරන් වර්ධනය වේ. තමා වටා මිතුරන් එකතු නොවන අතර සතුරන් එකතු වේ. හැම විටම සතුරන් කෙරෙහි බලාපොරොත්තු ඇතිව කටයුතු කළ යුතුයි. කොයි මොහොතක හෝ සතුරන් තමා වෙත පැමිණේවි යන බියෙන් නිතර ජීවත්වීමට සිදු වේ.

සූදු කෙළියෙහි දෙවැනි දෝෂය වන්නේ පරාජය වූ පසු සිත් පසුතැවිල්ල ඇති වීමයි. මන්ද හැම කෙනෙකුටම ජය ලබාගත නොහැක. සූදු කෙළිය සඳහා යන සියලු දෙනා ජය බලාපොරොත්තු වුවද හැම කෙනෙකුටම හැම විටකදීම ජය නොලැබේ. පරාජය කොයි මොහොතේ වුවද අත්වේ. පරාජය ලැබූ පසු කිසිවෙකුට සතුටක්, ප්‍රීතියක් ඇති නොවේ. ඇතිවන්නේ බලවත් සිත් වේදනාවකි. දුකකි. තමාට එමගින් පසුතැවීමක් ඇතිවේ. පරාජය වන හැම කෙනෙකුටම සිත් වේදනා ගෙන දේ. කිසිවෙකුටත් සතුටු විය නොහැක. ජයගත් අයට සාප කරමින්, ඔවුන්ට වෛර කරමින් කාලය ගත කිරීමට සිදුවේ. මෙය සූදු කෙළියේ ලක්ෂණයකි.

සූදු කෙළියෙන් පරාජයට ලක්වීම නිසා ඇතිවන වේදනාව ඉවසිය නොහැකිව පුද්ගලයන් සිය ජීවිතය

''මෝඩයා මට දරුවෝ ඇත, මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''


තකා ගැනීමටද පෙළඹේ. විශේෂයෙන් සූදු කෙළියේදී තමා සතු ධනය පරාජය වූ පසු තම අඹු දරුවන්ගේ කනකර ආභරණද, දේපළද උගසට තබා, යානවාහන, ඉඩකඩම් පවා විකුණා හෝ සූදු කෙළියේ යෙදේ. මෙහි ඉතා බරපතළ අවස්ථාව වන්නේ සූදු කෙළියේ අවසානය ජීවිත විනාශයන්ට හේතුවන හෙයිනි. තමන්ට සූදු කෙළීමට ධනය නොමැතිවීම අඹු දරුවන්ගේ වස්තුවද නොමැති වන විට අන් අයගේ දේපළ පවා හොරකම් කර සූදු කෙළියේ යෙදේ. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ එක් අපරාධයක් නිසා තව තවත් අපරාධ වැඩි ක්‍රියාවන් රාශියකට යොමුවීමයි. එමනිසා සූදු කෙළියෙන් සිත් තැවීම පමණක් නොව තමන්ගේ අඹු දරුවන්ගේද කලකිරීම සිත් වේදනා ඇතිකරවන ධනය වස්තුව විනාශ වන තරමට බරපතළ කරදර රාශියකටම ගොදුරු වීමයි. එමනිසා පරාජයට පත්වීම තුළින් ඇතිවන්නේ විශාල වූ පසුතැවිල්ලකි.

සූදු කෙළියේ යෙදීමෙන් සිදුවන තුන්වන දෝෂය වශයෙන් පැහැදිලි කරන්නේ වස්තුව විනාශ වීමයි. තමා සතු ධනය විවිධ ක්‍රමවලින් විනාශයට පත්වීම මෙමගින් සිදුවේ. සූදුවට ඇබ්බැහි වූ, යොමු වූ පුද්ගලයන්ට එය ඉතා රසවත්ය. ඇතැම් විට තම කුසට ආහාර, වස්ත්‍රද නොමැතිව හිසට වහළක් නොවුවද සූදුවට මුදල් වියදම් කිරීමට හැකිය. තමා එදිනෙද උපයනු ලබන මුදල් නිසි ආහාරයක් නොමැතිව පවා සිය සූදුව වෙනුවෙන් යොදවති. උදේ කාලයේ රැකියාවට යන පුද්ගලයා දිනය අවසානයේ උපයන ලද මුදල සූදුවට වැයකොට රාත්‍රියේ නිවසට පැමිණේ. සූදුව සඳහා තමාගේ කැමැත්ත කොපමණද කිවහොත් ඒ සඳහා ධනය වැය කිරීමට නොමැති විට ඒ සඳහා අදත්තාදානය හෙවත් සොරකම මගින් ධනය ලබාගෙන වැය කරයි. පාරම්පරික ධනවතුන් සිය ධනය, පරම්පරාගත ඉඩකඩම්, වස්තුව, දේපළ සියල්ල විනාශ කරගනිමින් සූදු කෙළියේ යෙදෙන ආකාරය අද දක්නට ලැබේ. අද පමණක් නොව බුද්ධ කාලයේද විශාල ධනයකට හිමිකම් කී අසූ කෝටියක් ධනය එක් සිටුවරයෙක් සුරාව හා සූදුවට ඇබ්බැහි වී සිය ධනය විනාශ කොට අවසානයේ මහමග සිඟමින් යන අතර දෙව්රම් වෙහෙරට පැමිණි පුවත්තියක් බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ.

සූදු කෙළිය තුළින් සිදුවන සිව්වන දෝෂය වන්නේ ඔවුන්ගේ වචන ජන සමාජය තුළ නොපිළිගැනීමයි. එසේ නැත්නම් අවිශ්වාසය ගොඩනැඟීමයි. සමාජය තුළ අවංකවම සහාගරුකා බව සූදු කෙළියේ යෙදෙන අයට නොමැත. එබඳු පුද්ගලයන්ට තමා ලබාදුන් පොරොන්දු කිසිවක් ඉටුකළ නොහැක. කිසිදු වත්තියක් නිසි පරිදි ඉටු කිරීමටද නොහැක. එබඳු පුද්ගලයන්ගේ වස්තුව ආරක්ෂා නොවන අතර අන් අයගේ වස්තුවද පැහැරගෙන ඒවාද විනාශ කරයි. සූදු කෙළියේ ඵල විපාක වන්නේ සොරකම, දඹිරිකම, වංචාව, දූෂණය ආදියද බහුල වීමයි. සූදු කෙළියේ යෙදෙන අය ඉතා ආකාරයේ වැරදි ක්‍රියා ගණනාවක් කරන හෙයින් ඔවුන්ගේ වචනය කිසිවෙකුත් නොපිළිගනී. සූදුකාරයා යන අන්වර්ථ නාමයක් සමඟ ඔහු අවඥාවට ලක්වේ. ඔහුගේ දූ දරුවන් සූදුකාරයාගේ දරුවන් යනුවෙන් සමාජයේ දෝෂ දර්ශනයට ලක්වේ.

මිත්‍රාමාත්‍යාදීන්ගේ දෝෂ දර්ශනයට ලක්වීම පස්වැනි දෝෂයයි. තමන්ට කිසිදු මිතුරකු ඇසුරු කළ නොහැක. සියලු දෙනා තමා මිතුරන් කරගැනීමට ඉදිරිපත් නොවේ. එබඳු පුද්ගලයන්ට මිතුරන් වන්නේ එබඳු අපරාධවල යෙදෙන අය පමණි. එයට හේතුව යහපත් අයට ඔහු නොගැළපෙන නිසාත්, යහපත් අයගේ වචනය ගරු නොකරන නිසාත්ය. මේ හේතුව නිසා මිතුදම් රැකීමට සූදු කෙළියේ යෙදෙන අයට නොහැක. සූදුවේදී ජය ලැබූ පසු අප්‍රමාණ මිතුරන් තමාට ලැබෙන අතර පරාජය වූ විට කිසිදු මිතුරකු නොමැත. ඒ සියලු දෙනා තමාව අතහැර යනු ඇත. සමාජය තුළ අසත්පුරුෂයන් සූදු කෙළියට අනුබල ලබාදෙන අතර ඒවාට රුකුල් දෙයි.

සූදු කෙළියේ හයවැනි දෝෂය වන්නේ ආවාහ විවාහවලදී ප්‍රතික්ෂේප වීමයි. යම්කිසි සූදු කෙළියක යෙදෙන පුද්ගලයකුට කිසිදු පවුලකින් තුළ කාන්තාවක් ආවාහ විවාහ යෝජනා ඉදිරිපත් නොකරනු ලබයි. මන්ද එය තම තමන්ගේ ජීවිතය විනාශ කර ගැනීමක් බව වටහා ගැනීමයි. අවංක විවාහය යනු උසස් කුල සිරිත් අනුව සිදුකරන චාරිත්‍රයකි. බොහෝ සමාජ තුළ සිරිතකදී පෞද්ගලික චරිතයද ඉතා වැඩි අවධානයට ලක්වන්නකි. බේබද්දකම, සූදුකාරයකු වීම, දූෂකයකු, දඹිරිකයකු වීම එම සමාජය තුළ සිරිත් ප්‍රතික්ෂේප වීමට බලපායි. එසේම සූදුවට ඇබ්බැහි වූවකු තම පවුල් ජීවිතය සාර්ථක කරගැනීමට හැකියාව නොමැත. තම අඹු දරුවන්ගේ ආරක්ෂාව, දියුණුව නිසි ලෙසකින්වත් බලාපොරොත්තු විය නොහැක.



මේ අයුරින් ධනය හා ආධ්‍යාත්මය විනාශ වන දෝෂ අතරින් සූදු කෙළියේ දෝෂයන් ඉහතින් දක්වන ලදී. මේ කරුණු අනුව සූදු කෙළිය සමාජය තුළ මොනතරම් පිළිලයක් බඳු වූවක්ද යන්න ඉතා පැහැදිලිය. සූදු කෙළිය තුළින් තමන්ද විනාශ වී, තම අඹු දරුවන්ද විනාශ කොට තමාගේ වස්තුව, දේපළ, ධනය ආදී සියල්ල විනාශ කොට අවසානයේ ජීවිතයද විනාශයට පත්වන බව මේ කරුණු අනුව පැහැදිලි වේ. සමාජයට පිළිලයක් බඳු මෙම සූදු කෙළිය මුළුමනින් සමාජය තුළින් ඉවත් කිරීම ඉතාම කාලෝචිත පියවරකි. සමාජය විනාශයට, පරිහානියට පත්වන මෙබඳු අශීලාචාර, අගතිගාමී ක්‍රියාවන්ට නීතිය තුළ උපරිම දඬුවම් ලබාදීමද, උපරිම අයුරින් වැටකඩොලු දමා ඒවා සමාජයේ හිස එසවීමට අවස්ථාව ලබා නොදීමටද වගකිවයුතු සමාජයක් ලෙස බෞද්ධ සමාජය ක්‍රියා කළ යුතු බව අවධාරණය කළ යුතුය.


**පූජ්‍ය දිනුලන්දවත්තේ විමල හිමි**

'යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.'

# අස්ගිරි අභිනව මහනාහිමි මංගල දෙසුම උපෝසථාගාරයේදී

## තමන් වෙත පැවරුණු උත්තරීතර මහනායක පදවියේ වගකීම නොපිරිහෙලා ඉටු කරන බව උන්වහන්සේ පවසති





ශ්‍රී සම්බුද්ධ ශාසනයේත්, මහා සංඝරත්නයේත් අනාගත චිරස්ථිතිය වෙනුවෙන් ශාසනික මෙහෙවර ඉටු කිරීමට කාරක මහා සංඝ සභාවේත්, ගිහි පැවිදි ගරුතර මහා සංඝරත්නයේත් පූර්ණ සහයෝගය අවශ්‍ය වන බවත්, තමන් වහන්සේ වෙත පැවරුණු උත්තරීතර මහානායක පදවියේ වගකීම් ඒ අයුරින්ම ඉටුකිරීම තමාගේ පූර්වාශාව වන බවත් අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ 21 වෙනි මහානායක පදවියට විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ ඒකමතික තීරණයෙන් පත්වූ ඓතිහාසික මහියංගන රජමහා විහාරාධිපති ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථදස්සාභිධාන ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ අභිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රකාශ කළහ.

අස්ගිරිය මහා විහාරීය විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ ප්‍රධානත්වයෙන් අස්ගිරි මහා විහාර ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී සංඝ සභාවේ ඒකමතික තීරණයෙන් ගෞරවාර්හ ගලගම අත්ථදස්සී අනුනායක නාහිමිපාණෝ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ 21 වැනි මහානායක හිමිපාණන් වශයෙන් පත්කර ගැනීමෙන් පසුව උපෝසථාගාර බුදුරුව වෙත මල් පූජා කිරීමෙන් ත්‍රිවිධ රත්නයේ ආසිරි ලබා උපෝසථාගාර සංඝ සභාවේ හිමිම් අසුන වෙත වැඩම වීමෙන් පසු මෙසේ සිය ප්‍රථම අනුශාසනාව පැවැත්වූ අස්ගිරි හිමිභියෝ සම්බුද්ධ ශාසනයටත්, මහා සංඝයා වහන්සේලා ප්‍රධාන ශාසනික වස්තූන් ලෙස සලකනු ලබන වෙහෙර, විහාර, පන්සල්වල දියුණුව වෙනුවෙන් විශාල සේවාවක් කිරීමට ඇති බැවින් මෙම කටයුතු තමන්ට තනිවම ඉටු කිරීමට නොහැකි නිසා මහා සංඝයා වහන්සේලාගේ සහයෝගය අවශ්‍ය වන බවත්, අපවත් වී වදාළ උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත හිමිපාණන් වෙතින් දෙස් විදෙස් ශාසනික සේවාවන් ජාත්‍යන්තර මට්ටමින් ඉටුවූ බවද මෙහිදී සිහිපත් කරන බව වැඩිදුරටත් සඳහන් කළහ.

අභිනව හිමිපාණන් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත අස්ගිරි මහා සංඝ සභා ප්‍රධාන ලේඛකාධිකාරී, දර්ශනපති ආනමඩුවේ ධම්මදස්සී හිමි සංඝ සභාවට ඉදිරිපත් කළ අතර අස්ගිරි මහා විහාර ඉතිහාසය සම්බන්ධව විස්තරයක්ද ඉදිරිපත් කළේය.

අභිනව අස්ගිරි හිමිපාණන් ආසිරි පතා ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතා ප්‍රධාන මහනුවර සිව් දේවාල බස්නායක නිලමේවරුන්ද, හිටපු දියවඩන නිලමේ නෙරංජන් විජයරත්න මහතාද, අට පිරිකර පූජා කරනු ලැබූහ. මෙම අවස්ථාවට ශ්‍රී පාදස්ථානාධිපති, සබරගමුව පළාතේ ප්‍රධාන සංඝනායක, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති බෙංගමුවේ ශ්‍රී ධම්මදින්න නාහිමි ඇතුළු ගිහි පැවිදි විශාල පිරිසක් හිමිපාණන්ට ආසිරි පැතීමට උපෝසථාගාරයට පැමිණ සිටි අතර හිමිපාණන් ශ්‍රී දළදා මාලිගාවට වැඩම කර ශ්‍රී දළදා සමිඳු වැඳ පුදාගෙන දළදා ආසිරි ලබාගත්හ.



මහනුවර අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ 21 වෙනි අති ගෞරවාර්හ මහානායක පදවියට පත්වූ මහියංගන රජමහා විහාරාධිපති ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථදස්සී හිමිපාණන්ට ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතා අටපිරිකර පූජා කර ආසිරි ප්‍රාර්ථනා කිරීමට පැමිණි අවස්ථාව.

**කේ. බණ්ඩාරනායක**

"[illegible]"

# ගුණ නුවණින් පිරිපුන් අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ
# අභිනව මහානායක මාහිමිපාණන් වහන්සේ

දේවානම්පියතිස්ස රජු දවස අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයට වැඩමවා, අවිච්ඡින්නව ඇතුළ සිරිත පැවිදි කරවා, ලක්දිව මහාවිහාරවංශික පෙරටුව භික්ෂු සම්ප්‍රදාය ස්ථාපනය කිරීමෙන් අනතුරුව, මෙරට ශාසනික, ජාතික, ආගමික, සාමාජික, සංස්කෘතික හා භාෂා සාහිත්‍යාදී අභිවර්ධනය උදෙසා සිදුවූ මෙහෙය අනුපමේය වේ. එතැන් පටන් අද දක්වා සසුන බර බැඳිලවූ මහතෙරුන් වහන්සේලාගෙන් ලක්දිව හිස් නොවීය. අතිදුරාට ශාසනික සේවාවන් ඉටු කළ මහාවිහාරවංශික පෙරටුවේ භික්ෂු පරපුර කාලයාගේ ඇවෑමෙන් සතුරු උපද්‍රවයන් නිසා නැතිවීම අනතුරුවට පැමිණිය. සතුරු උපද්‍රවයන් නිසා අනුරපුර රාජධානිය පිහිටි සීමාවන් පොළොන්නරු රජධානියට වැටීම කළ මොහොත් භික්ෂූන් වහන්සේ දිඹුලාගල ආරණ්‍ය සේනාසනයෙහි විද්‍යුත් වඩමින් වැඩවිසූහ. එකී වැඩසිටි දිඹුලාගල මහාකාශ්‍යප මාහිමියන්ගේ ශාසන පරම්පරාවෙන් අවිච්ඡින්නව පැවත ආ භික්ෂු පරපුරේ ආරණ්‍යවාසී කොටසක් පසු කලෙක යාපහු නුවර ආසන්නයෙහි වලස්ගල අභයගිරි නම් පර්වතයෙහි වැඩවිසූහ. ඇතුගල්පුර සිසු සිවුවන පණ්ඩිත පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1302-1326) රජ දවස රාජ්‍ය වර්ෂ 1312 වැන්නේ දී කොතැඩගල මූර්තිට්ඨානයෙහි කරවූ අස්ගිරි මහවෙහෙර එම පරපුරේ වනරතන මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ මහසඟනට පූජා කළ බව ප්‍රකටය.

පාතුමිසින්ගේ කුඨ්රාක්‍රම නිසාත්, පළමුවන රාජසිංහ රජුගේ ශාසනික විලෝපනය නිසාත් ලක්දිවින් අතුරුදන්ව ගිය උපසම්පදාව, රාජ්‍ය වර්ෂ 1753 කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස සියමෝපසම්පදාව පිහිටුවාලීමෙන් අනතුරුව, අස්ගිරි - මල්වතු උභයමහාවිහාරයන්ට පත්කරනු ලැබූ මහ පදවි දෙකෙන් එක් පදවියක් වූ අස්ගිරි මහ පදවියට ප්‍රථමයෙන් පත්කොට වදාළේ, අතිගෞරවාර්හ උරුලෑවත්තේ සිරිධම්මසිද්ධි මහානායක මාහිමිපාණන් වහන්සේ (1753-1778) වෙතය. උන්වහන්සේගේ සඟ පරපුරෙන් පැවත එන අභිනව මහානාහිමි අතිපූජ්‍ය ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථදස්සාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ විශාලත්වයෙන් මිදුණු පුන්සඳක් සෙයින් ලක්දිව සහ සසුන එළිය කරමින් පහළ වූ වංශත, නිහාඬ, ධර්මානුධර්ම පටිපදාවෙන් යුක්ත, කාය වාග් මනෝ සංවරයෙන් හා ශීල ගුණයෙන් පිරිපුන් මහා සංඝපිතාවරයාණන් වහන්සේ නමකි. උන්වහන්සේ සතු චාම්, සරල, නිහතමානී, පුත්පාල පිණ්ඩපාතී හා පාරිවාසික භික්ෂු ජීවිතය ගිහි පැවිදි සැවොම ආදර්ශයට ගත හැකි උදාර චරිතයකින් උපලක්ෂිතය.

අනුනායක ධුරය දරමින් සිටි අප මහානාහිමිපාණන් වහන්සේ රාජ්‍ය වර්ෂ 2015 වැන්නේ මැයි මස අටවන දින රැස්වූ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ විශේෂවර්ගික කාරක සභා සංඝ සභාවේ ඒකච්ඡන්දයෙන් විශිෂ්ටවූ මහානායක පදවියට තෝරා පත්කර ගැනීම එකාශී පුජ්‍යකාව පුදසු තැන හිමිකර දීමේ මහා මෙහෙයට සම්පූජාය යමින් සතුටුව කිරීමේ බලය, වයෝවෘද්ධ, ශීලවෘද්ධ, ගුණවෘද්ධ අප නව මහානාහිමිපාණන් වහන්සේ ලෝක ශාසනික චිර පැවැත්ම සාධනය කෙරෙමින්, සංඝශෝභන ගුණයෙන්ගෙන් හෙබිනාව, ගිහිපැවිදි දෙපක්ෂයේ මාර්ගෝපදේශනය හා සුබ සාධනය පිණිස, රටේ, සසුනේ හා සමාජයේ යහපත පිණිස අනාගත ලෝකයාපාසික මෙහෙයක් ඉටු කළ හැකි මහානාහිමිපාණන් වහන්සේ නමක් වශයෙන් සඟ සසුන බිහිවලවූ නියතය.

## උපත

මෙතිහාසික මාතලේ ජනපදයේ අස්ගිරි පල්ලේපියන්ගලුවේ ගලගම නම් වූ නායකාබිරාමණීය ග්‍රාමයෙහි ක්‍රි.ව. 1922 දී කුලතුංග මුදියන්සේලාගේ බිංගිරි බණ්ඩා නීලමේතුමා හා තෙන්නකෝන් මුදියන්සේලාගේ පිංචිමැණිකා කුමාරිහාමි යන පිල්වත් යුගලයන් දම්සෙත්ට දාව උපත ලැබූහ. නමින් කිරිබණ්ඩාර නම් වූ මෙම පින්වත් කුලකුමරුවා යටවත්ත චිර පරාක්‍රම මහාවිද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා දෙසසකර වන විට දක්වා මාපිය සෙනෙහසේ සුව පැලය පිළිබඳින් හැදුණේය, වැඩුණේය.



## පැවිද්ද

අනතුරුව ක්‍රි.ව. 1936 දී ගමේ පන්සල වූ උරුලෑවත්තේ පුරාණ විහාරයෙහි එවකට විහාරාධිපතිව වැඩවිසූ, සිල්වත් ගුණවත් අතිපූජ්‍ය උඩුවාවල ශ්‍රී ධම්මානන්දාභිධාන නාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් උතුම් පැවිදි බිමට පත්වූහ. ගලගම අත්ථදස්සි සාමණේරයන් වහන්සේ නමින් පැවිදි බව ලැබූ සඟපාපුර අභිසම්භාවනීය සඟ පරපුරකි. අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ ප්‍රථම මහානායක අතිගෞරවාර්හ උරුලෑවත්තේ ශ්‍රී සිද්ධත්ථ ධම්මදස්සී මහානායක හිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පැවත එන එම සඟ පරපුර, සමී වන විට මහානායක පදවි නමයකින් ද, අනුනායක පදවි නමයකින් ද සමන්විත වීම මහත් වූ විරල සිදුවීමක් වන්නේය.

අතිගෞරවාර්හ ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථදස්සාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ ක්‍රි.ව. 1937-1947 දක්වා මාතලේ ධර්මරාජ මහපිරිවෙනින් පැවිදි සික්ඛාකාම හා පාලි, සංස්කෘත, සෙළුම ආදී භාෂා ශාස්ත්‍ර ඥානයන් උගත්හ. ප්‍රාචීන, ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන පරීක්ෂණ සියල්ලම උසස් ලෙස සමත් වූහ. විද්‍යෝදය පිරිවෙනින් ත්‍රිපිටක ධර්ම පරීක්ෂණය ඉහළින් සමත්ව, සද්ධර්මාචාර්ය උපාධිය ලබා මජ්ඣිමභාණක උපාධිය ද දිනාගත්හ.

## උපසම්පදාව

ගිහි ශික්ෂාකාම උගෙන පිහිටයක් සපිරූ කල, ගරු ගලගම අත්ථදස්සී සාමණේරයන් වහන්සේ 1942 මැයි මස පෙසක් දින අස්ගිරි මංගල උපෝසථාගාරයේ දී ගරුතර උඩුවාවල ශ්‍රී ධම්මානන්ද මාහිමිපාණන් වහන්සේ ආචාර්ය කොට අස්ගිරි මහාවිහාරයේ වැඩ සිටි අතිගෞරවාර්හ මුල්ලේගම ශ්‍රී ගුණරතනාභිධාන මහානායක මාහිමිපාණන්වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා ගරුතර උරුලෑවත්තේ ගුණරතන හා ගරුතර ගම්මුල්ලේ චන්ද්‍රජෝති හිමිවරුන්ගේ කර්මාචාරීත්වයෙන් අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ. පියවරින් පියවරට පිහිට සාසනික පදවි ලැබූ අප මහානාහිමිපාණන් වහන්සේ රාජ්‍ය වර්ෂ 1999 දෙසැම්බර් මස 13 වන දින අතිපූජ්‍ය අනුනායක පදවියට පත්වීමෙන් 2000 මාර්තු 25 වැනි දින මෙතිහාසික මීගහයාගම රජමහා විහාරයේ විහාරාධිපති පදවියට පත් වූහ. ගුණයෙන් ශ්‍රේෂ්ඨ අප මහා මහානාහිමි අභිනව මහානාහිමි පදවිය ලැබූ අප මහානාහිමිපාණන් වහන්සේට අනුරාගෝත්‍ර සම්පන්නිය ශෝභාව පැමිණේවායි, ප්‍රාර්ථනා කරමු.

**කේ. හිගහකුඹුර**

10

# චූලහත්ථිපදෝපම සූත්‍ර දේශනාවෙන් හෙළිවන

## තෙරුවන් ගුණ දැන නිවන් මගට පිවිසෙන ආකාරය

ධර්ම දේශනය

"එවමෙව ඛො, බ්‍රාහ්මණ ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති"


වාසනාවන්ත පින්වතුනි,

අද ශ්‍රී ලාංකිකයන් වශයෙන් අප සියලු දෙනාටම ඉතාම වැදගත් පොහොය දිනයයි. අපට නිවැරදි ආගම - දහම, සංස්කෘතිය, සභ්‍යත්වය මෙන්ම ශිෂ්ටත්වය ඇති කළ භාරතයේ පහළ වූ ප්‍රතාපවත් අධිරාජයා වූ ධර්මාශෝක නිරිඳුන්ගේ අභිජාත පුත්‍ර මිහිඳු මහරහතන්වහන්සේගේ ලංකාගමනය සිදුවිමයි. උන්වහන්සේ එදා මිස්සක පව්වේ දී පෙළ නිරිඳුන් වූ තිස්ස රජතුමා ඇතුළු පිරිස අමතා දේශනා කළ 'චූලහත්ථිපදෝපම සූත්‍රය' අද දින විස්තර කිරීමට බලාපොරොත්තු වන්නේ උන්වහන්සේට කරන උත්තරීතර ගෞරවයක් වශයෙනි.

චූලහත්ථිපදෝපම සූත්‍රය, බුදුරජාණන්වහන්සේ දේශනා කරනු ලබන්නේ ජානුස්සෝණි බ්‍රාහ්මණයාටය. ඒ පිළෝතික පරිබ්‍රාජකයා හා ජානුස්සෝණි බ්‍රාහ්මණයා අතර වූ සංවාදයක් අරමුණු කොටගෙනය. මිහිඳු හිමියන් ලක්දිවට වැඩමකොට තිස්ස රජු ප්‍රධාන හතළිස්දහසක් පමණ වූ මෙරට වැසියාට ප්‍රථමයෙන් දේශනා කළ දම් දෙසුම වන්නේ ද 'චූලහත්ථිපදෝපම සූත්‍රය'යි. සම්බුදුරජාණන්වහන්සේ නමක් ලොව පහළ වීමේ සිට සම්බුදු සසුන ක්‍රමිකව ගොඩනැගෙන ක්‍රමවේදය මෙහි විස්තර වෙයි.

### ජානුස්සෝණි බ්‍රාහ්මණයා හා පිළෝතික හමුව

මෙම දම් දෙසුමේ ඇතුළත් වන්නේ බුදුරදුන් හා ජානුස්සෝණි නම් බ්‍රාහ්මණයා අතර ඇති වූ ධර්ම සාකච්ඡාවකි. ජානුස්සෝණි බ්‍රාහ්මණයා බුදුරදුන් හමුවීමට පැමිණෙන්නේ පිළෝතික පරිබ්‍රාජකයා කළ බුදුගුණ වර්ණනාව ඇසීමෙන්ය. ඔහු බුදුරදුන්ගෙන් ධර්මය අසා පැහැදුණු අයුරු ඇතෙකුගේ පා සටහන්වල උපමානුසාරයෙන් ජානුස්සෝණි බ්‍රාහ්මණයාට පහදා දෙයි. එයින් සතුටට පත්වන ජානුස්සෝණි බ්‍රාහ්මණයා පිළෝතිකට ස්තූති කොට තමා හොඹෙහි දිනතිනින් බුදුරදුන් හමුවට යන බව පවසා පිටව යයි.



දේශනාගෝ - මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහානිකායේ
...
අතිපූජ්‍ය වෙඩරුවේ ශ්‍රී උපාලි,
ශ්‍රී දළදා මාළිගාවේ ශාස්ත්‍රාත නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

### පිළෝතික බුදුරදුන් කෙරෙහි පැහැදුණු අයුරු

පිළෝතික පරිබ්‍රාජකයා බුදුරදුන් කෙරෙහි පැහැදුණු අයුරු ජානුස්සෝණි බ්‍රාහ්මණයාට පහදා දෙන්නේ මෙසේය. "ඇතුන් වසන වනයෙහි වාසය කරන දක්ෂ පුරුෂයෙක් මහ ඇතා සොයමින් ඇතුන් වසන වනයකට ඇතුළුව ඒ වනයෙහි දිගින් හා පළලින් මහත් වූ ඇත් පා සටහන් දැක එවා මහ ඇතාගේ පා සටහන් ලෙස නිශ්චයට පැමිණෙන්නේ ද, එමෙන්ම මා බුදුරදුන්ගේ සිවුවැදෑරුම් ඥාණ පදයන් දැක 'බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක මහසඟන මනා පිළිවෙතින් යුක්තය' යන නිශ්චයට පැමිණියෙමි" යනුවෙනි.


### සිවුවැදෑරුම් ඥාණපදයන් පළමු ඥාණපදය

මේ ලෝකයෙහි යම් කෙනෙක් තම ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳිත් ද, වාලවේධී දුනුවායන් මෙන් (අඳුරෙහි අශ්ව ලෝමය දෙපළු කොට විදීමට හැකියාව ඇති දුනුවායන් මෙන්) එබඳු වූ තියුණු බුද්ධියෙන් යුක්ත වූ ක්ෂත්‍රිය පණ්ඩිතයෙක් බුදුරජාණන්වහන්සේ වෙත පැමිණ වාදාරෝපණය කොට පරාජය කිරීමට සිතන්නේය. එබඳු වූ ඔහු බුදුරජාණන්වහන්සේ යම් තැනක වාසය කරත් ද, එතනට පැමිණ බුදුරදුන් බැහැදකියි. බුදුරජාණන්වහන්සේ ඔහුට දැහැමි කථාවෙන් සමාදන් කරවයි. තියුණු කරවයි. සතුටු කරවයි. මෙසේ වූ ඔහු බුදුරජාණන්වහන්සේට වාදාරෝපණය නොකරන්නේමය. වාදකරුණු අමතකව යන්නේය. උන්වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වන්නේය. මෙය පළමු වන ඥාණපදයයි. මෙය දැකීමෙන් මා 'බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක මහසඟන මනාපිළිවෙතින් යුක්තය' යන නිශ්චයට පැමිණියෙමි.

### දෙවන ඥාණපදය

මේ ලෝකයෙහි යම් කෙනෙක් තම ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳිත් ද, වාලවේධී දුනුවායන් මෙන් (අඳුරෙහි අශ්ව ලෝමය දෙපළු කොට විදීමට හැකියාව ඇති දුනුවායන් මෙන්) එබඳු වූ තියුණු බුද්ධියෙන් යුක්ත වූ බ්‍රාහ්මණ පණ්ඩිතයෙක් බුදුරජාණන්වහන්සේ වෙත පැමිණ වාදාරෝපණය කොට පරාජය කිරීමට සිතන්නේය. එබඳු වූ ඔහු බුදුරජාණන්වහන්සේ යම් තැනක වාසය කරත් ද, එතනට පැමිණ බුදුරදුන් බැහැදකියි. බුදුරජාණන්වහන්සේ ඔහුට දැහැමි කථාවෙන් සමාදන් කරවයි. තියුණු කරවයි. සතුටු කරවයි. මෙසේ වූ ඔහු බුදුරජාණන්වහන්සේට වාදාරෝපණය නොකරන්නේමය. වාදකරුණු අමතකව යන්නේය. උන්වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වන්නේය. මෙය දෙවන ඥාණපදයයි. මෙය දැකීමෙන් මා 'බුදුරජාණන්වහන්සේ

"සියල්ලෝ දඬුවමට තැති ගනිති. සියල්ලෝ මරණයට බිය වෙති. ඒ නිසා තමා උපමා කොට ගෙන අනුන් නොනසන්නේය. නොනස්වන්නේය."



සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක මහසඟන මනාපිළිවෙතින් යුක්තය' යන නිෂ්ටාවට පැමිණියෙමි.

**තුන්වන ඥානපදය**

මේ ලෝකයෙහි යම් කෙනෙක් තම ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳින් ද, වාලවේධී දුනුවායන් මෙන් (අඳුරෙහි අශ්ව ලෝමය දෙපළු කොට විදිමට හැකියාව ඇති දුනුවායන් මෙන්) එබඳු වූ තීක්ෂණ බුද්ධියෙන් යුක්ත වූ ශ්‍රමණ පණ්ඩිතයෙක් බුදුරජාණන්වහන්සේ වෙත පැමිණ වාදාරෝපණය කොට පරාජය කිරීමට සිතන්නේය. එබඳු වූ ඔහු බුදුරජාණන්වහන්සේ යම් තැනක වාඩවාසය කරත් ද, එතනට පැමිණ බුදුරදුන් බැහැදකියි. බුදුරජාණන්වහන්සේ ඔහුව දැහැමි කථාවෙන් සමාදන් කරවයි. තියුණු කරවයි. සතුටු කරවයි. මෙසේ වූ ඔහු බුදුරජාණන්වහන්සේට වාදාරෝපණය නොකරන්නේමය. වාදකරුණු අමතකව යන්නේය. උන්වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වන්නේය. මෙය තුන්වන ඥානපදයයි. මෙය දැකීමෙන් මා 'බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක මහසඟන මනාපිළිවෙතින් යුක්තය' යන නිෂ්ටාවට පැමිණියෙමි.

**සිවුවන ඥානපදය**

මේ ලෝකයෙහි යම් කෙනෙක් තම ප්‍රඥාවෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳින් ද, වාලවේධී දුනුවායන් මෙන් (අඳුරෙහි අශ්ව ලෝමය දෙපළු කොට විදිමට හැකියාව ඇති දුනුවායන් මෙන්) එබඳු වූ තීක්ෂණ බුද්ධියෙන් යුක්ත වූ ශ්‍රමණ පණ්ඩිතයෙක් බුදුරජාණන්වහන්සේ වෙත පැමිණ වාදාරෝපණය කොට පරාජය කිරීමට සිතන්නේය. එබඳු වූ ඔහු බුදුරජාණන්වහන්සේ යම් තැනක වාඩවාසය කරත් ද, එතනට පැමිණ බුදුරදුන් බැහැදකියි. බුදුරජාණන්වහන්සේ ඔහුව දැහැමි කථාවෙන් සමාදන් කරවයි. තියුණු කරවයි. සතුටු කරවයි. මෙසේ වූ ඔහු බුදුරජාණන්වහන්සේට වාදාරෝපණය නොකරන්නේමය. වාදකරුණු අමතකව යන්නේය. උන්වහන්සේගේ ශ්‍රාවකයෙක් බවට පත්වන්නේය. මෙය සිවුවන ඥානපදයයි. මෙය දැකීමෙන් මා 'බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක මහසඟන මනාපිළිවෙතින් යුක්තය' යන නිෂ්ටාවට පැමිණියෙමි.

**ජානුස්සෝණි බ්‍රාහ්මණයා බුදුරදුන් හමුවෙයි**

මෙය ඇසූ ජානුස්සෝණි බ්‍රාහ්මණයා සුදු අශ්වයින් යොදා මනාව සරසන ලද අශ්වරථයෙන් බැස බුදුරදුන් සිටින දිසාවට නමස්කාර කොට ළඟදීම දිනක බුදුරදුන් හමුවට යන බව පැවසීය. නොබෝ දිනකින් බුදුරදුන් හමු වූ ජානුස්සෝණි බ්‍රාහ්මණයාට තිසරණ සරණ යෑමේ පටන් නිර්වාණාවබෝධය දක්වා වූ නිර්වාණගාමී මාර්ගය පැහැදිලි කර දුන්හ. තෙරුවන් සරණ යෑමේ පටන් නිර්වාණාවබෝධය දක්වා වූ නිර්වාණගාමී මාර්ගයම ඉතා පැහැදිලිව මෙන්ම සරලව මෙහි දේශිතය. මෙය ඇසීමෙන් තෙරුවන් හා බුද්ධ ධර්මය පිළිබඳ නොදත් අයෙකුට ඒ පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගත හැක. මිහිඳු හිමියන් ද තිස්ස රජු ඇතුළු පිරිසට ප්‍රථම ධර්මදේශනය සඳහා මෙම දම්දෙසුම තෝරා ගත්තේ මේ නිසාය. ඒ අනුව එහි ඇතුළත් සම්බුදු කෙනෙකුගේ පහළවීමේ සිට එය අනුගමනය කරන පුද්ගලයා නිර්වාණගාමී මාර්ගයේ ගමන් කරන අයුරු විමසා බලමු.

**සම්බුදු කෙනෙකුගේ පහළවීම, දහම් ඇසීම හා ගිහිගෙයින් නික්මීම**

බොහෝ කලකින් තථාගතයන් බුද්ධ ගුණයෙන් සමන්විත වූ තමන්ගේම නුවණින් දෙවියන්, මරුන්, බඹුන්, ශ්‍රමණයින් සහිත වූ මේ ලෝකය පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති සම්මාසම්බුදුරජාණන්වහන්සේ කෙනෙක් පහළ වෙති. උන්වහන්සේ මුල, මැද, අග පිරිසිදු වූ අර්ථ හා අක්ෂර වලින් හාත්පසින්ම පිරුණු, පිරිසිදු වූ ධර්මය දේශනා කරති. බ්‍රහ්මචරියාව ද (ගිහිගෙයින් නික්මීමේ ඇති අනුසස්) ප්‍රකාශ කරති. මේ ධර්මය අසන නුවණැති කුලපුත්‍රයා බුදුරදුන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරගනියි. ශ්‍රද්ධාවත් වූ ඔහු එම ධර්මය අසා ගිහිගෙය බාධක සහිත බවත්, පැවිද්ද නිදහස් බවත්, බඹසර විසීම ඉතා වටිනා බවත් අවබෝධ කොටගෙන සියලු භවභෝග සම්පත් හා ඥාති පිරිවර හැරදමා හිස රැවුල් බා කසාවත් හැඳපොරවා උතුම් පැවිද්ද ලබා සුදකලාව වාසය කරයි.

**සීලයෙහි පිහිටීම**

මෙසේ වාසය කරන ඔහු ප්‍රාණඝාතයෙන් වෙන්වෙයි. අදත්තාදානයෙන් වෙන් වෙයි. බ්‍රහ්මචාරී වෙයි. මුසා බස්, පිසුණු බස් (කේලම්) අන්සුන් (හිස්වචන) බස් හා පරුෂ බස් නොකියයි. බොහෝ ජනයාගේ හිතසුව පිණිස වන වචන කථා කරයි. අර්ථවත් දෙයක්ම කියයි. ධර්මයම කියයි. ඇත්ත ඇති සැටියෙන්ම කියයි. නිසිදේ නිසි කලට කියයි. පැළවන දේ හා පැළවුණු දේ නැසීමෙන් වළකී. අවේලාවේ වැළඳීමෙන් වළකී. නැටීමෙන් ගැයීමෙන් ආදී නොසුදුසු දෙයින් වළකී. මල් සඳ විලවුන් දැරීමෙන් වළකී. උසසුන් මහසුන් දැරීමෙන් වළකී. රන්, රිදී, මුතු, මැණික් දැරීමෙන්, පිළිගැනීමෙන් වළකී. නොපිසූ ධාන්‍ය හා මස් වර්ග පිළිගැනීමෙන් වළකී. දාසි, දස්, කුමරියන් පිළිගැනීමෙන් වළකී. සතුන් පිළිගැනීමෙන් වළකී. ගිහියන්ගේ පණිවුඩ ගෙනයෑම, ගනුදෙනු කිරීම, අල්ලස් ගැනීම, මං පැහැරීම් ආදී නොසුදුසු නොහොබිනා දෙයින් වළකී.

මෙසේ වූ එම භික්ෂුව කය වසාගැනීම සඳහා සිවුරෙන් ද, කුස පුරවා ගැනීම සඳහා පාත්‍රයෙන් ද සතුටු වන්නේ වෙයි. උන්වහන්සේ යම් තැනක වඩී ද සිවුර හා පාත්‍රය පමණක්ම රැගෙන වඩිති. එය පක්ෂියෙකුට සමානය. පක්ෂියා පියඹා යෑමේ දී ඔහුට ඇත්තේ පියාපත් බර පමණි. එමෙන්ම භික්ෂුවකට ද තිබිය යුත්තේ පාත්‍රය හා සිවුර පමණි. මෙසේ ආර්ය සීලයෙන් සමාදන් වූ භික්ෂුව ආධ්‍යාත්මික වශයෙන් නිරවද්‍ය සැපය විඳී.

**ආර්ය සීලය සමාදන් වීම**

එමෙන්ම මෙසේ ආර්ය සීලයෙන් සමාදන් වූ භික්ෂුව ඇසින් රූප දැක එය නිමිති වශයෙන් නොගනී. එය ක්‍රියා මාත්‍රයක් පමණක් ලෙස දකිති. එහි ඇලීමක් - බැඳීමක් නොදක්වයි. එමෙන්ම කණින් ශබ්ද ඇසීමෙන් ද, දිවෙන් රස දැනීමෙන් ද, නාසයෙන් ආඝ්‍රාණය කිරීමෙන් ද, කයින් ස්පර්ශය ලැබීමෙන් ද, මනසින් ධර්මය දැනීමෙන් ද, (මනසට



නැලෙන විතර්කයන්) එය නිමිති වශයෙන් නොගනී. එය ක්‍රියා මාත්‍රයක් පමණක් ලෙස දකියි. එහි ඇලීමක් - ගැටීමක් නොදක්වයි. මෙසේ වූ එම භික්ෂුව, ආර්ය ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවෙයි.

### ආර්යන් වහන්සේලාගේ වාසස්ථාන

මෙසේ ආර්ය ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූ එම භික්ෂුව, යෑම, ඒම, ඉඳුම, හිටුම, සැතපීම ආදී සියල්ලම සිහිකල්පනාවෙන් සිදුකරයි. අවම වශයෙන් මළ, මූත්‍ර පිටකිරීම ද සිහිකල්පනාවෙන් සිදුකරයි. එමෙන්ම ජනයාගෙන් තොර වනසෙනසුන්, රුක්මුල්, පර්වත, ගුහා, සොහොන, පිදුරුකුටි ආදියෙහි වාසය කරයි. මෙසේ වූ එම භික්ෂුව අරඹන ලද වීර්යයෙන් යුක්ත වූයේ පලක් බැඳ, කය සෘජු කොට සිහිය කර්මස්ථාන කොට සිත සමාධියට යොමු කරයි.

මෙසේ වූ එම භික්ෂුව අභිධ්‍යාවෙන් සිත නිදහස් කරයි. ව්‍යාපාදයෙන් සිත නිදහස් කරයි. සියලු සතුන් කෙරෙහි කුළුණුසිත් වෙයි. ථීනමිද්ධය ප්‍රහීණ කරයි. එමෙන්ම ගතේ හා සිතේ ඇති නොසන්සුන් බව කම්මැලිකම දුරු කරයි. එමෙන්ම කුසල ධර්මයන් පිළිබඳ වූ සැකය දුරු කරයි. මෙසේ පඤ්චනීවරණයන්ගෙන් සිත නිදහස් කරන එම භික්ෂුව ප්‍රථමධ්‍යානය ලබයි.

මෙසේ ප්‍රථමධ්‍යානයේ සිට චතුර්ථධ්‍යානය දක්වා සිත වඩන භික්ෂුව බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක සංඝයා පිළිවෙතින් පරිපූර්ණය යන නිශ්චයට එළඹෙයි. එහෙත් එය නිවැරදි නිශ්චාව හෙවත් අවසානය නොවේ. එයින් නොනවතින ආර්ය ශ්‍රාවකයා ඉන් ඉදිරියට යා යුතුය.

### ත්‍රිවිද්‍යා උපදවා ගැනීම හා නිර්වාණය පසක් කිරීම

මෙසේ ඉදිරියට යන ආර්ය ශ්‍රාවකයා පෙර උපන් ජාති දැනීමේ ඥානය, සත්වයන්ගේ නැතිවීම හා ඉපදීම දැකගත හැකි ඥානය හා සියලු කෙලෙසුන් නැති කිරීමේ ඥානය ලබයි. එයින් නොනැවතුන ආර්ය ශ්‍රාවකයා තවත් ඉදිරියට යා යුතුය. එනම් දුක පිළිබඳ නිවැරදි දැනීම, දුක හට ගැනීම පිළිබඳ නිවැරදි දැනීම, දුක නැති කිරීම පිළිබඳ නිවැරදි දැනීම හා දුක නැතිකිරීමේ මාර්ගය පිළිබඳ නිවැරදි දැනීම ලබයි. එයින් ද ආර්ය ශ්‍රාවකයා බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක සංඝයා පිළිවෙතින් පරිපූර්ණය යන නිශ්චයට නොඑළඹිය යුතුය. එය නිවැරදි නිශ්චාව හෙවත් අවසානය නොවේ. එයින් නොනවතින ආර්ය ශ්‍රාවකයා ඉන් ඉදිරියට යා යුතුය.

ඉන් ඉදිරියට යන ආර්ය ශ්‍රාවකයා කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් කරගනී. භවය පිළිබඳ වූ ආශාවන්ගෙන් සිත නිදහස් කරගනී. අවිද්‍යාවෙන් ද සිත නිදහස් කරගනී. මෙයින් සියල්ලන්ගෙන් මිදීම හෙවත් විමුක්ති ඥානය ඇතිවේ. විමුක්ති ඥානය ලැබූ කල්හි ඉපදීම නැතිවේ. බඹසර වස නිමවන ලදී. කළයුතු සියල්ල කර අවසන්ය. නැවත ඉපදීමක් නැත.

මෙය තථාගතයන් වහන්සේගේ ධර්මය අවබෝධ කිරීමයි. බුදුරජාණන්වහන්සේ සේවනයයි. තථාගතයන්වහන්සේගේ දීප්තිමත් කිරීමයි. මෙයින් ආර්ය ශ්‍රාවකයා, බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක සංඝයා පිළිවෙතින් පරිපූර්ණය යන නිශ්චයට එළඹියේ වෙයි. එය නිවැරදි නිශ්චාව හෙවත් සම්බුදු දහමේ පූර්ණ අවබෝධයට පත්වීමයි.

### ඇත් උපමාවක් හා ධර්මය අවබෝධ කිරීමේ පියවර

චූළහත්ථිපදොපම සූත්‍රයෙහි එන ඇත් උපමාව ආර්ය ශ්‍රාවකයා ධර්මය අවබෝධ කරගන්නා පියවර සමග මෙසේ සංසන්දනය කළ හැක. එනම් දක්ෂ නාගවනිකයා (ඇත් වනයෙහි වසන පුද්ගලයා) මහා ඇත් රජු සෙවීම සඳහා වනයට පිවිස පියසටහන් අනුව ගමන් කරන්නේ 'වාමනිකා' නම් වූ ඇත් කුලයෙහි පාසටහන් දැක එය මනාව විමසාගෙන එය මහඇතාගේ පාසටහන් නොවන බව දැන ඉන් නොනැවතී ඉදිරියට ගමන් කරයි. එය පඤ්චනීවරණ ප්‍රහීණ කර චතුර්ථධ්‍යානයට පත් ආර්ය ශ්‍රාවකයා බුදුරජාණන්වහන්සේ සම්මාසම්බුද්ධය, ධර්මය මනාව දේශිතය, බුදුරදුන්ගේ ශ්‍රාවක සංඝයා පිළිවෙතින් පරිපූර්ණය යන නිශ්චයට නොපැමිණ, ඉන් නොනැවතී ඉදිරියට ගමන් කිරීමට සමානය.

තවත් ඉදිරියට ගමන් කරන දක්ෂ නාගවනිකයා නැවතත් හමුවූ ඇත් පාසටහන් දැක එය 'උච්චා කාළාරිකා' නම් ඇත් කුලයෙහි බව දැන මහඇතා සොයමින් තවත් ඉදිරියට ගමන් කරයි. එය පඤ්චනීවරණ ප්‍රහීණ කරන ආර්ය ශ්‍රාවකයා ඉන් නොනැවතී ත්‍රිවිද්‍යාවන් ලබා ගැනීම දක්වා ගමන් කිරීමට සමානය.

මෙසේ දිගටම ඉදිරියට ගමන් කරන නාගවනිකයාට තවත් ඇත් පිය සටහන් හමුවෙයි. එම පියසටහන ද මහ ඇතාගේ නොව 'උච්චා කණේරුකා' නම් ඇත්කුලයේ බව විමසාගෙන මහඇතා සොයමින් තවත් ඉදිරියට ගමන් කරයි. එය ත්‍රිවිද්‍යාවෙන් ලබාගත් ආර්ය ශ්‍රාවකයා ඉන් නොනැවතී චතුරාර්ය සත්‍ය අවබෝධය සඳහා ගමන් කිරීමට සමානය.

මෙසේ මහඇතා සොයමින් ඉදිරියට ගමන් කරන නාගවනිකයාට මහඇතාගේ පියසටහන් හමුවෙයි. එම මහඇතා සිටි ඉහළ තැන් ද, දළින් පහරදුන් තැන් ද, උස් තැනින් සිඳුණු අතු ද දැක, එය නියම මහඇතාගේ ක්‍රියාවන් ලෙස හඳුනාගෙන මහ ඇත්රජු නිශ්චයට පැමිණෙයි. මෙය ආර්ය ශ්‍රාවකයා කාමාශ්‍රව, අවිද්‍යාශ්‍රව, භවාශ්‍රවයන්ගෙන් සිත මුදා විමුක්ති ඥානය ලැබ, උතුම් අර්හත් පත්වියට පත්වීමට සමානය. මෙයින් ඇත් උපමාව නිමාවට පත්විය.

මෙසේ බුදුරජාණන්වහන්සේ උපමානුසාරයෙන් මෙම දම්දෙසුම නිමකළසේක. එය මනාව අසා සිටි ජානුස්සෝණි බ්‍රාහ්මණයා, එම දම්දෙසුම පිළිබඳ සතුට ප්‍රකාශ කළේ මෙලෙසය.

'ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යම් සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ වේද, වසාතබන ලද්දක් විවෘත කරන්නේ හෝ වේද, මංමුළා වූවෙකුට මඟ කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, මෙපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනා කරන ලද්දේය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන්වහන්සේ සරණ කොට යමි. ධර්මය ද, භික්ෂු සංඝයා ද සරණකොට යමි. අදපටන් දිවි ඇතිතෙක් මා උපාසකයෙක් කොට සලකනු මැනවි" යනුවෙන් පැවසීය.


මිහිඳු මහරහතන්වහන්සේ ද ලංකාවට වැඩමකොට මෙම දම්දෙසුම පළමුව රජු ඇතුළු පිරිසට දේශනා කළහ. එය ශ්‍රවණය කිරීමෙන් තිස්ස රජු ඇතුළු පිරිස බුදුන්, දහම, සඟුන් යන ත්‍රිවිධ රත්නයේ පූර්ණ අවබෝධයකට පැමිණියා පමණක් නොව නිර්වාණගාමී ප්‍රතිපදාවත්, මිහිඳු මහරහතන්වහන්සේ ඇතුළු ආර්ය ශ්‍රාවකයන්වහන්සේලාගේ පිළිවෙතත් මනාව අවබෝධ කොටගෙන උන්වහන්සේලාට සුහද ලෙසින් පිළිපැද ඇත.

ධර්මාවබෝධය සඳහා නිත්‍යමත කැපැත්තා කුසලාකුසල ධර්මයන් හඳුනා ගැනීමෙහි දක්ෂයෙක් විය යුතුය. කුසල යනු දක්ෂතාවයයි. හැකියාවයි. අකුසල යනු අදක්ෂකමට හා නොහැකියාවට නමකි. දක්ෂ ඇතුන් අල්ලන්නෙක් වනයට පිවිස පියවර අනුව ගොස් අතරමං නොවී, මංමුළා නොවී මහඇතා සොයාගන්නාක් මෙන් අප ද හැකියාව තුළින්, දක්ෂතාව තුළින් අදක්ෂකම හා නොහැකියාව දුරත් කොට අතරමං නොවී, මංමුළා නොවී අපගේ අරමුණු කරා එළඹිය යුතුය. අප අතරමං වන්නේ හෝ මංමුළා වන්නේ ස්වභාවයන් පිළිබඳ වැරදි ලෙස පිළිපැදීමෙන් හා සංකල්පනාවන් වැරදි ලෙස ග්‍රහණය කර ගැනීමෙන්ය. ඒ තුළින් අප මහඇතා සොයා වනයට යන අදක්ෂ නාගවනිකයා මෙන් යම් යම් දේ පිළිබඳ රැවටී තම අරමුණු කරා ළඟා නොවී, ළඟා වූයේ යැයි සිතා මියා ලෝකයෙහි අතරමං වී මුළාවට පත්වෙයි. ධර්මය තුළ අප අරමුණෙහි, පරම නිශ්චාව ලෙස අප්‍රමාදව වන්නේ නිර්වාණාවබෝධයයි. ඔබ සැමට සදහම් අවබෝධයට ශ්‍රීමත් දළදා වහන්සේගේ ආශිර්වාදයෙන් ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද, ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

# 'රජතුමනි... ඔබ මේ රටේ භාරකරු මිස අයිතිකරු නොවේ'

- අනුබුදු මිහිඳු හිමි



"රජතුමනි, ඔබ මෙම භූමියේ භාරකරු මිස අයිතිකරු නොවේ" යැයි මිහිඳු මාහිමියන් විසින් දේවානම්පියතිස්ස රජු හට ප්‍රකාශ කරන ලදී.

මින් අදහස් කළේ රටක පාලකයකු විසින් ඔහුගේ හිතුමතයට භූමිය හා එහි සම්පත් ගසාකෑම හා ජීවීන්ද පරිහරණය නොකළ යුතු බව පමණක් නොව භූමියේ භාරකරු වශයෙන් රජතුමා විසින් එයට අයත් සියලු දෑ සංරක්ෂණය කළ යුතු බවය.

පරිසර සංරක්ෂණය පිළිබඳ නවීන සංකල්පය මෙයට බොහෝ දුරට නෑකම් කියන්නකි. එනම් පරිසරය සම්බන්ධයෙන් ඔබගේ ප්‍රධාන වගකීම වන්නේ රජ අන් අය වෙනුවෙන් සංරක්ෂණය කළ යුතුය යන පණිවුඩයයි.

ඒ අනුව අද මිනිස් සමාජයේ පැවැත්මට හා ආරක්ෂාවට බලවත්ම සාධකයක් බවට පත්ව ඇති මෙම "පරිසර සංරක්ෂණය" පිළිබඳ සංකල්පය බොහෝ අය සිතා සිටින පරිදි බටහිර ලෝකයෙහි ඇතිවී ව්‍යාප්ත වූවක් නොව, මෙයට අවුරුදු දෙදහස් පන්සිය ගණනකට ඉහත ලක්දිව අනුරාධපුරයට නුදුරු මිස්සක පව්ව මුදුනෙන් බිහිවූවකි. මිහිඳු මාහිමියන් විසින් ගෙන ආ දහම් පණිවුඩයේ ඇතුළත් ප්‍රධාන කරුණක් වන "අවිහිංසාව" ක්‍ෂුද්‍ර වන සතුන්ට පමණක් නොව ගස කොළටද සාධාරණ වූ බව පෙනෙයි.

මිහින්දාගමනයට පෙර සිටම දේවානම්පියතිස්ස රජු හා අශෝක අධිරාජයා අතර යම් යම් සබඳතා පැවැති බවත්, ඒ අනුව ඔවුන් දෙදෙනා අතර යම් හිතවත්කමක් ගොඩනැගී තිබුණු බවත් පැහැදිලිය. ඒ අනුව මිහිඳු මාහිමියන් හට තම දහම් පණිවුඩය දීම සඳහා දේවානම්පියතිස්ස රජතුමා එතුමාගේ මාලිගයේදී හමුවිය හැකිව තිබුණි. එසේ නොකොට රජතුමා දඩයමේ යෙදී සිටියදී හමුවීමට මිහිඳු මාහිමියන් ඇතුළු පිරිස තීරණය කළේ තමන් දීමට බලාපොරොත්තු වන "අවිහිංසාව" පිළිබඳ පණිවුඩය ලබාදීමට එය වඩාත් සුදුසු හා ප්‍රායෝගික අවස්ථාවක් මෙන්ම පරිසරයක්ද වූ හෙයින් විය හැකිය.

බුදුන් වහන්සේ මෙන්ම පසු කාලයක භික්ෂූන් වහන්සේද වැඩ සිටි පරිසරය විස්තර කිරීමේදී බෞද්ධ සාහිත්‍යකරුවා විසින් මෙවැනි සිත්කලු, රුචිර, දකුම්කළු, රමණීය, හෘදයංගම වැනි වචන යොදා ගැනීම සාමාන්‍ය දෙයක් බවට පත්විය. මින් ගම්‍ය වන්නේ බුදු දහම විසින් සංරක්ෂණය වූ රමණීය පරිසරය මිනිස් සමාජයේ අනිවාර්ය අංගයක් බවට සැලකූ බවය. මිහිඳු මාහිමියන්ගේ ගුරුත්වය ශාස්තෘවරයාණන් වූ ගෞතම බුදුන් වහන්සේගේ ජීවිතය මෙන්ම උන්වහන්සේ දෙසූ දහම්ද ස්වභාව ධර්මයට බෙහෙවින් සමීප වූ බව උන්වහන්සේගේ උපත සල් ගසක් යටද, බුද්ධත්වය ඇසතු ගසක් යටද, පිරිනිවන් පෑම සල් ගස් දෙකක් මැදිකොටද සිදුවීමෙන් පෙනේ. ඒ අනුව බෞද්ධ ශිෂ්ටාචාරය උපත, ස්වභාව සෞන්දර්යයෙන් ඔපවත් වූ ශාන්ත නිසල පරිසරයක සිදුවූ බවට සාක්ෂි එමටය. මිහිඳු හිමියන් තම ජීවිත කාලයෙන් වැඩි කොටසක් ගත කළේ මිහින්තලාව පසුබිම් කොටගෙනය. උන්වහන්සේ පිරිනිවන් පෑවේද එහිමය. ඉන් අනතුරුව උදාවූ කාල පරිච්ඡේදය තුළ රාජ ලෙන කන්ද, කළුදිය පොකුණ වැනි දකුම්කළු ස්වභාවික නිර්මාණයන්ගෙන් යුත් මෙම මිහින්තලා පරිසරය නොයෙකුත් විපර්යාසයන්ට භාජනය විය. ඒ අනුව ජීවත් වෙන සංඝයා වහන්සේගේ සංඛ්‍යාව මෙන්ම උන්වහන්සේ සඳහා ඉදිවූ වෙහෙර විහාර, ස්තූප, බෝධි හා පොහොය ගෙවල් ගත වර්ෂයෙන් ගත වර්ෂයට සංඛ්‍යාවෙන් වැඩි වූව ද එවැන්නක් සිදුවූයේ පරිසරයට කිසියම් හෝ හානියක් සිදු නොවන පරිදිමය. හැකිතාක් අවම වන පරිදිය.

මෙසේ පරිසර සංරක්ෂණය පිළිබඳ මිහිඳු මාහිමියන් විසින් දෙන ලද ප්‍රායෝගික පණිවුඩය ඒ අයුරින්ම ක්‍රියාත්මක වූයේ රටේ පාලකයා විසින් භූමියේ අයිතිකරු වෙනුවට එහි භාරකරු වශයෙන් ක්‍රියා කළ යුතු බවට උන්වහන්සේ විසින් කරන ලද ප්‍රකාශය පසුකාලීන රජවරුන් විසින් ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීම හේතු කොටගෙනය. හතරවැනි මිහිඳු රජු විසින් තම මිහින්තලා සෙල් ලිපියෙහි "ගස කොළ නොකැපිය යුතුය" යනුවෙන් ව්‍යවස්ථාවක් පනවා ඇත්තේ ඒ අනුවය. ඇළ දොළ, ගංගා, කඳුවැටි හා මිටියාවත්වලින් යුත්, හරිත වනාන්තරවලින් යුත් ශාන්ත, නිසංසල පරිසරයක් තුළ බුදුන් වහන්සේගේ පන්සාලිස් වසක ජීවිතයෙන් වැඩි කොටසක් ගෙවී ගියේය. "ආරණ්‍ය සේනාසනය රමණීයයි" යනුවෙන් සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් ථෙර හා ථෙරී ගාථාවල එන උදාන වාක්‍යයන්ගෙන් ප්‍රකාශ වීමෙන් ඔවුන් වැඩීම සඳහා ආරණ්‍ය ජීවිතය අනුදත වදාළ බවද පැහැදිලිය. බුදුන් වහන්සේ විසින් තම ශ්‍රාවකයන් හට සුදුසු වාසස්ථාන අතරින් එකක් ලෙස අනුදත වදාළේ ගලින් නිම වූ ගුහාවය. භික්ෂූන් සඳහා සෙනසුන් ඉදිවූයේද වනාන්තර ගංගා අසබඩ නිම්න හා ගිරි කඳු අසබඩය. මෙම බෞද්ධ සංකල්පය අනුව භාවනානුයෝගී භික්ෂූන්ට කදිම පරිසරයක් මැවූ මිහින්තලා කඳුගැටය මිහිඳු හිමියන්ට සිත් ගන්නට ඇත. මෙසේ වන සතුන්ට පමණක් නොව, ගස කොළටද පොදුවූ අවිහිංසාව පදනම් කොටගත් බෞද්ධ ශිෂ්ටාචාරය රාජකීය අනුග්‍රහයද ඇතිව පසුකලෙක මුළු ලක්දිවටම පැතිර ගියේය.

**මහාචාර්ය සරත් කොටගම**

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."

අද සිට අතීතයේ කාශ්‍යප බුදුරදුන් වැඩ විසූ සමයෙහි යම්කිසි විසූ එක්තරා ගම් ප්‍රධානියෙක් ගමෙහි රමණීය විහාරයක් ඉදිකරවා එක්තරා භික්ෂූන් වහන්සේ නමක් වෙත පූජා කළා. එපමණක් නොව සිව්පසයෙන් උන්වහන්සේට උපස්ථානද කළා. උන්වහන්සේ සෑම දිනකම මෙම දායක මහතාගේ නිවසෙහි දානය වැළඳීමටද පුරුදු වුණා. මෙසේ වෙද්දී එක්තරා රහතන් වහන්සේ නමක් මේ ගමට වැඩ කළා. පිඬුසිඟා වැඩි උන්වහන්සේ මේ දායක මහතාගේ නිවසට වැඩම කළා. උන්වහන්සේගේ සන්සුන් ඉරියව් පිළිබඳව පැහැදුණු දායක මහතා උන්වහන්සේ ප්‍රණීත ආහාරයෙන් වළඳවා පරිස්සාරද පිළිගැන්වූවා.

දායකතුමා මේ රහතන් වහන්සේට වඩිනා සළුවක් පුද සිවුරු සකස් කරගන්නා ලෙසත්, සයනය සඳහා සඳහා යහනක්ද පුද උන්වහන්සේගේ දිග් වූ කෙස් කැපීම සඳහා කරණවෑමියෙක්ද යොත්වා දුන්නා. මේ දෙස බලා සිටි ආරාමික භික්ෂුවට ඊර්ෂ්‍යාවක් ඇතිවී දායක මහතා කෙරෙහිද කෝපයක් ඇතිකර ගත්තා. නිරන්තරයෙන්ම මේ නිවසෙහි වළඳන තමාට එවැනි පුද පූජා නොකොට දුටු දුටු කෙනා කෙරෙහි පැහැදෙන කෙනෙකු ලෙස තම දායක මහතා ගැන උන්වහන්සේ කල්පනා කළා.

රහතන් වහන්සේ දායක මහතා සමඟ ගොස් ඔහු දුන් සාටකය පඬු පොවා සිවුරක් පිළියෙළ කරගත්තා. එමෙන්ම කරණවෑමියා ලවා කෙස් කප්පවා ගත්තා. අලුතින් ලද යහනෙහි රාත්‍රී නින්දට සූදානම් වූවා. දායක මහතා දෙදෙනා වහන්සේටම පසුදින උදෑසන තම නිවසෙහි දානයට ආරාධනා කොට ආපසු නිවසට පැමිණියා.

තම දායකයා රහතන් වහන්සේට කළ පුද සත්කාර ගැන ඉවසිය නොහැකි වූ විහාරවාසී භික්ෂුව රහතන් වහන්සේට කාරණා හතරකින් පරිභව කළා. එනම්,

1. ඔබවහන්සේ මාගේ දායකයාගේ නිවසෙහි දානය වැළඳුවාට වඩා අඟුරු කෑවා නම් උතුමිය.
2. මගේ දායකයා එගෙන ආ කරණවෑමියා ලවා කෙස් කපා ගන්නාට වඩා තල් ඇටවලට පටලවා කෙස් උගුලා දමීමා නම් උතුමිය.
3. දායකයා දිදු සිවුර පෙරවනවාට වඩා නිරුවතින් සිටීම උතුමිය.
4. දායකයා දිදු යහනෙහි සැතපෙනවාට වඩා බිම නිදීම උතුමිය...

යන ඉතා දරුණු පරිභවයකින් රහතන් වහන්සේට පරිභව කළා. තම දායකයා පහදවා ගැනීම හේතුවෙන් නේවාසික භික්ෂුවට ඇතිවූ ඊර්ෂ්‍යාවේ තරම ඒ පරිභවයෙන් පෙනෙනවා.

මේ පරිභවය ඇසූ රහතන් වහන්සේ තමා නිසා පාපයක් සිදු කරගන්නා අඥානයා වෙතින් ඉවත්ව හිරු නැගෙන්නටත් පෙරාතුව එම ආරාමයෙන් නික්ම ගියා. ඒ බව නොදත් විහාරවාසී භික්ෂුව පිරිද විහාර කටයුතු නිමවා පිඬු සිඟා යන්නට සූදානම්ව රහතන් වහන්සේ මෙතෙක් නිදනු ඇතැයි සිතා කෙණ්ඩියට නිය පිටින් ගසා තුඩා ශබ්දයක් පමණක් කොට තම දායකයාගේ ගෙදරට ගියා. දායකයා රහතන් වහන්සේ ගැන විමසූ විට ඔහු කීවේ ඔබේ යාළුවා ඔබ දුන් යහනෙහි තවමත් නිදි බවයි. තමා ශබ්ද කරමින් මෙතෙක් වැඩ කළත් ඒ කිසිවකට නොහැකිව නිදන බව දායකයා හමුවේ ප්‍රකාශ කළා.

දායකයා නුවණැති බැවින් ඔහු කල්පනා කළේ උන්වහන්සේ කිසිවිටෙකත් මේ තරම් වේලා නොනිදන්නේය. උන්වහන්සේට


# අනුන්ගේ සම්පතට ඊර්ෂ්‍යා කළොත් වන දේ



"වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න."

පෙරද කළ සත්කාර දන විහාරවාසී භික්ෂුව ඊර්ෂ්‍යාවෙන් උන්වහන්සේ මගහැර පැමිණ ඇත්තේය. එබැවින් සිරිසිදු දන පාත්‍රයක් විහාරයට පැමිය යුතු බවයි. ඒ අනුව භික්ෂුව වළඳවා මාගේ මිත්‍ර හිමියන්ට මෙය පුදනු මැනවැයි පාත්‍රය පුරවා පිණ්ඩපාතය පිටත් කළා. එහෙත් එහිමියන් කළේ 'එම ආහාරය වැළඳුවොත් තවත් දායකයා කෙරෙහි පැහැදෙති' යි සිතෙන් ආහාරය අතරමග කැලයකට විසි කර ආරාමයට පැමිණීමයි. සසර දුක් ගෙවන්නට පැවිදිව මහණදම් පුරන්නට සුදනම් වූ මෙම භික්ෂුව මෙම රහතන් වහන්සේ හේතුවෙන් කරගත් පාපයෙන් මරණින් මතු බුද්ධාන්තරයක් පුරා නිරයෙහි ඉපිද අපමණ දුක් අනුභව කළා. අවසානයෙහි ගෞතම බුදු සමයෙහි රජගහනුවර බොහෝ ආහාර පානයෙන් පොහොසත් නිවසක ඔහු ජන්මය ලැබුවා.

පොහොසත් කුල ගෙයක උපන්නද කර්ම විපාකයෙන් මිදෙනු නොහැකි වුවා. ඔහු කුඩා කළ සිටම පයනයක නින්ද ප්‍රතික්ෂේප කළා. බිම වැතිර නිදන්නට වුණා. කෙතෙක් ආහාර පැවතියත් එම ආහාර ප්‍රතික්ෂේප කොට අශුචි ආහාරයට ගන්නට පටන් ගත්තා. කුඩා කල සිටම ඇඳුම් ඇඳීම ප්‍රතික්ෂේප කොට නිරුවතින් වාසය කළා. ළමා කාලයේ නොදනීම නිසා මෙසේ කරතියි දෙමාපියන් සිතුවද තරුණ වියේදීත් එසේ වූ නිසා ඒ අය මොහු අත්හැර දැම්මා. පසුව ආජීවක ආරාමයක් වෙත ගොස් පැවිදි වුවා. පැවිදි වීමේදී සියලුම කෙස් තල් ඇටවලින් ගලවා දැම්මා. රහතන් වහන්සේට කළ නින්ද පරිභවය ඒ ලෙසින්ම ඔහුට විඳින්න වුණා.



ආජීවක පැවිද්ද ලැබුවද දායකයන් එවන දානමාන සියල්ල ප්‍රතික්ෂේප කළ මේ භික්ෂුව අශුචි ආහාරයෙන්ම ජීවත් වුවා. ආරාමයෙන් නෙරපා හැරි විට ගල් තලාවකට පලා ගොස් අශුචි ගඳ වහනය වන්නා වූ සුළඟ පවා ආහාරයක් කොට වාසය කළා. මෙවැනි තවුසෙකු මීට පෙර නොදුටු මිනිසුන් මොහු කෙරෙහි බොහෝ සේ පැහැදී ගම්වල භික්ෂූන් ප්‍රතික්ෂේප කොට රසමසවුළු සකසා ගෙනැවිත් පුදන්නට වුවා. ඒවා වැළඳී විට තම තපස බිඳෙන බව කී තාපසයා තමා රකින්නේ ඝෝර තපස් බව කියාපෑවා. ඔහුට පිදීමෙන් බොහෝ අනුසස් ලැබෙතැයි සිතූ මේ අඥාන මිනිසුන් තාපසයා ප්‍රතික්ෂේප කළත් දිගින් දිගටම ආහාර පුද පූජා කරන්නට වුවා.

මෙසේ පනස් පස් වසරක් නිරුවතින් අශුචි කමින්, කෙස් උගුලමින්, ගල් තලා මත නිදමින් විසූ මේ ආජීවකයා වෙත බුදුරදුන්ගේ කරුණා ඇස යොමු වුවා. ආනන්ද හිමියන්ටද ඒ බව දන්වා මොහු වසන ගල්තලාව වෙතට වැඩම කළා. වැඩම කොට ඔහුට ආමන්ත්‍රණය කොට තමාට එදින රාත්‍රිය ගත කිරීමට ඉඩක දෙන ලෙස ඉල්ලා සිටියා. එය ප්‍රතික්ෂේප කළ ආජීවකයා බුදුරදුන් කවරෙක්දැයි ප්‍රශ්න කළා. තමන් මහා ශ්‍රමණයකු බව බුදුරදුන් වදළා. එය පිළිනොගත් ආජීවකයා බුදුරදුන්ට තම ගල්තලාවෙහි වසන්නට ඉඩක් දීම ප්‍රතික්ෂේප කළා.

අනතුරුව බුදුරදුන් ආසන්න කඳුවැටියේ වාසයට අවසර පැතුවා. ආජීවකයා එයට අවසර දුන්නා. එදින රාත්‍රියෙහි බුදුරදුන් පුදන්න මහා ආලෝක ධාරාවන් විහිදුවා සතරවරම් දෙවිවරු පැමිණියා. තවත් විටෙක තවත් ආලෝක ධාරාවන් පතුරුවා මහා බ්‍රහ්මයාද බුදුරදුන් පුදන්නට පැමිණියා.

රාත්‍රිය පුරා වනය පුරා විහිදුණු මේ ආලෝක දහරාවන් දුටු ආජීවකයා උදෑසනම බුදුන් හමුවට ආවා. මේ විස්මය කුමක්දැයි විමසුවා. බුදුරදුන් රාත්‍රියෙහි තමා හමුවට පැමිණි අය ගැන කියා තමා කවරෙක්ද යන්න ආජීවකට පැහැදුවා. පනස් පස් වසක් ගල්තලාවේ උග්‍ර තපස් රැකී ඔහු බලන්නට මේ කිසිවකු නොපැමිණි බව කී ආජීවකයා "මහා ශ්‍රමණය, ඔබ ආශ්චර්යවත් ශ්‍රමණයෙක් බව" කියා පැහැදුණා.

එවිට බුදුහිමියන් ඔහුට දහම් අවබෝධ කළා. රහතන් වහන්සේ නමකට ආක්‍රෝශ පරිභව කොට විඳි දුක් පෙන්වා දී ආජීවකයානු ඩ් මෝඩ ජනයා සතුටුවා මුලාවට පත් කරවා තවත් පනස් පස් වසක් අප්‍රමාණ දුක් විඳි අයුරු පෙන්වා වදළා. පූර්ව කතාව ඇසූ ඔහු ලැජ්ජාවෙන් මුසපත්ව සංවේගයට පත්වුවා. එයින් පසුව බුදුරදුන් දෙසූ දහම් අසා රහත් බව ලද මෙම ආජීවකයාද අනතුරුව පැවිදි උපසම්පදාව ලැබුවා.

එදින උදෑසන ආජීවකයා පුදන්නට අංගමගධ ජනපදවලින් පැමිණි බොහෝ ජනයා බුදුරජාණන් වහන්සේත්, ආජීවක රහතන් වහන්සේත් දැක කවරෙකු උතුම්දැයි නොදැන සැක ඇති කර ගත් කල්හි ආජීවක රහතන් වහන්සේ අහසට පිවිසූ බුදුරදුන් තමන්ගේ ශාස්තෘවරයා බව ජනයා හමුවේ කියා පෑවා. අවසන ඒ මහා පිරිස හමුවේ දහම් දෙසූ මේ අඥාන ජනයාද ධර්මාවබෝධයට පත් කළා.


අනුන්ගේ සැපත ඉවසිය නොහැකිව ගුණවත් උතුමන්ට පරිභව කළ ආජීවකයා විඳි අප්‍රමාණ නිරා දුක් සමඟයත්, යථාර්ථය නොදැන දුටු දුටු දේ සරණ යන අඥාන මිනිසුන්ගේ ස්වභාවයත් මේ දහම් කරාව ඔබට කියා දෙන්නේ අපූර්ව පාඩමකි.

**පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි**

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවහට ශෝකයක් නැත. බියකුත් නැත."

## උපශාන්ත ගතියෙන් පිරිපුන්, සැත්තෑ වක්වන විය සපිරූ,

# මල්වතු මහනාහිමිපාණන් වහන්සේ



"සන්තකායො සන්තවාචො
සන්තවා සුසමාහිතො
වන්තලොකාමිසො භික්ඛු
උපසන්තොති වුච්චති"

ධම්මපදයේ එන ගුණ ගාථා පාඨය අනුව 'ශාන්ත වූ කය හා වචන ඇති, මනාසේ ශාන්ත වූ, එකඟ වූ සිත් ඇති, ලෞකික ආශා බැහැර කර දැමූ භික්ෂූන් වහන්සේට, උපශාන්ත යැයි කියනු ලැබේ.' මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානාහිමිපාණන් වහන්සේ ද, කයින්, වචනයෙන්, සිතින් බුද්ධ ධර්මයේ ඇලුණු සිත් ඇතිව, ලෝක ශාසනික හා බෞද්ධ සත්පුරුෂයන්ගේ යහපත පිණිස ස්වකීය ශාසනික ජීවිතය කැප කොට ඇති, ගිහි පැවිදි සැමටත් ආදර්ශයට ගත හැකි මහා සංඝ පීතෘවරයාණන් වහන්සේ නමක් සේ හඳුන්වා දිය හැකිය. ශාන්තභාවයෙන් හා විශාරද නුවණින් යුක්තව බොහෝ ඇසුපිරූ තැන් ඇතිව ලෞකිකුරු දහමට අනුරූප වූ ප්‍රතිපදාවෙන් යුක්ත වූ, සංඝශෝභන ගුණයන්ගෙන් ශෝභිත වූ උන්වහන්සේ, සංහිතභාවයෙන් හා සංවර සීල ගුණයෙන් පෝෂිතය.

ආත්මලාභය පිණිස නොව, පරාර්ථචර්යාව පිණිස ඇලී ගිය සිත් ඇති අප මහානාහිමිපාණෝ, ගිහිපැවිදි සැමගේ යහපත පිණිස සාධාරණ වූත්, යහපත් වූත්, සත්පුරුෂ සමාජයක් නිර්මාණය කර ගැනීමට නිරතව සිටින, උදාර භික්ෂු ජීවිතයක් ගතකරන මහානාහිමිපාණන් වහන්සේ නමකි. භික්ෂු ජීවිතයකින් අපේක්ෂා කරන සැම, සංවරශීලීත්වයෙන් හා සීල, සමාධි, ප්‍රඥාදී ගුණයන්ගෙන් වඩා වර්ධනය වී, තමන් සතුදේ අනායන්ට දානය කිරීමෙහිලා නිර්ලෝභී වූ උදාර චරිතයක් ඇති මහානාහිමිනමකි. උන්වහන්සේ ශ්‍රී ලංකාවේ සෑම සියලු විහාරස්ථානයන්ගේත්, මහාසංඝරත්නයේත් පූජනීයත්වය හා ගෞරවණීයත්වයත්, සුරක්ෂිතභාවයත්, අභිවර්ධනයත් රැකගැනීමට බලවත් සිතුකමකින් කාර්යක්ෂමව කටයුතු කිරීමට ස්වකීය භික්ෂු ජීවිතය කැපකොට ඇත්තාහ.

මල්වතු මහාවිහාරය පාර්ශ්වය මූලික කොට ලෝකශාසනික හා ධර්මශාස්ත්‍රීය අභිවර්ධනය උදෙසා අනුපමේය සේවයක් ඉටුකළා වූ රාජපූජිත වැලිවිට සංඝරාජ හිමිපාණන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය රත්නයක් වූ, මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක මහපාදවරයන් හා ඉපැරණි රිදී විහාරයේ අධිපතිත්වයෙන් පිදුම් ලැබූ, අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන බුද්ධරක්ඛිතාභිධාන (රාජ්‍ය වර්ෂ 1753 - 1773) මහානායක හිමිපාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ සහ සරපුරෙන් පැවත එන වර්තමාන මහනුවර උපෝසථ පුෂ්පාරාම විහාරාධිපති අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන ස්‍යාමෝපාලි මල්වතුමහාවිහාර පාර්ශ්වයේ විසි හයවන මහානායක මහාස්ථවිරන්ද්‍රයන්වහන්සේ, වන්සත් සසුන්සෙත සලසන මහසඟරුවනකි.


සම්බුදු දහම මැනවින් දැන උගත නිහතමානී චාම් සරල භික්ෂු ජීවිතයක් ගෙවමින්, ස්වකීය පාර්ශ්වයට පමණක් නොව ලෝකශාසනයටම අභිවෘද්ධිය සේවයක් ඉටුකරන උන්වහන්සේගේ නිරහංකාර සංවර භික්ෂු ජීවිතය සැමටත් ආදර්ශයට ගත හැකි උදාර චරිතයකි. උදෙසින් සතුටුවන සිත් ඇති උන්වහන්සේ උපසේන පටිසෝත වක්තුන් හා සිල්ගුණය තිබුල් ලෙස රැක් සිටිමට යන්න නොදරන පරිත්‍යාගශීලී ගුණයෙන් යුක්තවන්නාහ. තථාගත සම්මාසම්බුද්ධරජාණන් වහන්සේගේ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයේ චිරා පැවැත්මට සවිලන සේ ස්වකීය ආචාර්යවරයන්ගේ ආදර්ශ හා ශික්ෂාවන්හි හැසිරෙමින් මෙලොව පරලොව යහපත පිණිස, වැඩ පිණිස කටයුතු කිරීම උන්වහන්සේගේ උතුම් සිරිතයි. ලාභ ප්‍රයෝජනයන් නොලැබෙතැයි නොසිතමින්, නිවුනුත සසුව අවංකව කීම උන්වහන්සේ තුළ පවත්නා සුවිශේෂී ලක්ෂණයකි.


මෙබඳු යථාර්ථවාදී භික්ෂු ජීවිතයකින් හා සුපරිපන්න, උපුරුවත්තාදී සංඝ සෝභන ගුණයන්ගෙන් ශෝභිත, අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන වර්තමාන මහානාහිමිපාණන් වහන්සේ මෙලොව එළිය දුටුවේ රාජ්‍ය වර්ෂ 1944 ක් වූ මැයි මස 30 වන දිනයේදීය. වර්ෂ 1957 ජූනි මස 10 වන දින මල්වතු මහාවිහාරයේ මංගල උපෝසථාගාරයේ දී පැවිදි දිවියට ඇතුළත්ව පියවරෙන් පියවරට ශාසනික පදවි ලැබූහ. පූර්වකෘත පුණ්‍ය බල මහිමයෙන් වර්තමාන වර්ෂ 2004 ජූනි මස 20 වන දින මල්වතු මහාවිහාරයේ මංගල උපෝසථාගාරයේ දී උපෝසථ පුෂ්පාරාම විහාරාධිපති හා මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අතිපූජනීය මහපදවියෙන් පුදනු ලැබූ අප මහානාහිමිපාණන් වහන්සේට රාජ්‍ය වර්ෂ 2004 අගෝස්තු මස 16 වන දින ඓතිහාසික මඟුල් මඩුවේ දී මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විසි හයවන මහපදවියට නියමිත ශ්‍රී සන්නස් පත්‍රය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය විසින් පිළිගන්වන ලදී. 'උඩතු නොව මහණ' යන වැලිවිට සරණංකර හිමියන්ගේ ආදර්ශ පාඨය නිතර සිහියේ තබමින්, බුදුදහමේ හා භික්ෂු සමාජයේ චිරස්ථිතිය, ගෞරවය හා ශාසනයේ ආරක්ෂාව පිණිස පැවිදි ජීවිතය කැප කොට ඇති උන්වහන්සේට, ත්‍රිවිධ රත්නයේ හා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් සියවස් කලක් නිරෝගීව වැඩසිටීමට ආයුරාරෝග්‍ය සම්පත්තිය නොඅඩුව ලැබේවායි උදාර වරුණ ප්‍රාර්ථනා කරයි.

**කේ. මීගහකුඹුර**

# අස්ගිරි මහාවිහාරයෙන් ලොවට ලබාදුන් ශාසනික ආදර්ශය

**පසුගිය** දා පුරප්පාඩු වූ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ රාජපූජිත ඉපැරණි මහපදවිය හා අනුනායක පදවි සඳහා අභිනවයෙන් කෙරුණ පත්කරගැනීමෙහිලා සහ සසුනට ලබාදුන් ආදර්ශය සාංඝික ප්‍රතිපත්තියට ලක්ව ඇත. තමන් රාජපූජිත පදවි සඳහා සුදුසු හිමිවරුන් වහන්සේලා පත්කරගැනීමෙහිලා එහි ඓතිහාසික උපෝසථාගාරයට රැස්වූ විංශතිවර්ගික කාරක සංඝ සභාව ස්වකීය සම්මත ඡන්දයෙන් උතුම් මහානායක පදවියට, ගැටඹේ විජයසුන්දරාරාම විහාරාධිපති, අතිපූජ්‍ය ගලගම ධම්මසිද්ධි ශ්‍රී ධම්මානන්ද අත්ථදස්සාභිධාන මහානායක හිමිපාණන් වහන්සේ ද, අනුනායක පදවි පිළිබඳව ඉපැරණි සිරිත රැකි පණගොඩවිමින් අනුනායක පදවි දෙකක් ස්ථාපනය කොට එම අනුනායක පදවි දෙකට, මුතියංගණ රජමහාවිහාරාධිපති අතිපූජ්‍ය වරකාගොඩ ඤාණරතන නාහිමිපාණන් වහන්සේ සහ පොළොන්නරුව පොළොන්නරු විහාරාධිපති අතිපූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි නාහිමිපාණන්වහන්සේ පත්කර ගැනීම සම්බන්ධයෙන් උදාර වරුණේ ප්‍රණාමාංජලිය ගෞරව නමස්කාර පූර්වකව පුදනට සිටිමු.





"ආරාම සිටි පුතුය. ඇසුරට මොකිවිය පුතුය. අභිනවු ගමන් ඉල්ලූ කල රිසක් වූවන් දිය පුතුය. මේ තුන් කරාණන් නොඅඩුව දෙවියන් වෙත සැපසිය."

# මේ උතුම් දින සැබෑ බුදු දහම හඳුනා ගනිමු



වෙසක් සඳෙහි ආලෝකය කෙමෙන් විහිදී යන්නේ ශ්‍රී ලාංකික අපට උදාවන්නේ පොසොන් සඳයි. බුදුන් වහන්සේ භාරතයෙහි පහළ වන විට එරට වාසීන්ගේ සිතුම් පැතුම් මෙන්ම දර්ශන පිළිබඳව මනා විවරණයක් බ්‍රහ්මජාල සූත්‍රයෙන් දත හැකිය. ඒ සියල්ල අභිබවමින් බුදුන් වහන්සේගේ සාර ගවේෂණය භාරතය ආලෝකමත් කළේය.

පොසොන් සඳෙන් ලක්දිව ආලෝකමත් වූයේද එපරිද්දෙනි. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ තෙවලා දහමින් ලක්දිව බිත්ධාවාරගත කළෝය. මෙම ඓතිහාසික සිදුවීම නැවත නැවතත් පුනරුච්චාරණය කිරීමට අවකාශ නොවේ. නමුදු ඒ සිදුවීම පරතා නැවත අවදි සිතක් ඇතිකර ගත යුතුය.

ශාසනය පිහිටුවීම සඳහා ලක්දිව උපන් පුත්‍රයකු මහණව මෙහිම විනය සංගායනා කිරීමෙන් ගත් පියවර ඉතා නැණවත් ක්‍රියාමාර්ගයක් විය. එයින් වැදගත් සංකල්පයක් බිහිවිය.

"ගමයි පන්සලයි - වැවයි දාගැබයි
කත සිවුරයි - වෙල් එළියයි"

යන සංකල්පය ගොඩනැගෙන්නේ මේ පසුබිම තුළය. මෙම බුදු සමය ගිහි-පැවිදි දෙපාර්ශ්වයේම සහභාගිත්වයෙන් මෙන්ම සමාන වගකීමකින් යුතුව සමාජය පෝෂණය කළේය.

එහෙත් අද ඇත්තේ ඒ බුදු සමයමද? අප විසින් ගමන් කරනු ලබන්නේ යට කී බුදුසමයේ පරමාදර්ශ වෙතද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට නූතන අදහසක් වෙත අපගේ අවධානය යොමු කළ යුතු වේ.

අයිවර් ජෙනිංග්ස් යනු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපතිවරයාය. නීති විශාරදයෙකි. ඔහු බ්‍රිතාන්‍යයට ගිය පසු පොතක් ලිවේය. එය නමින් "නැෂනලිසම් ඇන් නිව්ලි ඉන්ඩිපෙන්ඩන්ට් ස්ටේට්" නමැති පොතයි. ඔහු මෙම පොතේ ලංකාව ගැන අපූරු සඳහනක් ඉතා අවධාරණයෙන් පවසයි. එනම්,

ඔවුහු ලංකාවෙන් යනවිට නව බුදු දහමක් නිර්මාණය කොට ගියේය. එනම් "ගෝල් රෝඩ් බුඩිසම්" ය. එහි සිංහල අදහස ගාලු පාරේ බුද්ධාගම යන්නයි.

මිහිඳු හිමියන් අපට දායාද කළ බුදු දහමේත්, අයිවර් ජෙනිංග්ස් පවසන ගාලු පාරේ බුද්ධාගමේත් වෙනස කුමක්ද?

මිහිඳු හිමියෝ උගන්වා වදළ බුදුදහමේදී මෙරට ජනතාව උදේ පටන් ඒ වනතුරුත්, නිරන්තරයෙන් බුදු දහමෙන් ලත් ශික්ෂණය තිබුණේය. කෑම ගැනීමේදී ජෛවීය ධර්ම නොනසමින් ආහාර ගත්තේය. හැසිරීම නැතට උචිත විය. ප්‍රිය උපදවන ආකාරයට කතා කළේය. මිත බඳින ආකාරයට හැසිරුණේය. නම් ගෙන්වල පවා බෞද්ධ පුරුවක් තිබුණේය. මෙයින් අදහස් කරන්නේ පැරණි බෞද්ධයා පව්කම් අකුසල් නොකළ බව නොවේ. වැදගත්ම දෙය ඔවුන් තමන් කරන ක්‍රියාව පිළිබඳ අවබෝධයකින් පසුවිය. එහි විපාක පිළිබඳ දැන සිටියේයි. එම නොහොබිනාකම් සමාජයෙන් තමන් ප්‍රතික්ෂේප වීමට බලවත් බව දැන සිටියේය. තම නුවණ අනුවණ දැන සිටියේය.

එහෙත් අද තත්ත්වය වෙනස්ය. දූෂිත, දුරාචාර, අපචාර, ජනකාන්ත ජනප්‍රිය බවක් ගෙන ඇත. සමාජයෙන් ප්‍රතික්ෂේප කිරීම වෙනුවට සමාජයේ තම ප්‍රතිභාව තහවුරු කරගැනීමට ඒවා අවශ්‍ය වී ඇත. මෙම සමාජයේ බුදුදහම අවශ්‍ය වන්නේ පැවැතීමට අවශ්‍ය තවත් එක් හැසිරීමක්, ක්‍රමයක් ලෙසට පමණි. හදවතෙහි එම ගුණ නොතිබුණාට කම් නැත. ආභරණයක් ලෙසට පමණක් බුදුදහම යොදනී.

ජනයාගෙන් බලෙන් මුදල් ගෙන අද සමහරු දන්සල් දෙන්නේ එනිසාය. දන්සල අවසානයේ මත්පැන් සාද සහ රැයිතුත් අවසන ගහ මරා ගන්නේ එනිසාය.

බුදුදහම රැකගත යුතු දෙයක්ද, ඉවත් කළ යුතු දෙයක්ද? මේ ප්‍රශ්න දෙකටම ඇත්තේ එක් පිළිතුරකි. ඒ නැත යන්නයි. බුදුදහම ඇත්තේ අවබෝධ කරගැනීමටය. විවහා ගැනීමටය.

අප බුදුදහම රකගන්නට යැයි පවසමින් සිදුකරනු ලබන්නේ තෙරුවන් නොමැති ක්‍රියාවන්ය. එහෙත් අපි ඒ වෙනුවෙන් පෙනී සිටිමු. බුදුන් වහන්සේ පහුරක උපමාවෙන් පැහැදිලි කළේද මෙයයි. පහුර ඇත්තේ එතෙර වීමට මිස කරගසාගෙන යාමට නොවේ. අපි පහුරෙන් එතෙර වන්නේද නැත. එය අලංකාර කරමින් නැව දමමින් මට පහුරක් ඇත යන අදහසින් වැඩ කරයි. පහුරින් ගත යුතු කිසි වැඩක් ගන්නේ නැත. කවුරුන් හෝ පැමිණි විට පහුරට නැග අපි අපගේ උජාරුව පෙන්වමු.

ආගම් මිනිස් සමාජය තුළ මුලින්ම උපත ලබන්නේ බිය මුල්කරගෙනය. "ආරාම රුක්ඛ චේතියානි මනුස්සා භය තජ්ජිතා" යනුවෙන් සඳහන් වන්නේ මේ නිසාය. භය වූ මනුෂ්‍යයෝ ගස්, ගල්, පර්වත සරණ යති. කෙමෙන් කෙමෙන් මිනිසාගේ දැනීම වර්ධනය වන විට භය පහව යයි. වැස්ස, අව්ව, සුළඟ ගොඩනගන දෙවියකුගේ වැඩක් නොවන බව ඉගෙන ගනී. ඒ සමගම ආගමද ඔවුන් කෙරෙන් තුරන් වෙයි. නවීන විද්‍යාව දියුණු වීමත් සමග ආගම්වල ඇති යම් යම් ප්‍රභාග අසත්‍ය බව පෙනී යාමත් සමග ආගම තුරන් වී යයි. මෙහිදී ආගම තවත් එක් ආභරණයක් පමණි.

බුදු දහමට මෙය ගැළපේද? නැත. බුදුදහම උපදින්නේ උතුම් පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙසය. ආර්ය පර්යේෂණ සූත්‍රය කියවීමෙන් මේ බව පෙනේ. මෙවැනි පර්යේෂණයක් සිදුකරන්නට සිදුහත් කුමරා පෙළඹවූයේ භය නොවේ. එසේ නම් කුමක්ද?

මිනිසාට උරුම වන ඇවතෙල් දහම දැක උපන් සංවේග යයි. එය බිය හෝ ශෝකය නොවේ. පර්යේෂණ කරන්නට කරන්නට තමන් සොයන විමුක්තිය සත්‍ය බව සිදුහත් කුමරාට වැටහී තිබේය. ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් තේරුම් ගත්තේය. ලෝකය තුළ ඇති සියලුම ද්‍රව්‍ය ලෙස බැලුවේ ඒවා ඇත්ත දේවල් ලෙස නොව සතර මහා භූතයන්ගෙන් සැදී ඇති අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලක්ෂණ ඇතුළත් දේ ලෙසය. මෙහිදී උපන් ධර්ම සංවේගය, ප්‍රඥව ලැබීමට උපකාරී විය. එම ගමන හෙවත් ආර්ය පර්යේෂණය නිමා වූයේ මේ සතර දුකින් නිදහස් වීමෙනි. එය මනුෂ්‍යයාගේ බාහිරින් ඇති දෙයක් ලෙස නොව ඔහු අභ්‍යන්තරයෙහි ඇති දෙයක් බව උගන්වා වදළහ.

ත්‍රිවිධ ශාසනය තුළ හෙවත් පරියත්ති එනම් ධර්මය, පටිපත්ති නම් පිළිවෙත්, පටිවේද එනම් අවබෝධය යන කරුණු තුළ හික්මවීමෙන් ජීවිතය ජයගත හැකිය. බුදුදහම සමස්ත ජීවිතයේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි ධර්මය දේශනා කොට ඇත.

මේ මිහිඳු හිමියෝ රැගෙන ආ බුදු දහමයි. අපට අපේ උරුමයක් වූ බුදුදහමයි. මෙම දහම හඳුනන්නට හඳුනන්නට, විමසන්නට විමසන්නට උපදින්නේ සතුටයි. හදවත පිනා යාමෙන් පින් උපදින බුදුදහමයි. තුන්දොරින් කරන ක්‍රියාවන් තුළින් උපදින්නේ කුසලයයි.

මේ බලන්න, දිනක් බුදු හිමියෝ දක්මට ආ දෙවියකු මෙසේ විමසයි.

"ස්වාමීනි, එක වේලක් වළඳන, කැලයේ වසමින් බඹසර රකින භික්ෂූව මෙතරම් ප්‍රසාදජනක ඇයි?"

බුදුන් වහන්සේගේ පිළිතුර මෙසේය.

"අතීතය ගැන ශෝක නොකරයි. අනාගතය ගැන සිහින නොදකියි. වර්තමානයේම වසය කරයි. එහෙයින් භික්ෂූව ප්‍රසාදජනකය, ප්‍රීතිමත්ය."

(සංයුක්ත නිකාය, අරඤ්ඤ සූත්‍රය)

මෙය වෛද්‍ය විද්‍යාවෙන්ද තහවුරු වූ සත්‍යයකි. අප සතුටින් සිටින විට මොළයේ රසායනික ද්‍රව්‍යයක් උපදී.

එය යහපත්ද? අයහපත්ද? යන්න මොළය නොදනී. නමුත් මොළය එය සිතක තබාගෙන නැවත නැවත එය කිරීමට හෙවත් වර්තමානය තුළ ජීවත් වීමට පොළඹවයි.

පූජ්‍ය උඩුහාවර සුමනරතන හිමි

"යකඩයෙන් හැදුණු මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## අපරාධ රැල්ලට වැට බඳිමු


විටින් විට අසන්නට හා දකින්නට ලැබෙන විවිධ ආරංචිවලින් පෙනී යන්නේ අපරාධ සංස්කෘතිය තවමත් අප අතරින් තුරන් වී නොමැති බවය. මේ මෑතකදීම එබඳු සිත් කම්පා කරවන පුවතක් වාර්තා වූයේ යාපනය ප්‍රදේශයෙනි. ඒ ගැන වැඩි විස්තර ලිවිය යුතු නැත්තේ අද වන විට එම ම්ලේච්ඡ සිදුවීම අප ධර්මද්වීපයෙන් මුළු ලෝකයටම වාර්තා වී තිබීම නිසාය.

සමාජය මේ අයුරින් පරිහානියට පත්වීම පිළිබඳව වගකිව යුත්තන් මෙන්ම ආගමික නායකයන්ද සොයා බැලිය යුතුය. සොයා බැලීම පමණක්ම ප්‍රමාණවත් නැත. ඒවාට අවශ්‍ය විසඳුම්ද ඉදිරිපත් කළ යුතුය. එය අප කාගේත් වගකීමකි. ඉතා අමාරුවෙන් මනුෂ්‍යත්වයක් ලබාගත් අයෙකු එකවරම තිරිසනකුගේ තත්වයට පත්වන්නේ කෙසේද? මෙය මනෝවිද්‍යාත්මක ප්‍රශ්නයකි. රටක හා සමාජයක විනයක් තිබිය යුතුය. සදාචාරයක් තිබිය යුතුය. මේ ගුණාංග දෙකම අයාලේ ගිය විට රට ඇද වැටෙන්නේ අඳුරු අගාධයකටය. මෙතරම් බණ කියන රටේ සමාජය පිරිහීම ඇත්තෙන්ම ඉතා ශෝචනීය තත්ත්වයකි.

රටක සමාජ සංස්කෘතික ජීවිතයේ වැදගත් චරිත කිපයක්ම තිබේ. භික්ෂූන් වහන්සේ, පූජකයා, දේශපාලකයා, ගුරුවරයා, වෛද්‍යවරයා, යුක්තිය පසිඳලන්නා, කලාකරුවා සහ ජනමාධ්‍යවේදියා ඒ අතර කැපී පෙනෙන චරිත වෙති. මේ සෑම චරිතයක්ම බාල හා තරුණ පරපුරට කවර ආකාරයේ හෝ පූර්වාදර්ශ සපයන චරිත වීම අතිශයින් වැදගත්ය. අධ්‍යාත්මික සංවර්ධනයක්ද රටක දියුණුවට හා යහපතට අවශ්‍යය. අද එබඳු අධ්‍යාත්මික ගුණ වගාවන් රට තුළ තිබේද යන්න සැක සහිතය. මෙයද එක්තරා විදියකට යහපාලනයකට අඩංගු විය යුතු වැදගත් සාධකයකි.

යුක්තිය හා සාධාරණත්වය ආරක්ෂා කිරීමට සිටින පිරිස් මානව සාරධර්ම උල්ලංඝනය කිරීමට පෙළඹේ නම් සිවිල් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සුරැකෙන්නේ නැත.

මේ උදාවූ පොසොන් සඳැසින් රට බැබළෙන බොහොමයක සැබෑ බෞද්ධයන් මෙම කරුණු ගැනද ගැඹුරින් මෙනෙහි කළ යුතුය. ■



මන, විඥ්ඥානය කියන්නේ සිතට බව සාමාන්‍ය මතයයි. නමුත් එය වැරදි අර්ථකථනයයි. මන යනු ආධ්‍යාත්මික ආයතනයකි. මනස කියන්නේද මනටමය. ඇස, කන, නාසය, දිව, කය සහ මන ලෙස ආයතන හයකි. මේවා සළායතන, ආධ්‍යාත්මික රූප, ආධ්‍යාත්මික ආයතන, ද්වාර යන වචනවලින්ද හඳුන්වයි. ආධ්‍යාත්මික රූපවල ප්‍රසාද ස්වරූපයක් හෙවත් පැහැපත් ස්වභාවයක් පවතී. ඇසේ චක්ඛු ප්‍රසාදය (කළුපාට කොටස), කනේ සෝත ප්‍රසාදය (කන් බෙරය), නාසයේ ඝාන ප්‍රසාදය (එක්තුර හැඩැති කොටසක්), දිව-ජිව්හා ප්‍රසාදය (රස දැනෙන ස්ථාන), කය-කාය ප්‍රසාදය (ස්පර්ශය දැනෙන තැන්) සහ මනෝ-මනෝ ප්‍රසාදය ආධ්‍යාත්මික රූපවල පවතින ප්‍රසාද ස්වරූපය හෙවත් පැහැපත් ස්වභාවය නිසා බාහිර රූප, ආධ්‍යාත්මික රූපවලට ඇද ගැනීමක් හෙවත් පොඹුවීමක් සිදුවේ. ඇසට - වර්ණ රූප, කනට - ශබ්ද රූප, නාසයට - ගන්ධ රූප, දිවට - රස රූප, කයට - ඵොට්ඨබ්බ රූප සහ මනට - ධම්ම රූප පොඹුවීමක් සිදුවේ.

මන ප්‍රවිශේෂ වන්නේ අනෙකුත් ආයතන පහ සමග එකටම



"අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරැද්දුවේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු

# මනෝකාය යනු කුමක්ද?

ක්‍රියාත්මක වන නිසාය. ඒ වගේම බාහිර රූප ස්පර්ශයේදී මන මුලින වී සිත් සකස් කරයි. එනම් මන පූර්වාංගම ලෙස කටයුතු කරයි. වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප සහ ෆොට්ඨබ්බ රූප මනායතනය තුළින්ම යොමු කරවයි. මෙසේ මනෝ ක්‍රියාත්මක භාවය මනසිකාරය ලෙස හඳුන්වයි. මන අදෘශ්‍යමානයි. මනත් රූපයක් නිසා එයද පඨවි ආපෝ තේජෝ වායෝ යන ධාතු හතරෙන් සෑදුන දෙයකි. එමෙන්ම මන බැසගෙන ඇත්තේද මෙම ශරීරය තුළයි. මනෝ කාය ලෙස හුතන පූජයේ හඳුන්වනුයේ මනමය. ශල්‍යකර්ම කළ සමහර රෝගීන් සිහිය ආ පසු සිදුකළ සියල්ල විස්තර කරනුයේ මෙම මනෝකායෙන් දකපු ඇහුණ දේවල්ය. එනම් මනෝකායට නිපුණු ඇස, කන ආදිය ඇතත් ඒවා අපගේ ඝන කය සමග පවතින විට ක්‍රියාත්මක නොවේ. භාවනා කර දියුණු අයකුට එම නිපුණු ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක කළ හැකිය. මරණයත් සමග මන අපගේ කයෙන් ඉවත් වේ.



විඤ්ඤාණය යනු දැනුවත් වීමේ ශක්තියයි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, විඤ්ඤාණ ලෙස ධාතු හයකි. එනම් විඤ්ඤාණයද ධාතුවකි. ස්වභාවික ශක්තියකි. එය ආධ්‍යාත්මික රූපත්, බාහිර රූපත් එකතු වන තැන හට ගනී. ''ද්වයං පටිච්ච විඤ්ඤාණං සම්භෝති', විඤ්ඤාණ හයක් පිළිබඳ කතා කළත් ඇත්තේ එක් විඤ්ඤාණයකි. හටගැනීමට උපකාර කරන ආයතනය මත ඊට නම යොදා ඇත. 'චක්ඛුං ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං' - ඇසත්, රූපයත් ගැටීමෙන් චක්ඛු විඤ්ඤාණය ද, මෙලෙස කනත්, ශබ්දයත් ගැටීමෙන් සෝත විඤ්ඤාණයද, නාසයත් ගන්ධයත් ගැටීමෙන් ඝාන විඤ්ඤාණයද, දිවත් රසත් ගැටීමෙන් ජිව්හා විඤ්ඤාණයද, කයත් ෆොට්ඨබ්බයත් ගැටීමෙන් කාය විඤ්ඤාණයද, මනත් ධම්මයත් ගැටීමෙන් මනෝ විඤ්ඤාණයද හට ගනී. එනම් විඤ්ඤාණයෙන් සිදුවන්නේ වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, ෆොට්ඨබ්බ රූප සහ ධම්ම රූප දැනුවත් වීමයි. විඤ්ඤාණය සකස් වන්නේ සත්වයා තුළ පමණි. ගස්, ගල්, පර්වත ආදී භෞතික දේ තුළ විඤ්ඤාණය නොමැත. විඤ්ඤාණය දෘශ්‍ය මාන නොවන ශක්තියකි. 'විඤ්ඤාණං අනිදස්සනං', විඤ්ඤාණය තනිවම පැවැත්විය නොහැක. එයට නාම රූප අවශ්‍ය වේ. එමෙන්ම නාම-රූපවලටද විඤ්ඤාණය අවශ්‍ය වේ. තරියට දරමිටි දෙකක් කෙලින් අතට එකිනෙකට හේත්තු කර තැබීමට එම මිටි දෙකම එකිනෙකට උපකාර කරගන්නා සේ. 'විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා විඤ්ඤාණං.''

සිත කියන්නේ කුමක්ද? සිත යනු විඤ්ඤාණ, නාම, රූපයාගේ ක්‍රියාකාරීත්වයකි. එමෙන්ම සිත යනු සකස් වූ ක්‍රියාකාරීත්වයකි. සිත ස්පර්ශ කළ නොහැක. දෘශ්‍යමාන නොවේ. සිත තිබෙන තැනක් සොයාගත නොහැක. සිත සකස් වීම සිදුවන්නේ සත්වයා තුළ පමණි. අප ජීවත් වෙනවා කියලා කියන්නේ කුමටද? ඇහෙන් රූප බලනවා, කනෙන් ශබ්ද අහනවා, නාසයෙන් ගන්ධ විඳිනවා, දිවෙන් රස විඳිනවා, කයෙන් ස්පර්ශ විඳිනවා, මනෙන් මෙනෙහි කරනවා, කට කනවා, බොනවා, නානවා, ඇවිදිනවා, ඉඳගන්නවා, හිටගන්නවා, නිදාගන්නවා, අතපය නවනවා, දිග හරිනවා, එහා බලනවා, මෙහා බලනවා, මෙහෙම කරන්න හිතන්න පුළුවන්ද සිතක් නැතිව? එනම් මෙම සෑම ක්‍රියාකාරීත්වයක්ම සිදුවන්නේ සිතක් සකස් වුණොත් පමණි. මේ අනුව අපට නිගමනය කළ හැක්කේ බාහිර විද්‍යමාන වන්නේ ක්‍රියාකාරීත්වයක්. නමුත් ඒ තුළ සකස් වී ඇත්තේ සිතක් බවයි. එනම් මෙම ක්‍රියාකාරීත්වයන් විග්‍රහ කර බැලීමේදී සිතක ව්‍යුහය හඳුනා ගත හැකිය.

එහිදී සිදුවන්නේ ආධ්‍යාත්මික රූපවල පවතින ප්‍රසාද ස්වරූපය හෙවත් පැහැපත් ස්වභාවය නිසා බාහිර රූප, ආධ්‍යාත්මික රූපවලට ඇදගැනීමක් හෙවත් යොමුවීමක් සිදුවේ. එනම් ඇසට-වර්ණ රූප, කනට-ශබ්ද රූප, නාසයට-ගන්ධ රූප, දිවට-රස රූප, කයට-ෆොට්ඨබ්බ රූප සහ මනට-ධම්ම රූප යොමුවේ. එවිට විඤ්ඤාණය හට ගනී. දැන් තුනක් එකතු වී ඇත. එම තුනේ එකතුවීම 'ඵස්ස තිණ්ණං සංගති ඵස්සෝ' හෙවත් ස්පර්ශය ලෙස හඳුන්වයි. ඵස්ස යනු නාම ධර්මයකි. එනම් නාම ධර්මද හටගෙන ඇත. නාම යනු අරමුණ කරා නැමෙන ස්වභාවයයි. මෙසේ නාමධර්ම පහක් සූත්‍ර පිටකයේ පෙන්වයි. එනම් ඵස්ස, වේදනා, සංඥා, චේතනා සහ මනසිකාරයි. අභිධර්මයේ මීට අමතරව ජීවිතේන්ද්‍රිය (ජීවත්වීම) සහ ඒකාග්‍රතාව (එකගවීම) ලෙස තවත් දෙයක් ඇත.

ඵස්ස යනු තුනක ස්පර්ශයයි. එනම් ආධ්‍යාත්මික රූප, බාහිර රූප සහ විඤ්ඤාණයයි. වේදනා යනු ස්පර්ශ වුණ රූපයට ඇති මනාප අමනාප ස්වභාවයයි. මනාප නම් සුඛ වේදනාවත්, අමනාප නම් දුක්ඛ වේදනාවත්, මනාපත්, අමනාපත් නැතිනම් අදුක්ඛම සුඛ වේදනාවත් ඇතිවේ. සංඥා යනු හඳුනා ගැනීමයි. වර්ණ, ශබ්ද, නාට, හැඩය ආදී වශයෙන් හඳුනා ගැනීමයි. චේතනා යනු වේදනා සහ සංඥාවන්ට ඇලෙමින් හා ගැටෙමින් සිතුවිලි පහළ කිරීමයි. එනම් කර්ම හෙවත් සංස්කාර සකස් කිරීමයි. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' මනසිකාරය යනු මෙනෙහි ක්‍රියාකාරීත්වයයි. ස්පර්ශ වනවිට මුලිකවම මනසිකාරය ක්‍රියාත්මක වී අනෙකුත් නාම ධර්ම තුනට යොමු කරමින් ක්‍රියාකාරීත්වය ගෙන යයි.

**පූජ්‍ය මැල්සිරිපුර කුසල හිමි**

# ඔබත් දිව සංතර්පනය කරන්නෙක්ද?

යුරෝපීය රටක දේශපාලන සංචාරයකදී අප හට හමුවූ එක්තරා පුදු අනාගාමික තරුණයකු මෙලෙස අපගෙන් ප්‍රශ්න කර සිටියේය. ඔබවහන්සේලා අදහන බුදුරජාණන් වහන්සේ සියලු සතුන්, දෙවියන් වහන්සේ විසින් මවන ලදැයි යන සංකල්පය පිළිගනු ලැබුවාද? කොහේ නම් ඇයිද බෞද්ධ සංඝරත්නය ඇතුළු බෞද්ධ ජනතාව මෙතරම් සත්ව මාංශ පිදූ බවකින් අනුභව කරන්නේ?

තමන් භක්ෂණය කරන සතුන් හැරෙන්නට අනිවි සතුන් සුවපත් වේවා! යනුවෙන් බුදුරදුන් සුනු ආලයෙන් දෙසා වදාරා ඇත්ද? අප නම් සතුන්ට කිසිසේත් මෛත්‍රිය වඩන්නේ නැත. ශක්තිසාද සතුන් මවා ඇත්තේ මිනිසාගේ ආහාරය උදෙසා නිසයි. එහෙත් ඔබලා සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය, කරුණාව වඩමින්ම ඔවුන්ව, ඔවුන්ගේ මරණය රස කරමින් ගිල දමනවා. එය සම්බුදු කරුණා දහමට අනුගත වන්නේ කෙලෙසද? ඔබලාගේ දහමට අනුව අප දෙකොටියාකයෙන් වඩා වැරදිකරුවන් කවරහුද? පංචශීලයේ පහරවන සිල් පදය කඩා බිඳ දමමින් ඔබලා ඔබලාවම රවටා ගන්නවා නොවේද?

මෙකී ප්‍රශ්න වැල සඳහා අපගේ පිළිතුරු දීර්ඝ සහ සවිස්තර වුවද බෞද්ධාගම ගැනද සාමාන්‍ය දැනුමක් ඇති ඔහුට අප පෙන්වා දුන්නේ යේසුස් වහන්සේගේ අවසන් රාත්‍රී භෝජන සංග්‍රහයට තුන් හතර වේල මාංශම භක්ෂණය කරන එවැනි රටකදී වුවත් සිය ගෝලයන්ට පිළිගැන්වූයේ කුමක්ද? එසේ කරමින් මේ මාගේ මාංශයයි රොටි පිළිගැන්වූයේ ඇයිද? මේ මාගේ රුධිරය මිපල්ලා යනුවෙන් මිදි යුෂ ලබාදුන්නේ කුමකටද? යන්න හොඳ හැටි විමර්ශනාත්මකව බලන ලෙසය.

එම පිළිතුරෙන්ම ඔහුගේ ප්‍රශ්නය නිරාකරණයට පත්වූ බව පෙනෙන්නට තිබුණි. යේසුස් වහන්සේද පරම අවිහිංසාවාදියෙක් බවට කරුණු කාරණා අප හට හැකි පමණින් පෙන්වා දුනිමු.

බොහෝ ප්‍රධාන ආගම් දර්ශනවල එම සංස්ථාපකවරුන් ප්‍රකාශ කරන ලද්දේ කෙබඳු ප්‍රකාශ නොකළ ද පසුකාලීනව දිවග රස තෘෂ්ණාව කිසිසේත් නවතාගත නොහැකි තෘෂ්ණාචරිත පුද්ගලයන් තම තම වාසිය සහ පුද්ගල ජනප්‍රියත්වය තකාම මූලික සිද්ධාන්ත අනිවාර්යයෙන්ම විකෘති කර ලියා ඇති බවද උන්නාන්සේලා වැඩ සිටි කාලවලදී අකුරු ශාස්ත්‍රය නොතිබූ බවද එමනිසා එම බෞද්ධීය තත්ත්වය ඇති වූ බවද පුදු ජාතික තරුණයාට පැහැදිලිකමින් කොරව පිළිගැනීමට සිදුවිය.

බුද්ධඝෝෂ නම් ඇති මිථ්‍යා දෘෂ්ටික පුද්ගලයා කෙටි සම්බුද්ධ දේශනා දිගු කොට, දිගු දේශනා කෙටි කොට, ධර්මයට පරස්පර, පටහැනි දෑ තම සිතැඟි පරිදි විකෘති කොට ලියා මස් ධර්මයද අනුගත කොට එය බුදුරදුන්ගේ මහා මෛත්‍රිය යැයි සඳහන් කොට ඒවා කිසි මුළුකින් කිසිදු තර්කයක් නොමැතිව පිළිගන්නා මොළඳයන කොට්ඨාසයක් සඳහටම ඇතිකොට වසර පන්දහසක් පවතින සම්බුද්ධ ශාසනය දෙදහස් පන්සියකින් අවසන් කළා යැයි උදම් අනා ඇත. ඇතුන් පය දෙනකුගේ බරැති ධර්ම ග්‍රන්ථ විනාශ කරවා ඇත.

මිරි මාංශ උරමින්, මාංශ කටු චූප්පු කරමින්, සත්ව කුස් තුළ සිරිත මිත්තර නිමැති කෝටි ගණන් දරු පැටවුන් කිසිදු හිරිකිතයක් නැතිව වරවර ශබ්ද නගා උරා බී, ඇල් සතරේ අනිත්‍ය මහ පොළොවට පස්වන දිව සංතර්පණය කරමින් නිර්වාණය නමැති තණ්හාවෙන් තොර මාර්ගයට පවතිර්ණ වීමට වර්තමාන බෞද්ධයන් අන්ධානුකරණයේ යෙදෙන පිළිවෙළ සහ තමන් රවටා ගෙන මංමුලාවී භාවනාවේ යෙදී දඟලනු පසෙක සිට නරඹන අපට ඇතිවනුයේ ධර්ම සංවේගයකි.

මේ අනුව නිර්වාණය කෙසෙත් දුරට සාක්ෂාත් වේදැයි තීරණය බුද්ධිමත් බෞද්ධයිනි, ඔබ සතුය. මාංශ දහම් තුළ රැඳෙමින් තෘෂ්ණාව නැති කිරීමට පෙරුම් පුරන්නේ සංවෘත කළයුතු පංචේන්ද්‍රියන් සිය නොදහුවන්කමින් විවෘත කර ගනිමිනි. නිවන ඈතින් ඈතට මෙසෙක් කල් සසරේ ගමන් කර ඇති පරිදිම දිගකර ගනිති.

තනිකරම වාජීකරණයන් වන සත්ව මාංශවල ධාතු ශක්තිය ශරීර කදම්බය තුළ මෝදු වී කීවූ වනවිට ඔවුන් වඩන්නාහට ඉරියව්වන් ඉද දෙදෑස් වසා ගත්තද ඔවුන්ට පෙනෙන්නේ ශරීරය විසින් සිතට අණ දෙන රූප රාමුය. සාමාන්‍යයෙන් සිදුවිය යුත්තේ සිත ශරීරයට අණ දීමය. මෙතැනදී සිදුවනුයේ එහි අනෙක් පැත්තය.

"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා", එහෙත් ඇතැම් "සත්තා උදරියං සුඛිතත්තා" යනුවෙන් කරණීය මෙත්ත සූත්‍රය වෙනස් කළ යුතුද යන්න අනුවණ අටුවාකාරයෙන්ම අසා දැනගත යුතුය. අපට නම් මෙය කිසිසේත් නොවැටහේ. එය අප්‍රමාණයකි. මෙවන් සිද්ධාන්ත ගවේෂණය කරන සියලු දෙනාට තිසරණ සරණයි.

පූජ්‍ය බුද්ධගයාවේ
සිසිලචන්ද්‍රා මෛත්‍රී හිමි



# මෙලොව සිටින පුද්ගල ත්‍රිවර්ගය හඳුනා ගන්න

අංගුත්තර නිකායේ තික නිපාතයේ සඳහන් "ගූථභාණී සූත්‍රය" බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ කැමැත්තෙන්ම භික්ෂූන් වහන්සේ රැස්කරවා දේශනා කරනු ලැබූ සූත්‍ර ධර්මයක්. මහණෙනි, මේ ලෝකයේ පුද්ගලයන් වර්ග තුනක් දක්නට ලැබෙනවා. ඔබවහන්සේලා එම වර්ග තුන මොනවාද කියලා දන්නවාද? එම තුන් වර්ගය තමයි ගූථභාණී, පුෂ්පභාණී සහ මධුභාණී යනුවෙන් හඳුන්වන්නේ. ගූථභාණී, පුෂ්පභාණී, මධුභාණී වචන තුනම එකම ආකාර නිසාම මතක තබාගැනීමටත් හරිම පහසුයි. ඒ වගේම භාණී යන වචනය වචන තුනටම සමානව යෙදී තිබේ. "භාසති" කියලා පාලි භාෂාවෙන් සඳහන් වන්නේ "කියයි" යන තේරුම සඳහා වෙයි. "භාණී" කියලා කියන්නේත්, "කියන්න" යන තේරුම වේ.

පිරිමි කෙනෙකු නම් කියන්නා වන අතර ගැහැනු කෙනෙකු නම් කියන්නී වෙයි. හාමුදුරු නමක් නම් දෙසන ස්වාමීන් වහන්සේ කියනවා කියන වචනය සඳහාම තමයි කතා කරනවා කියලා කියන්නේ. පුද්ගලයකු හෝ කෙනෙකු කතා කරනවා නම් එය කතා කරන්නේ කොහොමද? කතා කරන්නේ කටින් නම් ඇත්තටම කතා කරන්නේ කටින් විතරමද? ඇස්වලින්, මුහුණෙන්, අතින් කෙතරම් කතා කරනවාද? තමාගේ ඔළුවේ මතුවන මුල් අදහස බාහිර සමාජයට ඉදිරිපත් කරනු ලබයි. තම අදහස සමාජයට දෙනවා වාගේම තමන් සමාජයට දෙන දෙයම පෙරළා තමන්ට ලැබෙයි. තම අදහස සමාජ ගත කරන එකයි, කතා කරනවා යනුවෙන් හඳුන්වනු ලබන්නේ. කතා කිරීමේ මූලිකයා කට වෙයි. නමුත් අනෙක් ආකාරයකට සිය අදහස් අනෙක් අයට දෙනවා නම් ඒක කතා කිරීම හැටියට හැඳින්විය හැකියි. ලියලා දීමත් එක්තරා ආකාරයක කතා කිරීමක් වෙයි. එය අදහස් අතර ගනුදෙනුවක් වෙයි.

බුදුරජාණන් වහන්සේ විමසනවා මහණෙනි, ඔය ඇත්තෝ දන්නවාද, ගූථභාණී පුද්ගලයාගේ හැටි කියලා. ඒ කියන්නේ මනුෂ්‍ය හැටිම නොවෙයි. මිනිසුන්ගේ කටේ හැටියි. ගූථභාණී පුද්ගලයා නිවැරැදිව හඳුනා ගන්න පුළුවන් වෙන්නේ, ඔහු කතාකරන දෙයට සවන් දීම තුළයි. ගූථභාණී පුද්ගලයාට කතා කරන විට සිතෙන්නේ තමා පිළිබඳව පමණයි. තමන්ට ලැබෙන ලාභය, තමන්ගේ තත්ත්වය, උජාරුව, පුළුවන්කාරකම, ලොකුකම, ආත්ම වර්ණනාව, තමන්ට යමක් ලැබෙනවා නම්, එහෙම වෙන්නේ මොනවා හරි කිව්වොත් ඔහු ඒ දෙය කියනවා.

තමන්ගේ වාසිය පතා දක්න දෙය දක්කේ නැහැ කියයි. දන්න දෙය වුවත් දන්නේ නැහැ කියයි. තමා දන්නා නැති දෙය වෙනුවෙන් තමා දන්නා බව ඇඟවමින් ඒ වෙනුවෙන් පෙනී සිටී. තමන්ගේ ලාභය, වාසිය, කීර්තිය, එහෙමත් නැත්නම් තමන්ට කන්න, බොන්න ලැබෙන දෙයක් වෙනුවෙන් අසත්‍ය තොරතුරු සමාජයට සන්නිවේදනය කරයි. සමාජයේ ඇතැම් අය එය අසත්‍ය බව නොදන සත්‍ය ලෙස සිතා රැවටී නොමඟ යයි.


බුදුරජාණන් වහන්සේ විමසනවා මහණෙනි, ඔය ඇත්තෝ දන්නවාද "පුෂ්පභාණී" පුද්ගලයාගේ හැටි කියලා. ඒ කියන්නේ ඔහුගේ කටේ හැටියි. "පුෂ්පභාණී" කියලා කියන්නේ මල් සේ මනහර කතා ඇත්තෝ කියන එකයි. එම පුද්ගලයා යහපත් පුද්ගලයෙක් වෙයි. ඔහු කවදාවත් තමා දන්නේ නැති දෙයක් පිළිබඳව කතා නොකරයි. ඔහු කතා කරනවාට වඩා ඒ පිළිබඳව හොඳට සිතින් කල්පනා කරනු ලබයි.

"ගූථ භාණී" පුද්ගලයා හැරුණු පැත්තට වචන හරව හරවා කතා කරයි. ඔහුගේ කට හරියට සහාවේ වැප් වගෙයි. එහෙත් "පුෂ්පභාණී" පුද්ගලයා එසේ නොවන අතර ඔහු කතා කරනවාට වඩා වැඩියෙන් යමක් කල්පනා කරනු ලබයි. කිය යුතු දෙය නිවැරැදිව කියන්නට පෙර පෙළ ගස්වා ගනියි. සෑම තැනකදීම ශාන්ති නොගෙන ඉතාමත්ම සැලසුම් සහගත ආකාරයට කිවයුතු දෙය නිවැරැදිව කියයි.

තවත් පුද්ගලයකු සමඟ කතා කරන විට තමා දන්නා දෙය පිළිබඳව, දන්නා බව ප්‍රකාශ කරන ඔහු නොදන්නා දෙය පිළිබඳව නොදන්නා බවට ප්‍රකාශ කරයි. දුටුව දෙය දුටු බවටත්, නොදුටු දෙය නොදුටු බවටත් ප්‍රකාශ කරයි. තමන්ට ලැබෙන ලාභය වාසිය තකා දුටු දෙය නුදුටු ලෙස ගූථභාණී පුද්ගලයා මෙන් කියන්නේ නැත. සිය කටින් ඔහු සමාජයට දෙනු ලබන්නේ තුමන් නිවැරැදිවම දන්නා සත්‍යය පමණි. එම නිසාම ඔහු යහපත් පුද්ගලයකු ලෙස දක්වයි.

සමාජයේ ජීවත් වන මෙම පුද්ගල වර්ග දෙක තුළ ඇතැම් විට ඔබ දන්නා කියන අයත් මේ කොටස්වලට අයත්. ඔබත් එම ගොඩේම අයකුද විය හැකියි. කාගෙත් කට එක වුවද කෙනෙකු එය පාවිච්චි කරන්නේ එක අරුතකින් වෙනත් කෙනෙකු වෙනත් අරුතකිනි.

බුදුරජාණන් වහන්සේ විමසනවා මහණෙනි, ඔය ඇත්තෝ දන්නවාද "මධුභාණී" පුද්ගලයාගේ හැටි කියලා. මධුභාණී පුද්ගලයා නැතක කතා කරන්න ගියවිට අනෙක් පුද්ගලයන් දෙදෙනාටම වඩා වෙනස් පුද්ගලයකු වෙයි. එක්කෙනෙක් නම් ලාභය පිණිස සමාජයට අසත්‍යය ලබාදෙයි. අනෙක් පුද්ගලයා කිසිදු ලාභ අපේක්ෂාවෙන් තොරව තමන් දන්නා නිවැරැදි දෙය එකහෙළා ප්‍රකාශ කරයි. මධුභාණී පුද්ගලයා කතා කරන වචන හරිම සියුම්. ඔහු තැනක කතා කරන විට කතා කරන්නේ එතැනට උචිත අවශ්‍ය දෙය පමණයි. අසන්නන්ට ඔහු දනුම වැඩියෙන් ලබාදෙයි. සත්‍ය කරුණු වුවද එය නොකියන අවස්ථා ඇත. අවශ්‍ය නම් පමණක් කතා කරන ඔහු අනවශ්‍ය නම් ඔහු නිහඬව සිටියි. ඔහු කතා කරන වචනවලින්



මෙලොව සිටින පුද්ගල ත්‍රිවර්ගය හඳුනා ගන්න

කිසිවකුට චිත්ත පීඩාවක් හෝ වනවාට ඔහු කැමති නැත. සමාජයේ පුද්ගලයන් දනගත යුතු දනුම පමණක් සමාජයට ලබාදෙයි. තමාගේ හෘද සාක්ෂියට එකඟව අවශ්‍ය දෙය ප්‍රකාශ කරයි. හෘදයාංගම සමාජ හිතකාමී වචන කතා කරන පුද්ගලයකු වෙයි. මධුභාණී පුද්ගලයන් සමාජයක දක්නට ලැබෙන්නේ අඩු වශයෙනි. ඔවුන් විශිෂ්ට පුද්ගලයන් ලෙසට අපි දක්වා ඇත. තමා කියන දෙය සත්‍ය වුවද එම ප්‍රකාශය මගින් සමාජයේ පිරිසකට අසාධාරණයක් වෙනවා නම්, එය කාටවත් හානියක් නොවන ලෙස ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා මධුභාණී පුද්ගලයා කල්පනා කරයි.

මිනිසා වචන කතා කරනවා කියලා කියන්නේ පොදු සමාජයට වචන දෙනවා කියලා කියන එකයි. තම තමාගේ වචනයක් එහෙම වුණාට පොදු සමාජයට යමක් දෙන විට හොඳම ආකාරයට දිය යුතුයි කියන අදහස බුදු දහම තුළ ගැබ්ව පවතියි. හොඳම දෙයට දිය යුතු වන්නේ තමාට පෙරළා ලැබෙන්නේ තමා දුන්නු දෙයම වන නිසයි. වචනයක් කතා කරන විට හොඳට විමසලා හිතලා බලන්නේ නැතිව කතා කරන්න හොඳ නැහැ. අපි කවුරුත් මේ කරුණ තේරුම් ගත යුතුයි.

පූජ්‍ය පානේගම ඥාණිස්සර හිමි



# සිල්වත් භික්ෂුවකට දන් දුන්නොත් පින් වැඩියෙන් ලැබෙනවාද?

# දුසිල්වත් භික්ෂුවකට දන් දුන්නොත් පින් අඩුවෙන් ලැබෙනවාද?

භික්ෂූන් වහන්සේලා විසින් යම් තාක් කල් තථාගතයන් වහන්සේගේ විනය අනුව කුල පුත්‍රයන් පැවිදි කෙරේද, උපසම්පදා කෙරේද එතෙක් සංඝරත්නය පවතින්නේය යනු බුද්ධ භාෂිතයයි. බුද්ධ කාලයේ පටන් වර්තමානය තෙක්ම බුදුරදුන් පැනවූ විනය නීති අනුකූලව පැවිදි උපසම්පදා කර්මයන් සිදු වන බැවින් වර්තමානයේද සිටින්නේ එදා සංඝ පරපුරට අයත් වූ භික්ෂූන් වහන්සේලාමය. එදා සාරිපුත්ත මොග්ගල්ලාන රහතන් වහන්සේලාගේ පරපුරේම භික්ෂූන් වහන්සේලාය. රහතුන් වහන්සේලාත් පෘථග්ජන භික්ෂූන් වහන්සේලාත් එකම සංඝ ගණයකි.

මනෝරථපූරණී අටුවා පාඨවල සඳහන් පරිදි පිළිසිඹියා රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක්ද, ශුෂ්ක විදර්ශක රහතුන්ගේ වශයෙන් වර්ෂ දහසක්ද, අනාගාමීන්ගේ වශයෙන් වර්ෂ දහසක්ද, සකෘදාගාමීන් වශයෙන් වර්ෂ දහසක්ද, සෝතාපන්නයන් වශයෙන් වර්ෂ දහසක්ද මෙසේ පන්දහසක් කල් ප්‍රතිවේද ධර්මය පවතින බව පෙන්වා දිය හැකි වේ. ඒ අනුව මේ අප ගත කරන්නේ මෙහි සඳහන් පස්වන භාගයට අයත් යුගයේ බව පෙනේ.

"**ඉමේ ච සුබද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං න සුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස**" යි බුදු පියාණන් සුබද්ද අමතා දේශනා කර ඇත්තේ "මේ භික්ෂූන් මැනවින් වෙසේ නම් ලෝකය රහතුන්ගෙන් හිස් නොවන්නේය" යනුවෙනි.

මෙවන් උතුම් සංඝරත්නය විෂයෙහි දෙන දානය පිළිබඳව ධර්මයේ සඳහන් කරුණු කීපයක් විමසා බලමු. බුදු පියාණන් වහන්සේ තමන් වහන්සේ උදෙසා දෙන පෞද්ගලික දානයට වඩා බුද්ධ ප්‍රමුඛ භික්ෂූන්ට දෙන දාන මහත්ඵල බව අනුදැන වදාරා ඇති සේක. දක්ඛිණාවිභංග සූත්‍රයේ "ආනන්දය කුමන ලෙසකින් වුවද සාංඝික දානයට වඩා පෞද්ගලික දානය මහත්ඵල බව මම නොවදාරමි" යි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ දාරුකම්මික සූත්‍රයෙහි සඳහන් වන අන්දමට, එක්තරා බමුණෙකු ආරණ්‍යවාසී, පිණ්ඩපාතික හා පාංශුකූලික වූ භික්ෂූන් වහන්සේලාටම දන් දෙන බව දැනගත් බුදුරජාණන් වහන්සේ, ඔහුට පෙන්වා දී ඇත්තේ සංඝයා විෂයෙහිම දන් දෙන ලෙසත්, එසේ කිරීමෙන් ඔහුට පැහැදුණු සිතින් මරණින් මතු සුගතියෙහි උපදින්නට එය හේතු වන බවත්ය.

දුසිල්වතුන්ට දන් දීම සම්බන්ධව විමසීමේදී ධර්මයේ සඳහන් කරුණු මෙසේ පෙන්වා දිය හැකිවේ. දක්ඛිණාවිභංග සූත්‍රයෙහි "ආනන්දය, අනාගත කාලයෙහි ශ්‍රාවක සංඝ නාමයෙන් පෙනී සිටින්නා වූ කෙළෙහි හෝ අතෙහි කහ රෙදිකඩක් දරන්නා වූ දුශ්ශීල වූ පාපී වූ පුද්ගලයෝ ඇතිවන්නාහ. එකල සැදැහැවත්තු ඔවුන් උදෙසාද දන් දෙති. ආනන්ද එකල්හිද මෙම සංඝගත දක්ඛිණාව මහත්ඵල අසංඛෙය්‍ය අප්‍රමාණ අනුසස් ඇත්තේයි කියමි" යයි බුදුරජාණන් වහන්සේ වදාරා ඇත.

දුසිල්වතුන්ගේත් ගුණ නැත්තේ නොවේ. ඔවුන් කෙරෙහි ඇත්තාවූ යම්කිසි ගුණයක් සලකා දුශ්ශීලයකුට පෞද්ගලික වන සේ දන් දීමෙන්ද යම් නැණැත්තෙකුට පින් මිස පවක් සිදු නොවේ. එවි

සිදුවන්නේ දුශ්ශීලකම්වලට අනුබල දීමේ අදහසින් දන් දීමෙනි. බෞද්ධයෝ එවන් අදහසින් දන් නොදෙති.

දන් දීමට නුසුදුසු හෝ දන් නොදිය යුතු පුද්ගලයකු ඇති බවක් බුදුරජාණන් වහන්සේ නොවදාළ සේක. ගුණවත් වූද, ගුණ හීන වූද සකල සත්වයන්ටම දන්දීම කළ යුතු බව පෙන්වා දී ඇත.

දන්දීම හා එය වැළැක්වීම ගැන බුදුරදුන් දෙසූ කරුණු අංගුත්තර නිකායේ තික නිපාතයේ දක්වෙන්නේ මෙසේය. "වච්ඡය යමෙක් දන් දෙන්නා වූ අනුන් වයින් වළක්වාද, හෙතෙම තිදෙනකුට අන්තරාය කරන්නේය. එනම් දායකයාගේ පිනට අන්තරාය කරන්නෙකි. ප්‍රතිග්‍රාහකයාගේ ලාභයට අන්තරාය කරන්නෙකි. තමාටම අන්තරායක් කරගන්නෙකි."

ප්‍රතිග්‍රාහකයාගේ ගුණවත්කම අනුව දෙන දානයේ මහත්ඵලය වැඩිය. එනම් සිල්වතාට දන් දීමෙන් ලැබෙන පින දුශ්ශීලයකට දෙන පිනට වඩා වැඩිය. දානයේ නියම ප්‍රතිලාභ ලැබීමට දායකයාගේ සිල්වත්කමද සංස්කෘත වේ. දායකයා සිල්වත් නම් ප්‍රතිග්‍රාහකයා දුශ්ශීල වුවද ඉන් මහත්ඵල ලැබෙන බව බුදුරදුන් වදාරා ඇති සේක.


දුසිල් අයකුට වුව පරිභව කිරීමේ චේතනාවෙන් එනමින් කතා කිරීමෙන් දස අකුසල්වලින් එකක් වූ පරුෂවාචා නම් අකුසලය සිදුවේ. කවර භික්ෂුවකට වුවද ගර්හා කිරීමෙන් පරුෂවාචා පාප කර්මය සිදුවේ.

මෙම කාලයේදී භික්ෂු සීලය නොදන්නා වූ, ඇවැත් නොවන දෙය නොදන්නා වූ, කුඩා ඇවත මහා ඇවත හෝ දුශ්ශීල වන්නේ කෙසේදැයි නොදත් බොහෝ බෞද්ධයෝ අසත්පුරුෂයන්ගේ කියුම්වලට රැවටී සිල්වත් භික්ෂූන්ට චෝදනා කොට පාප කර්ම කරගනිති. මේ බුද්ධ ශාසනයේ සංසයා කෙරෙහි සිත පහදා දානාදී පින්කම් කොට විශාල පිරිසක් සුගතිගාමී වන්නා සේම අසත්පුරුෂයන් ඇසුරු කොට, අනුගමනය කොට, සඟනට ගර්හා කොට විශාල පිරිසක් අපාගත වෙති. අතීත බුදුරජාණන් වහන්සේලාගේ ශාසනවලදීත් මෙවන් පිරිස් අපාගතව ඇති බව බුදුරදුන් වදාරා ඇති සේක.

එබැවින් උත්තරීතර සංඝ ගුණ බුදුරදුන් දෙසූ අයුරින් හොඳින් අසා, විමසා වටහා ගනිමු. බුදු සසුනේ පැවැත්ම දරන්නා වූ සංඝරත්නය කෙරෙහි බුදු වදන අනුවම කටයුතු කරමු. අපිත් අප්‍රමාදීව බුදුරදුන් පෙන්වූ මග යන බෞද්ධයන් වෙමු.

**අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහානායක ස්වාමීපාදයන් වහන්සේ විසින් සම්පාදිත ධර්ම විනිශ්චය, පුණ්‍යෝපදේශ හා සුවිසි මහා ගුණ යන කෘතීන් පරිශීලනයෙන් සම්පාදනය කරන ලදී.**

**ඩී. ඩබ්. පී. කේ. වඩුගොඩ (මධ්‍යම පළාත් සභාව)**





# ඔබ අයිති මින් කුමන භාර්යාවටද?

බෞද්ධ සාහිත්‍යයේ එන භාර්යාවන් සත්දෙනා මෙලෙස දක්වමු.

මාතු භාර්යා: අම්මා තම පුතුට සලකන අයුරින්, අම්මා කෙනෙක් මෙන් තම ස්වාමියාට ඉතාම ආදරයෙන් කවා, පොවා සලකයි.

භගිනී භාර්යා: සහෝදරියක් සහෝදරයෙකුට සලකන අයුරින් ඉතාම ආදරයෙන් තම ස්වාමියාට සලකයි.

සඛී භාර්යා: යෙහෙළියක්, මිතුරියක් සලකන ලෙසට ඉතාම ආදරයෙන් තම ස්වාමියාට සලකයි.

වධක භාර්යා: වදයක්, කරදරයක් ලෙසින් ස්වාමියාට නිරන්තරයෙන්ම හිරිහැරයක් වන පරිද්දෙන් සිටියි. එහි ආදරයක්ද නොමැත.

දාසි භාර්යා: ගෙදර මෙහෙකාරියක් ලෙසින් වද හිංසා, අඩන්තේට්ටම් විඳගෙන වුවද ඉතාම අවිහිංසකව සියලුම වැඩපළ කරමින් ස්වාමියාට ආදරයෙන් සලකයි.

චෝර භාර්යා: නිතරම සොර සිත, ස්වාමියාගේ සම්පත්, පඩි පැකැට්ටුව වුවද සොරකම් කරන්නේ අනාදරයෙන්, ආත්මාර්ථකාමිත්වයෙන් යුතුවය.

ආර්ය භාර්යා: ආර්යාවක් ලෙසින් හැසිරෙයි. නිවසෙහි සියලුම සාමාජිකයන්ට ඉහළින් සිටිමින් උඩගුව කටයුතු කරයි. ස්වාමියාට වුවද නියෝග දෙයි.

**පූජ්‍ය යටමලගම සුමනසාර හිමි - කැලණිය**

# පින් පෙට්ටිය පුරවා ගත්තාට මදි

සංසාර ගමන යනකොට අපට අවශ්‍යම ඉන්ධන වර්ගයක් තියෙනවා. ඒ තමයි පින. මිං "පුඤ්ඤනාති" කියන සූත්‍රයේදී භාග්‍යවතුන් වහන්සේ දේශනා කළේ පිනට බයවෙන්න එපා කියලා. සමහරු හිතාගෙන ඉන්නේ පින් කරන කොට අපිට නිවන් අවබෝධ කරගන්න බෑ කියලා. එහෙම වුණා නම් කවදාවත් බුදු කෙනෙක්ගේ මුවින් පින් කිරීමක් පිළිබඳව දේශනා වෙන්නේ නෑ. උන්වහන්සේ අපිට දේශනා කරලා තියෙන්නේ ටික ටික හරි පින් කරන්න කියලා. මේකට හොඳම උදාහරණය තමයි ධම්ම පදයේ 122 වැනි ගාථා රත්නය. බිළාලපාදක සිටුවරයා අරබයා තමයි මේ ගාථා රත්නය දේශනා වුණේ.

**මාප්ප මඤ්ඤේථ පුඤ්ඤස්ස - න මං තං ආගමිස්සති**
**උදබින්දු නිපාතේන - උදකුම්භෝපි පූරති**
**පූරති ධීරෝ පුඤ්ඤස්ස - ථෝකථෝකම්පි ආචිනං**

පින පුංචි එකක් කියා සලකන්න හොඳ නැහැ. පින්කමට අවමන් කරන්න හොඳ නෑ. වැසි වසින විට වැස්සට තබා තිබෙන නොවැසූ කළය එක එක දිය බින්දුව වැටීමෙන් පිරෙනවා වගේ ටික ටික පින්කර ගැනීමෙන් ඥානවන්තයා පින්වලින් පිරී ඉතිරී යනවා කියන එක තමයි මේකේ සරල අදහස.

මේ දේශනාව කරන්න හේතුවූ කරුණ පිළිබඳවත් අවධාරණය කරන එක වැදගත්. ඒ කාලේ සැවැත්නුවර හිටපු වැසියෝ දානමය පින්කම් කරන්න පටන් ගත්තා. ස්වාමීන් වහන්සේලා දහනම, විසිනම, තිස්නම, පනස්නම ආදී වශයෙන් භාර අරගෙන ඉතාම හොඳින් දානය සකස් කරලා පූජා කළා. පිං ආනිසංස වශයෙන් බුදුරජාණන් වහන්සේ මේ විදියට දේශනා කළා.

යම් කෙනෙක් තමන් සතු යමක් දන් දෙනවා නම්, අනුන් සමාදන් කරවන්නේ නැතිනම්, ඒ අනුව ධනය ලැබෙනවා. හැබැයි පරිවාර සම්පත්තිය ලැබෙන්නේ නෑ. ඒ වගේම යම් කෙනෙක් තමන් දෙන්නේ නැතිව අනුන් සමාදන් කරවා දෙනවා නම්, ඒ අයට පිරිවර සැප සම්පත් ලැබෙනවා. හැබැයි ධන සම්පත්තිය ලැබෙන්නේ නෑ. යම් කෙනෙක් දන් දෙන්නේ නැතිනම්, අනුන් සමාදන් කරවන්නේත් නැතිනම් ඒ අයට ධන සම්පත්තිය හෝ පරිවාර සම්පත්තිය කියන දෙකම ලැබෙන්නේ නෑ. ඒ වගේම තමනුත් දන් දෙනවා නම් අය අයවත් සමාදන් කරවනවා නම් ඒ අය ධන සම්පත්තියත්, පිරිවර සම්පත්තියත් දෙකම ලබනවා. ඉතින් මේ විදියට අප තථාගතයන් වහන්සේ පැහැදිලි කරලා දුන්නා පින්වතුනි.

මේ පැහැදිලි කිරීමට පැහැදුණු එක් සැදැහැවත් උපාසකයෙක් තමන්ගේ ධනය යොදලා තමන් අය සම්මාදම් කරගෙන දානයක් දීමට පිළියෙළ කරගත්තා. මුළු නුවරම ඇවිදලා පිරිස දැනුවත් කරලා සම්මාදම් කරගනිමින් එක් සිටුතුමෙක් ළඟට ගියා. එතකොට ඒ සිටුවරයා කල්පනා කළා "මේ පුද්ගලයා තමන්ට පුළුවන් ප්‍රමාණයට දන් දෙන්නේ නැතිව සෝබා කරමින් ඇවිදිනවා" කියලා. මසුරු සිතින් අතැඟිලි තුඩ අගින් හාල්, මුං, තල, ගිතෙල්, පැණි, සකුරු ටිකක් දීලා යැව්වා. ඒ සිටුවරයා බළලකුගේ පාදයක් සේ අතැඟිලි තුඩ එකතු කොට දන් නිසා බිළාල පාදක කියලා තමයි හැඳින්වුණේ. ඊට පස්සේ මේ සිටුවරයා බලාගෙන හිටියේ අර සැදැහැවත්තා දුන් දේ ගැන දොස් පවසනවාද කියලා.

පින්වතුනි, මේ සැදැහැවත් පිරිස දානමය පින්කමෙන් පසුව සුළු වශයෙන් හෝ බොහෝ වශයෙන් දානයට උපකාර කළ සැමට ප්‍රශංසා කරලා පින් අනුමෝදන් කළා. ඒ ගැන අසාපු බිළාලපාදක සිටුවරයාට තේරුම් ගියා තමා හිතපු ආකාරය වැරදියි කියලා. තමන් ඉතා සුළුවෙන් දීම පිළිබඳව ලැජ්ජාවට පත්වුණා. බුදුරජාණන් වහන්සේ එය නිමිති කොට තමයි ඉහත සඳහන් උතුම් ගාථා රත්නය දේශනා කළේ. "පින පුංචියි", මට විපාක නොදෙයි, පිනට අවමන්



"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"

කරන්න හොඳ නැහැ. එක එක දිය බින්දුව වැටී කළය පිරෙන්නා වගේ ටික ටික හරි පින්කරන ඥානවන්තයා පින්වලින් පිරෙන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළාට පස්සේ ඒ සිටුවරයා සෝවාන් ඵලයට පත්වුණා.

ඉතින් පින්වතුනි, අපිට පින්කර ගන්න තිබෙන මේ උතුම් අවස්ථාවේ අපි පින් රැස්කර ගත යුතුයි. බුදුරජාණන් වහන්සේ නමක් කල්ප ගණනකින් පහළ වෙන්නේ. මනුෂ්‍ය ආත්ම භාවයක් ලැබෙන්නෙත් කල්ප ගණනකින්. ඉතින් අද අපිට ඒ අවස්ථා දෙකම ලැබිලා තිබෙනවා. භාග්‍යවතුන් වහන්සේ අපිට දේශනා කළා පින්කම් තුනක් පිළිබඳව. ඒ පින්කම් තුන තමයි දානමය, සීලමය හා භාවනාමය පින්කම්. අපේ බෞද්ධ ජනතාව මේ පිළිබඳව අවබෝධයකින් තොරව පින් කරගන්නේ නැතිව සංසාරේ පුදුම විදියට දුක් විඳිනවා. සමහරුන්ට කන්න දෙයක් නැහැ. අඳින්න වස්ත්‍රයක් නැහැ. ඉන්න තැනක් නෑ. අසාධ්‍ය හරියට නෑ. විරූපී විදියට ඉපදිලා. මිත්‍යා දෘෂ්ටිකව ඉපදිලා. මේ සේරටම හේතුව තමයි සංසාරේදී ටික ටික හරි රැස් කර තිබෙන්නේ පින් නොවෙයි, පාප කර්මයන්.

ඉතින් පින්වතුනි, අපි පළමුවෙන් ටික ටික දන් දෙන්න පුරුදු වෙන්න ඕන. අපිට ධර්මය පිළිබඳ අවබෝධයක් නැතිකම නිසා මේ වටිනා ජීවිතය ඔහේ ගෙවිලා යන්න දෙනවා. දන්නෙම නැතිව වයසට යනවා. කාලය ඉකුත් වෙලා යනවා. සමහරුන්ට පින් කරන්න හිතෙන්නේ වළපල්ලට යන්න ඔන්න මෙන්න තිබෙද්දී. එතකොට පංචේන්ද්‍රියන් පණ නැහැ. කල්පනාව නෑ. පින්වතුන් කව කෙනෙකු කරන පින්කමක් දැකලා හරි සතුටු වෙන්න පුළුවන් නම්, ඒත් පින් සිද්ධවෙනවා. කවුරු හරි සාංඝික දානයක් දෙනවා යැයි සිතමු. ඊට පස්සේ කියනවා මිතුරෙකුට "මම සාංඝික දානයක් දුන්නා" කියලා. එතකොට අර මිතුරා අවංකව ඒ ගැන සතුටු වෙලා "අනේ සාධු කොච්චර දෙයක්ද. මමත් ඒ පින අනුමෝදන් වෙනවා" කිව්වත් ලොකු පිනක් රැස්වෙනවා. ඇයි ඉතින් දස පුණ්‍ය ක්‍රියාවලින් එකක්නේ පින් අනුමෝදන් වීම. (පත්තානුමෝදනා)



ඔය ඕනෑම විදියට ඕනෑම පින්කමක් දැකලා සතුටු වුණොත් කෙනෙකුට කොපමණ පුණ්‍යස්කන්ධයක් එක ජීවිතයකදී රැස්වෙනවාද? ඒත් සමහරු කරන්නේ මොකක්ද? කවුරුන් හෝ කරන පිනටත් කමවිල් කරනවා. සතුටු වෙන්නේ නෑ. තරහ කනවා. අධෛර්යයට පත් කරනවා. අනුමෝදන් වෙන්නේ නෑ. එතකොට වෙන්නේ මොකක්ද? දන්නෙම නැතිව පව් රැස්වෙනවා. ඉතින් අපි නියම විදියට ධර්මය දැන ගැනීමෙන් අපේ ජීවිතවලට පුදුම යහපතක් උදාවෙනවා. ඒ වගේම ධර්මය නොදැන ගැනීමෙන් පුදුම අයහපතක් ඇතිවෙනවා.

දන් මලම් අපි කෙනෙකුට කෑම ටිකක් දුන්නොත් ආනිසංස ඔීයක් අපට ලැබෙනවා. නැමුයි සිත පහදවා ගෙන, ඒ කියන්නේ සිතේ සතුටකින් දෙන්න ඕන. ඒ වගේම ඕනෑම මනුෂ්‍යයකුට දානයක් දුන්නොත් ආනිසංස දහක් අපිට ලැබෙනවා. ඔය විදිහට අපිට පෞද්ගලික වශයෙන් දාන 14 ක් දෙන්න පුළුවන් බව බුදුරජාණන් වහන්සේ දක්ඛිණ විභංග සූත්‍රයේදී දේශනා කළා.

පෞද්ගලික වශයෙන් දෙන්න පුළුවන් ඉහළම දානය තමයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේට දෙන දානය. ඊළඟට උන්වහන්සේ දේශනා කළා මහා සංඝරත්නයට සාංඝික වශයෙන් දන් පිරිනමන්න පුළුවන් කියලා. එතකොට විශාල ආනිසංසයක් ලැබෙනවා. අපිට සාංඝික දානයක් දෙනකොට කොච්චර පින් කරගන්න පුළුවන්ද? දන් අපි මලම් දනක් සකස් කරන අය ඒ තුළින් පින් රැස්කර ගන්නවා. දන බෙදනකොට පින් රැස්වෙනවා. පිරිකර පූජා කරන කොට පින් රැස්වෙනවා. ඉතින් පළමුවෙන්ම තථාගත අර්හත් සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේට බුද්ධ පූජා තබනකොට පින් සිද්ධ වෙනවා. දනක් හැන්දක් බෙදුවත් පින් සිදුවෙනවා. සාදු දෝවනය කරනකොට පින් සිද්ධ වෙනවා. ඔය විදිහට බලනකොට කොපමණ පිනක් දානමය පින්කමකදී අපිට ලබාගන්න පුළුවන්ද? නැමුයි ඉතින් අපි ඒ පින කරගන්න දක්ෂ වෙන්න ඕන. ශ්‍රද්ධාවන්ත වෙන්න ඕන. ප්‍රඥාවන්ත වෙන්න ඕන.


අපිට සිල් ගැනීමෙනුත් විශාල පිනක් රැස්කර ගන්න පුළුවන්. අපි එක එක සිල් පදය ගානේවත් රකින්න උත්සාහ කරන්න ඕන. ඒ වගේම පොහොය දිනයක වරුවක්වත් (දවස බැගිනම්) අටසිල්, දසසිල් සමාදන් වෙන්න උත්සාහ කරන්න ඕන. එතකොට අපිට විශාල පිනක් රැස්කර ගන්න පුළුවන්.

ඒ වගේම අපිට පින් රැස්කර ගන්න තිබෙන ඉහළම මාර්ග තමයි භාවනා කිරීම. මලක් සිඹින මොහොතක් මෛත්‍රී භාවනා කළොත් රහතන් වහන්සේලා සිය නමකට දෙන දානයට වඩා, ලොව්තුරා බුදුරජාණන් වහන්සේට දෙන දානයට වඩා පින් සිද්ධ වෙනවා. අපගේ කාලය කොච්චර නිකරුණේ ගෙවිලා යනවද? අපි ඒ කාලයෙන් මිදක් භාවනාවට යොමු කරගත්තොත් මොනතරම් පිනක් අපේ ජීවිතවලට රැස්වෙනවාද? කාලය නිකරුණේ නාස්ති කරගන්නේ නැතිව භාවනාමය පින් පුළුවන් තරම් සිදුකරගන්න ඕන. අපිට විශාල වශයෙන් පින් උපදින මැඩමිලිවෙළ තමයි භාවනා කිරීම. ඉතින් අපි හරියට නුවණ මෙහෙයවලා කටයුතු කළොත් මේ පොසොන් පොහෝ දිනයේ සිට අපිට පින් කර ගන්න, විශාල වශයෙන් පින් රැස්කර ගන්න පුළුවන්.

ඒ වගේම පින්වතුනි, අපි පින් රැස්කරගන්න දක්ෂ වෙනවා වගේම පාපකර්මයන්ගෙන් මිදෙන්නත් පුරුදු වෙන්න ඕන. බින්දුව බින්දුව වැහි පොද වැටිලා කට ඇර තිබෙන හිස් කළය පිරෙනවා වගේ තමයි ටික ටික පව් අපේ ජීවිතවලට රැස් වෙනවා. ඒ නිසා අපි සිත, කය, වචනය මුල් වෙලා සිදුවෙන සියලුම පාප කර්මයන්ගෙන් මිදෙන්න මේ පොසොන් පොහෝ දිනයේ සිට අධිෂ්ඨාන කරගන්න ඕන. ඉතින් කල්ප ගණනකින් ලැබුණු මේ උතුම් දුර්ලභ අවස්ථාවෙන් අපි උපරිම ප්‍රයෝජන අරගෙන සංසාරික ජීවිතය සැපවත් කරගන්නටත්, ඒ වගේම සංසාර දුක නිමා කිරීමටත්, සුගතිගාමී වීමටත්, චතුරාර්ය සත්‍යය අවබෝධ කරගැනීමටත් අධිෂ්ඨාන කරගනිමු.

**පූජ්‍යපාද පොල්පිටිමූකලානේ පඤ්ඤාසිරි හිමි**

# පදමානවක ජාතකයෙන් හෙළිවන
# යළි යළිත් නොවිමසිය යුතු දෙය විමසීමේ ඵලවිපාකය



අනන්ත වූ බුදුගුණයන්ට නිධාන වූ තිලොවට තිලක වූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩසිටින සමයෙහි පා සලකුණු අසවලුන්ගේයි දැක්වීම මුල්කොට මෙම ජාතක කථාව දේශනා කොට වදාළ සේක. සැවැත්නුවර එක්තරා පියාණන් කෙනෙකුගේ පුතෙකු සත් වියට පැමිණි පසු යම් කෙනෙකුගේ පියවර සලකුණින් ගොසින් ඔහු සිටි තැන අඳුනාගැනීමේ නුවණ ඇත්තෙකු විය. එසේ හෙයින් ඔහුට පදමානවක කුමාරයා යනුවෙන් නම් තැබිණ.

පදමානවක කුමාරයාගේ පියාණන් තම පුතා පරීක්ෂා කරනු පිණිස වෙනත් ගෙයක සැඟවී සිටියේය. පුතණුවන් පැමිණ පියාගෙය විචාරා, නැතැ'යි කී විට, පියාණන් සිටි තැනට ඔහුගේ පියවර සලකුණ ඔස්සේ ගියේය. එසේ ගොස් පියාණන් සිටි තැන සොයා ගත්තේය. දෙවන අවස්ථාවෙහිත්, පුතා පරීක්ෂා කිරීම සඳහා පියාණෝ ගෙට ඇතුළුව පැළදොරින් අනික් නිවසකට ගොස් ඒ ගෙයි පිටුපස දොරින් පිටව ආපසු තමන්ගේ ගෙට පැමිණ විදියට බැස විදියෙන් පිටත ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ සිටියාහුය. පුතණුවන් නිවසට පැමිණ පියාණන් ගැන විචාරා, නොදුටු බව පැවසූමෙන් පැළදොරින් අනෙක් ගෙයට ගොස් එතැනින් යළි තම නිවසට පැමිණ විදියට පිවිස පියවර ඔස්සේ ජේතවනාරාමයට ගොස් පියා ළඟ සිටියේය. එවිට පියාණන් සර්වඥයන් වහන්සේට, ස්වාමීනි, මගේ පුත්‍රයාට සැඟවී මම මෙතැනට ආවෙමි. ඔහු මගේ පියවර සලකුණෙන් මා සොයාගෙන පැමිණ ඇත. ඔහුගේ නුවණ යහපත් බව හැඟෙයි. එවිට සර්වඥයන් වහන්සේ, මෙයි අතීත කතා ප්‍රවෘත්තිය මෙසේ ගෙනහැර දක්වා වදාළ සේක.

අතීතයේ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන කාලයෙහි රජුගේ අගමෙහෙසිය අනාචාරයේ වෙසෙමින් ව්‍යාජය කළාය. රජ්ජුරුවන් ඒ බව දැන විමසූ විට, මම එසේ නොකළෙමි'යි ඇය පැවසුවාය. එසමයෙහි ද නොව එබඳු අනාචාරයක් කළේ නම් අශ්වමුහුණක් ඇතිව යක්ෂණිව උපදින්නේ'යි බොරුවට දිවුරුවාය. ඇය දිවුරීමෙන් නොබෝ කලකට පසු මියගොස් අශ්වමුහුණක් ඇතිව, යක්ෂණිව ඉපිද වෙසමුණි රජ්ජුරුවන්ට දොළොස් අවුරුද්දක් පැන් ඇද දිගින් තිස්ගවුවක් හා පළලින් පස්ගවුවක් ඇති වනාන්තරයක මිනී කෑම පිණිස වරයක් ලෙස ලබා ගල්ගුහාවක වාසය කළාය.

එක් දිනෙක බ්‍රාහ්මණයෙක් තමාගේ පිරිවර සමගින් ගමනක් යන අතරතුර මේ වනයට පැමිණියේය. යකින්න, දුර එන බ්‍රාහ්මණයා දැක එතැනට පැමිණ තමන්ගේ කර ඉඳුවාගෙන ගුහාවට ගියාය. බ්‍රාහ්මණයාගේ ශරීර ස්පර්ශ ලැබ, ඔහු තම ස්වාමිපුරුෂයා කොට බත්මුලක් ආදී වූ දෙයින් සංග්‍රහ කොට තබා ගත්තාය. තමා මිනීමස් කැවාය. බ්‍රාහ්මණයා හා යක්ෂණිය මහත් සන්තෝෂයෙන් වාසය කළහ.

එකල්හි බෝධිසත්වයෝ බ්‍රාහ්මණයා නිසා යකින්නගේ කුසෙහි පිළිසිඳ, උපත ලබා වැඩිවියට පැමිණියෝය. යකින්න මස් කන්නට යන අතර තම පුතා හා ස්වාමියා ගල්ගුහාවෙහි සඟවා තබා යන්නෙමි'යි සිතා ගල් ලෑල්ලකින් වසා තබා ගොදුරු සොයා යන්නීය. එක් දිනක් බෝධිසත්වයෝ ගල්දොර ඉවත ලා පිළිලෙහි සිටියහ. යකින්න පැමිණ මේ ගල්ලෑල්ල ඉවත් කළේ කවුරුන්දැයි විමසුවාය. එවිට බ්‍රාහ්මණයා, ඔබගේ පුතණුවන් යැයි පැවසීය. යකින්න පුත්‍රස්නේහයෙන් කිසිවක් නොකියා සිටියාය. දවසක් බෝධිසත්වයෝ පියාණන්ට කියන්නාහු, "පියාණන් වහන්ස, ඔබගේ මුහුණත් මගේ මුහුණත් එක සමානය, මෑණියන්ගේ මුහුණුවර වෙනස්ය. එයට හේතුව කිමිදැ" යි විචාළේය. එවිට ඇය යකින්නියකැයි කී විට, පුතුයා, අපි එතට වාසය කරන්නේ කෙසේදැයි සිතා පියා කැමති කරවාගෙන ගල්ලෙන අතහැර ගියහ. යකින්න පැමිණ සැමියා හා පුතණුවන් නොදැක මගට ගොසින් දෙන්නා එක්ව අල්වාගෙන, ඇයි බමුණ කුමක් කළේදැයි විමසූයෙන්, මම නොවෙයි දරුවා යැයි බමුණා කීය. යකින්න පුත්‍රස්නේහය නිසා කිසිවක් නොකළාය. මේ අයුරින් තුන් වාරයක්ම මගට බැස ගිය අතර යකින්න ඔවුන් ආපසු කැඳවාගෙන ආවාය.

දිනක් බෝසතාණන් "මේ ලෙසින් ගැලවිය නොහැකියැයි සිතා මගේ මෑණියන් අයිතිව ඇගේ සීමාව ගැන දැනගනිමි'යි සිතා මෑණියන් සමඟ පුරහලයෙන් සිට, මෑණියනි, දෙමවුපියන් සන්තක ධනය නම් දරුවන්ටමය. එසේනම් ඔබ මිනී කන ගම්වල සීමාව කුමක්දැයි ඇසීය. අසවල් පර්වතය ඇතුළු තැනයැයි දැනගෙන එක් දවසක් ඔබ ගොදුරු සොයා ගිය විට පියා සමඟ පවනට බඳු වේගයෙන් යකින්නගේ සීමාව ඉක්මවා ගොස් ඇති බව යකින්න දුටුවාය. එවිට ඇය සැමියා හා පුතා අමතා, කුමන අපහසුවක් නිසා මා හැර දමා යන්නේ ද? ඔබගේ පියා නොදැක මට ජීවත් විය නොහැකිය. යකිනි මවගේ ඉම පසු කොට එගොඩ වූ පුතා, මෑණියන් වහන්ස, ඔබ යකින්නකි, අප මිනිසුන්ය. එකට වාසය කිරීම අපහසුය. එවිට යකින්න, පුතණුවෙනි, ඔබ හා පියා නොමැති වීමෙන් මගේ ජීවිතය නොතිබෙයි. ඇය එසේ කීවත් බෝධිසත්වයෝ, මෑණියන් වහන්ස, තුඹ යකින්නක, අපි මිනිසුන් වෙමු. එකට වාසය නොයෙදේ යැයි කියා නික්මුණහ.

එවිට යකින්නිය, පුත තොප පිහිටේ වාසය කරන විට නොයෙක්

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"

මේ ඉගෙනගත යුතුව ඇත. දොළොස් අවුරුද්දක් කල් සොරකමෙන් වී නමුත් සදලාංඡනයකින් සොරා අල්ලා ගන්නා නිමිත්ත කියන්නෙමි. චින්තාමාණික්‍යය මෙන් සොයාගන්නා වූ යහපත් විද්‍යා මන්ත්‍රයක් ඇත. ඉගෙනගෙන යන්නැයි කීවාය. එවිට බෝධිසත්වයෝ යහපතැයි කියා, වැඳ, මන්ත්‍රය ඉගෙනගෙන, මෑණියන් වහන්ස, වැඩිය මැනවැයි කියා බෝධිසත්වයන් පියා සමග නික්ම ගියේය. "පුතා තොප මා හැර යවුදැයි" කියා යකිනි මව ළය අතගසා විලාප දෙන විට ඇයගේ ළය පැලී මළාය. බෝසතුන් හා පියාණන් ගමෙන් මෙගොඩට විත්, ඇය ආදාහනය කර, හඬා වැළප ගියහ.

යක් දෙමවුපියෝ නොවැහෙති, යක්දරුවෝ වැහෙති. එසේ හෙයින් පියාණන් හා සමග බෝධිසත්වයන් බරණැස් නුවරට ගොස්, රජුගේ වාසල ළඟ සිට තමන් පැමිණි බව රජුට කියා යැවූහ. සොරාගේ පියවර සලකුණු අනුව ගොස් සොරකම් කරන්නා වූ තැනැත්තා හඳුනාගන්නා පඬිතයාවතයෝ ඔබ දැයි රජ්ජුරුවෝ විචාළහ. දරුව, තොප සොරෙකු අසුකර දෙන්නේදැයි විමසා, පා සලකුණෙන් අල්වා දෙමියි කී විට, මිනු දහසක පඩියට රජුට සේවය කරන්නැයි දන්වා සිටියේය.

එක් දිනක් රජුගේ පුරෝහිත බමුණා රජු අමතා, මොහු සොරකම් අසුකරමියි කියයි. සැබෑවක් ද, බොරුවක් දැයි නොදනිමු. එය පරීක්ෂා කරන්නට උවමනා යැයි කියා, රජු යහපතැයි කී විට, රජු හා පුරෝහිතයා මතුමහලට නැගී, භාණ්ඩ තිබූ ගබඩාවේ දොර හැර, ඉන් සම්පත් අරගෙන ඉණිමගකින් පාත බැස, රජගෙය වටා තුන්විටක් ඇවිද, ඉණිමග පවුරේ තබා ඉන් බැස අධිකරණ ශාලාවේ බොහෝ වේලාවක් සිට, දෙවනුව ඉණිමගින් ඇතුළට අවුත් මගුල් උයනේ පතළ ළඟට ගොස් තුන්විටක් ඇවිද, පතළ ඇතුළේ ගෙන ගිය සම්පත් සඟවා රජගෙට ගියහ. පසු දවසක භාණ්ඩාගාරයෙන් සොරකම් කළෝයැයි නුවර පුරා පතුරුවා බෝධිසත්වයන් කැඳවා සොරු අල්වා දෙන්නැයි කීවේය. බෝධිසත්වයෝ උඩුමහලට නැගී මන්ත්‍රය දූත් මෑණියන් වහන්සේට නමස්කාර කොට, රජතුමනි, මෙතැන සොරුන් දෙදෙනෙකි. අධිකරණ ශාලාවේ බැස් වේලා සිට, දෙවෙනිව එම ඉණිමගින් පතළට ගොසින් පතළ වටා තුන්විටක් ඇවිද, පතළට බැස දිය යට සඟවා තිබූ සම්පත් අරගෙන රජ්ජුරුවන්ට දුන්හ. එවිට සියදහස් ගණන් මිනිසුන්ගේ ඔල්වරසන් දී සතුටු වූහ.

එකල්හි රජු මේ සොරකම කළ අය අපට කියන්නැයි කී විට ස්වාමීනි, සම්පත් තිබූ පසු සොරුන්ගෙන් ඇති ප්‍රයෝජනය කිමිද? සොරකම් කළ අය මම දනිමි. එසේත් නම් කිව නොහැක්කෙමි. එය සොරකම් කළේ බොහෝ සම්පත් ඇති මිනිසෙකි. එවිට සොරා කවරෙක්දැයි කීමට නොහැකි ඇයිදැයි විමසූ විට, රජ්ජුරුවන් වහන්ස, අසවල් යැයි නම් කිව නොහැකි කාරණ ද ඇත. අතීතයේ බරණැස් නුවර පාටලී නම් විද්වතෙක් සිටියේය. ඒ විද්වතා ගඟින් එතෙර ගමනක් යන්න යැයි කියා යන විට ගඟට බසින ගමනේ ගඟේ වතුර බොහෝ සෙයින් නිසා විණාව තමන්ගේ බොටුවේ බැඳගෙන, අඹුව උරයෙහි ඉල්වාගෙන ගඟින් පීනන්නට පටන් ගත්හ. ගඟ මැදට යන විට දිය පහර සැඩ වී ඔසවා ගෙන සිටි අඹුව අතහැර දමා නොවට පීනා ගියේය. ගඟට වැටුණු බිරිඳ දියට වැටී සිටිය දී, සැමියා අමතා, ඔබ බොහෝ ගී දන්නෙහිය. ඉන් එක ගීයක් මා රැකෙන නියායෙන් උගන්වන්නැයි ඉල්ලා සිටියාය. එවිට විද්වතා දිය සෙවී මරණයට පත්විමට සිටින ඔබට කුමන ගීයක් උගන්වන්නේදැයි විමසීය. එසේ සියලු මිනිසුන්ට අභිවෘද්ධියක වූ දෙයක් නිසා සොරකම් කළ තැනැත්තා කිව නොහැකි බව පැවසීය.

එසේ කියද්දීත් සොරුන්ගේ නම් කියන්න යැයි කී විට, රජතුමනි, එසේ කීවොත් බොහෝ උපද්‍රව ඇතිවෙයි. රජ්ජුරුවන් වහන්ස, මේ නුවර එක් කුඹලෙක් වළකින් පස් කපා මැටි ගෙන පිටත්ව යන්නේ, එම මැටි ගත් වළ දවසක් පුරා වැසි වැස බිඳී ගියේය. එවිට කුඹලා, මට පිහිට වූ භූමිය නිසා මට භය පැමිණෙයි කීය. එබැවින් මේ සොරකම කළ තැනැත්තාගේ නම කිව නොහැකියැයි කීහ. නම කීමෙන් බොහෝ අලාභ සිදුවෙයි. ඔබ වහන්සේටත් සොරුන්ගේ නම් දැනෙයි.

මෙසේ කියද්දීත් රජතුමා සොරුන්ගේ නම් කියන්නට කියා භය කර සිටි කල්හි, වෙනත් කාරණයක් දක්වා, රජතුමනි, මෙම නුවර පුරුෂයෙකුගේ ගෙයි සම්පත් දොරට දෙකින් සිට අනෙක් පුරුෂයා ගේ ගිනිගත් පුරුෂයා තමාගේ ගෙයි සම්පත් දොරට දෙකින් සිට අනෙක් පුරුෂයෙකු කැඳවා තමාගේ සම්පත් ඇද පිටත ලා පියවයි කියන්නේ යහපතැයි සහයට ගෙන පිටතට සම්පත් අදිනා කල දොර වැසී ගිය හෙයින්, දොරකඩ සොයාගත නොහෙන පරිදි දුම පැතිර ගියෙන්, දොර සොයාගත නොහැකි වූ තැනැත්තා සියලු ආහාරයන් ද පිපිහෙන්නා වූ ගිනි සැලයේ ගිනි නිවාරණය වන්නා වූ ද සියලු කුණප දවා අතුරුදන් කරන්නා වූ ගින්නෙන් මෙසේ වූ භය ඇති කරවිය. රජ්ජුරුවන් වහන්ස, සොරකම සැලසුවේ සියලු සතුන්ට ප්‍රතිෂ්ඨාව වූ තැනකිනි. මා අඹුවට අසවලුයැයි කිව යුතුද? එසේ කියද්දීත් රජ්ජුරුවෝ මට වංචා කොට කීමෙන් ඵලයක් නැත. සොරු අසවලා යැයි කිව මැනවැයි කීහ.

බෝධිසත්වයෝ නැවත කාරණයක් දක්වා රජ්ජුරුවන් වහන්ස, පුරුෂයෙකු වාත, වාතාදි රුදාවෙන් පීඩිතව පෙළෙමින් සිට කියන්නේ, සියලු සත්වයන්ට දාහ කරන අවස්ථාවෙහි දාහ සංසිඳුවන්නා වූ මට ආයාස පමුණුවන්නාහුය. එමෙන් සියලු මිනිසුන්ට වැඩදායක කෙනෙකුන් කළ සොරකමය. එසේ හෙයින් කිව නොහැකිය. මේ විස්තරයෙන් මට ප්‍රයෝජනයක් නැත. සොරුන් අසවලා යැයි කියන්නැයි යළි යළිත් ඉල්ලීය.

බෝධිසත්වයෝ නැවත වෙනත් කාරණයක් දක්වා, රජ්ජුරුවන් වහන්ස, මෙම නුවර එක් පුරුෂයෙක් බත් අජීර්ණය කොට කා දිරවා ගත නොහැකිව කියන්නේ, සියලු මිනිසුන් ජීවිත ආරක්ෂා වන බත් කා දිරවා ගත නොහී මාගේ ප්‍රාණය යන්නේ යැයි ඇඬීය. එමෙන් සියලු මිනිසුන්ට ප්‍රතිෂ්ඨාදායක තැනකින්ම කළ සොරකමය. එහෙයින් කිව නොහැක්කේය කියද්දීත් සොරාගේ නම කියන්නැයි රජු කීහ.

නැවතත් බෝධිසත්වයෝ කාරණයක් දක්වා, රජතුමනි, හිමාල වනයෙහි එක් මහා වෘක්ෂයක බොහෝ පක්ෂීහු වාසය කරන්නාහ. එම වෘක්ෂයේ අතු දෙකක් ගැටී ගිනි හටගන්නේය. එවිට ඒ පක්ෂීන්ට නායක වූ පක්ෂියා කියන්නේ, තොපට පළමු ප්‍රතිෂ්ඨාව වූ වෘක්ෂයෙන්ම ගිනිවැදී වෘක්ෂය දවන්නේය. තොප දන්නා යම් අතකට ගොස් ජීවත් වන්නැයි කී කල්හි පක්ෂියෝ ඒ ඒ අත පියඹා ගියහ. එමෙන් රජතුමනි, සියලු මිනිසුන්ට ප්‍රතිෂ්ඨා කෙනෙකුන් කළ සොරකමක් හෙයින් කිව නොහැක්කේ යැයි කීහ. රජු නැවතත් සොරු අසවලා යැයි කියන්නට බල කළහ.

බෝධිසත්වයෝ නැවතත්, රජතුමනි, මේ නුවර බොහෝ කිඹුලන් ගහන වූ ගඟක් සමීපයේ ගමක එක්තරා පුරුෂයෙක් තමාගේ කසාවැන්දුම් වූ මව රකින්නේය. බොහෝ දුක් විඳ පෝෂණය කරන්නාහ. එසේ හෙයින් මොහුට බිරිඳක් ගෙනෙමියි සිතා, මව, එක්තරා ස්ත්‍රියක් සරණපාවා දුන්නාය. ඒ ස්ත්‍රිය පුරුෂයාට දරුවන් වදා, ඒ ගෙට වැදිලහ ස්ත්‍රිය වූහ. ඒ ස්ත්‍රිය තම නැන්දාට කණස්සලුව බොහෝ නුගුණ කියන්නී, නුඹගේ මෑණියන්ද් මේ ගෙයි ඉන්නේ නම් මා ගෙයි ඉන්නේ නැතැයි කීවාය. ඒ පුරුෂයා එසේ නම් කුමක් කරම්දැයි කී විට, කිඹුල්නු සිටින ගඟට දමන්නැයි කීවාය. තොපගේ මෑණියෝත්, අපගේ මෑණියෝත් එක තැන සැතපෙති. එසේ හෙයින් ඇඳ සලකුණට වැලක් බැඳවයි කීහ. යහපතැයි කියා නැන්දා වැද හොත් තැන වැලක් බැඳ අවුත් සැමියාට කීහ. ඒ පුරුෂයා මිනිසුන් නිදනා තුරු නිදාගන්නැයි කියා බිරිඳ අස්වසා, ඇය ද නිදි ගන්වා, මධ්‍යම රාත්‍රී වේලෙහි තමාගේ මෑණියන්ගේ ඇඳෙහි බැඳපු ලණුව, බිරිඳගේ මෑණියන් නිදනා ඇඳෙහි බැඳ, අඹුව පුබුදුවාගෙන ගොසින් දමමියි කියා, ලණුව අල්වාගෙන ගොස් ඇඳ ගඟට දැමූහ. මෑණියෝ දැමූ පසු කිඹුල්නු කා දමන ලදී.

පසුදා ස්ත්‍රියගේ මෑණියන් නැතිව, පුරුෂයාගේ මෑණියන් දැක, ඔහේ මෑණියන් දමා තොපගේ මෑණියන් සිටින්නේ යැයි කියා, උනුත් මරන්න යැයි කී විට කෙසේ මරන්නේදැයි ඇසීය. අඹු සොහොනට දමන්නැයි කී විට මෑණියෝ නිදන කලට මධ්‍යම රාත්‍රියේ දෙදෙන ඇඳ ඔසවා ගෙන අමුසොහොනෙහි තබා, පුරුෂයා තොප ගොසින් ගිනිගේන්නැයි අඹුවට කීවේය. අඹුව තනිව යන්න බැරිබව කී විට දෙදෙනාම ගියහුය. එහි පුළුන ඇඟ වැදී මෑණියන් අවදි වූවාය. අමුසොහොනක සිටින බව දැන, මා මරන්නට කළ උපායක්දැයි සිතා එතැන තිබූ මිනියක් ඔසවා ඇඳෙහි තබා ඉණකඩකින් වසා, සොරුන් සොරකම් කොට අවුත් වස්තු තැබූ ගල්ලෙනකට ගියාය. දෙමල්ලෝ ගිනිමෙලවුත් මිනිය දවා ගෙට ගියහ.


සොරුන් තමන් වස්තු තැබූ ගල්ලෙනට පැමිණ එහි සිටින්නේ යකිනියැයි සිතා, යකැදුරෙක් ගෙන්වා ගත්හ. යකැදුරා ගල්ලෙන සමීපයට ආ කල්හි මම යකෙකු නොවෙමි. තොප සේම මිනිසෙක් වෙමි. එය අදහන්නේ නැතැයි කී විට, තොප මා හා දිවෙන් දිව ගැවෙන් විනා තැන්නම් සැක ඇත්තෙමියි කී විට, යකැදුරාත් ඒ තියාවට පැහැදී දිව දික්කළේය. මෑණියෝ ඔහුගේ දිව වැහැගත්තාය.

තමන් කටට දිවෙන් කැබැල්ලක් ගන්නාය. එවිට යකැලුවා භයෙන් දිව අඩුත් යතින්න නියාව කැමැමියි. එය ඇසූ සොරු ද දිවූහ. මැහැල්ල ගල්ලෙන තිබූ රත්‍රං කරලාගෙන යහපත් පිළි හැඳ තමාගේ පුත්‍රයාගේ ගෙට ගියාය.

දියණිය දිවගෙන අවුත් වැඳ ඇයි නැන්දනියනි, තුඹ දවාලවෙම්, කෙසේ ආවේදැයි විචාළාය. මැණියන් කියන්නේ, අග්‍රිසොහොනෙහි දැවූවත් මෙසේ මේ ගෙට එන්නේ යැයි කීවාය. එබසට ලේලිය තමන්ගේ සැමියාට කියන්නේ මාත් එසේම සැරසීගෙන එන නියාවෙන් එම අග්‍රිසොහොනට දමාපුව මැනවැයි කී විට, යහපතැයි කියා තමාගේ අඹුව ගෙන ගොස් අග්‍රිසොහොනේ දවන ලදී. පසු දින තමන්ගේ මැණියන් ආ වේලාවට නොඑන හෙයින් මැණියනි මගේ බිරිඳ නොඑන්නට කාරණා කිමද? එගේ තුඹ මේ වේලෙහි ඇයේ වේද? අද නොඑන්නට කාරණා කිමදැයි විචාළේය. මැණියන් පුතණුවනි, දවාපු මිනිසුන් ගෙට එන්දැයි ඇසුවාය. මම වඩා වර්ධනය කොට තිබගේ වෙන්ෆවර්යය බලමියි සිතා තොපට බිරින්දෑ කෙනෙක් ගෙනැවිත් දුන්නෙමි. තොපගේ බිරින්දෑගේ බස් අසා, මා මරන්නට උත්සාහ කළා වේදැයි කියා කීවාය. එමෙන්ම ප්‍රතිඥාව ජරාතයාගින්ම මේ සොරකම් පැමිණෙන්ට උවමනා යැයි සිත.

එවිට රජු මෙසේ සතරා කීමෙන් අපට නොදැනෙයි. සොරකම් කළෝ අසවලාදැයි කියව. නොකීවොත් තෙපි සොරකම් කළෝයැයි කියමි. එවිට බෝධිසත්වයෝ එසේ වී නම් මගේ වරද නැතැයි නුවර වාසීන්ට දොස් ගන්නා කියන්නාහු, අසව. සොරකම් කළෝ රජ්ජුරුවන් හා පුරෝහිතයාය. තමා සොරකම් කොට අනුන් සොරු කරති'යි කීහ. එවිට එය අසා සිටි සේනාව නැට කැබිලිතිවලින් බැගින් ගසා රජ්ජුරුවනුත් පුරෝහිතයාත් ජීවිතක්ෂයට පමුණුවා වදාළහයි වදාළ ඔව මේ පදකුසලමාණව ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි බෝධිසත්වයන්ගේ පියාණෝ නම් සුද්ධෝදන රජ්ජුරුවෝය. මැණියෝ නම් මහාමායා දේවියයි. සොරකම් අල්ලු බෝධිසත්වයෝ නම් බුදුරදුන්මය.

**ජේ. මිගහකුඹුර**





# පොළොන්නරු ගල් විහාරයේ හිටි පිළිමයෙන් නිරූපණය වන්නේ කුමක්ද?

## බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත් හැරීමේ අවස්ථාවද?

ඓතිහාසික පොළොන්නරු රාජධානි සමයේ ඉදිවූ වෙහෙර විහාර අතරින් ගල් විහාර සංකීර්ණයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. පැරණි ශ්‍රී ලාංකීය කලාකරුවන්ගේ ප්‍රතිභාපූර්ණ කලා කෞශල්‍යය, අනුරාධපුර යුගයේදී ඉදිවූ කලා නිර්මාණ සමග සැසඳීමේදී ගල් විහාරයේ ප්‍රතිමා විශේෂයෙන්ම ඊටම ආවේණික වූ ලේඛිකත්වය පිළිබිඹු වන ආකාරයකින් නිර්මාණය වී තිබීම එයට ප්‍රධාන හේතුවයි.

ඓතිහාසික මූලාශ්‍ර අනුව ක්‍රි.ව. 12 වැනි සියවසේදී රාජ්‍ය පදප්‍රාප්ත වූ පොළොන්නරු රාජධානියේ ශ්‍රේෂ්ඨතම රජු ලෙස විරුදාවලී ලත් පළමුවන පරාක්‍රමබාහු රජු දවස මෙම විහාරය ඉදිකර ඇත. තෝරාගත් හුදෙකලා ගල් පර්වතයක බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා කිහිපයක් ප්‍රතිශේෂ අරමුණක් ඉටුකර ගැනීම සඳහා නැටයම් කිරීම මෙහි තේමාව වන්නට ඇත.

එහි මුලින්ම දක්නට ඇති ප්‍රතිමාව සම්බුද්ධත්වය නිරූපණය කරන අතර විද්‍යාධර ගුහාවේ වැඩ සිටින ප්‍රතිමාව තුළින් පන්සාලිස් වසක් පුරා දිව්‍ය මනුෂ්‍ය ඇතුළු සියලු සත්වයන් වෙත මහා කරුණාවෙන් පිළිසළ උදාර සේවය නිරූපණය වෙයි. මෙම ගල් ලෙන තුළ ගෙබ්ව ඇති සිතුවම්වලින් ඒ බව තහවුරු වේ.

ඉන්පසුව ඇත්තේ පොළොන්නරු ගල් විහාර සෙල් ලිපියයි. මෙයින් අවධාරණය වන්නේ භික්ෂූන් වහන්සේලාගේ විනයානුකූල හැසිරීමෙන්, සංඝ සාමාජිකයන් ඇති වටිනාකමය.

ගල්විහාර පුවරු ලිපියට පසුව ඇත්තේ හිටි පිළිමයයි. උගතුන් අතර වඩාත් මතභේදයට තුඩු දුන් පිළිමය වන්නේද එයයි. අවසාන වශයෙන් නිර්මාණය කර ඇත්තේ සම්බුද්ධ පරිනිර්වාණය පිළිබිඹු කෙරෙන පිළිම වහන්සේයි.

සමස්ත විහාර සංකීර්ණයම එක්වර අධ්‍යයනය කිරීමේදී සම්බුද්ධත්වයේ සිට පරිනිර්වාණය දක්වා මෙන් ගන්නා බුද්ධ චරිතය මේ මගින් නිරූපණය කරයි. මෙම නිර්මාණයේ තේමාව කෙසේ වෙතත් කාලීන අවශ්‍යතාවක් වූ සංඝ සාමාජිය ආරක්ෂා කිරීමත් ශාසන ශෝධනයෙන් පසු පවිත්‍ර මහා විහාර සම්ප්‍රදාය ආරක්ෂා කිරීම තුළින් පළින්

“[illegible] පිණිස වන දරුවෝත් නැත. [illegible] නැත. [illegible] නැත. [illegible]”


පිරිසිදු ථෙරවාද සම්ප්‍රදාය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමත් අරමුණක් වන්නට ඇත.

පොළොන්නරු රාජධානිය විධාන් ශක්තිමත් කර රට එක්සේසත් කළ පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා විසින් දිඹුලාගල මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ උපදෙස් පරිදි, විදේශ ආක්‍රමණයන්, දේශපාලන අස්ථාවරත්වයන් නිසා පරිහානියට පත් බෞද්ධ ආගමික සම්ප්‍රදාය යළි නගා සිටුවීමට කටයුතු කරන ලදී. ඒ සඳහා ශාසන සංශෝධනයක අවශ්‍යතාව දැඩි ලෙස දැනෙන්නට විය.

ශාසන සංශෝධනයේදී ගල්විහාර පුවරු ලිපියේ සඳහන් සංඝ සාමග්‍රිය සහ විනයානුකූල පැවැත්ම ස්ථාපිත කිරීමේ බොහෝ කරුණු මහා පරිනිබ්බාන සූත්‍රයේද සඳහන් වේ. සංඝ සාමග්‍රිය සහ විනයානුකූල පැවැත්ම ස්ථාපිත වනතුරු සම්බුද්ධ පරිනිර්වාණය සිදු නොවන බව පිරිනිවීමට සුදුසු කාලය එළඹී ඇතැයි මාරයා කළ ප්‍රකාශයට බුදුරජුන් දුන් පිළිතුරින් පැහැදිලි වේ. එහි අන්තර්ගත වූ අපරිහානීය ධර්ම කරුණු මෙන්ම ශාසනයෙහි චිර පැවැත්ම සඳහා හේතුවන කරුණු ගල්විහාර පුවරු ලිපියේ අන්තර්ගතයට සෘජුවම හෝ වක්‍රව බලපාන්නට ඇත.

එසේනම් ශාසනයේ චිර පැවැත්ම සඳහා එහි භාරදූර වගකීම පැවරෙන භාවනා භික්ෂූන්ට තම ශාසනික කාර්යභාරය කුමක් විය යුතුද යන්නත්, ශාස්තෘන් වහන්සේ කෙරෙහි ධර්ම ගෞරවය දක්වනු වස් තථාගතයන් වහන්සේ ආයු සංස්කාරය හැරීමේ තීරණාත්මක මොහොතත්, තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය මොහොතත්, නිරූපණය කරන්නට උත්සාහ ගන්නට ඇත.

පුවරු ලිපියෙන් පසු නිමවා ඇති හිටි පිළිමය (අඩි 22 අඟල් 9 උසැති) පද්මාසනයක් මත වැඩ සිටින ප්‍රතිමාවේ විශේෂත්වය නම් දෙඅත් පපුව මත තබාගෙන තරකිත ශෝකී ස්වරූපයෙන් නිරූපණය වීමයි. බුදුන් වහන්සේ කිසි දෙයකටවත් අනම්මිත වන හෙයින්,



එයින් නිරූපණය වන්නේ ශෝකී ස්වරූපයක්ද යන්න ප්‍රශ්නාර්ථයකි.

මේ නිසාම සම්බුද්ධ පරිනිර්වාණය නිසා ශෝකී භාවයෙන් සිටින ආනන්ද හිමියන්ගේ පිළිරුව එය යැයි මුලින් සඳහන් වී තිබුණද ඒ මතය සාහිත්‍යික ලෙස කර හිටි පිළිමය තුළින් බුද්ධ ප්‍රතිමාවම නිර්මාණය වී ඇති බවට එකඟතාව පළකර ඇත.

එහෙත් පිළිමයේ ඇති විශේෂිත ඉරියව් නිසාම එය බුද්ධ චරිතයේ කවර අවස්ථාවක් නිරූපණය වේද යන්න පිළිබඳව ඒකමතික අදහසක් නොමැත. මහාචාර්ය පරණවිතාන ඇතුළු විද්වත් එම ප්‍රතිමාවෙන් පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව නිරූපණය වන බව සඳහන් කර ඇත. තවත් අදහසක් වන්නේ බුද්ධත්වයෙන් දෙවෙනි සතියේ අනිමිස ලෝචන පූජාව නිරූපණය කරන බවයි. විහාර නිර්මාණය අධ්‍යයනය කිරීමේදී හදිසියේ එවන් පිළිමයක් නිර්මාණය වීමට පැහැදිලි හේතුවක් නොමැත.

ශාසන සංශෝධනයෙන් පසු ශාසනයට පිවිසි භාවනා භික්ෂූන් වහන්සේලාට ධර්ම සංවේගය පහළ කරවනු වස් ශාස්තෘන් වහන්සේ ආයු සංස්කාරය හැරීමේ මොහොත මෙමගින් නිර්මාණය වන්නට ඇත.

මහා පරිනිර්වාණ සූත්‍රයේ සඳහන් පරිදි මාරයාගේ නිරන්තර ඇවිටිලි මත චාපාල චෛත්‍යස්ථානයේදී ආයු සංස්කාරය හැරීමට තීරණය කළ පසු ඇතිවූ සිද්ධි මාලාව පහත දක්වේ.

මෙහිදී මාරයා වෙත "නචිරං මාරපාප අචිරංයෙව තථාගතස්ස පරිනිබ්බායිස්සතීති" තුන් මාසයක් ඇවෑමෙන් තථාගතයන් වහන්සේ පිරිනිවන් පා වදාරන්නේ යැයි ප්‍රකාශ විය.

"අථඛො භගවා චාපාලෙ චෙතියෙ සතො සම්පජානො ආයු සංඛාරං ඔස්සජි" සිහියෙන් යුක්තව නුවණින් පිරිසිඳ දැනුම් ආයු සංස්කාරය හැර වදළ සේක.

"ඔස්සට්ඨෙව භගවතා ආයුසංඛාරෙ මහාභූමිචාලො අහොසි. භිංසනකො ලොමහංසො දෙවදුන්දුභියො ච ඵලිංසු" භාග්‍යවතුන් වහන්සේ විසින් ආයුසංස්කාරය හැර වදළ කල්හි මහත් වූ පෘථිවි චලනයක් වූයේය. දිව්‍ය භේරිනාද පලිත වූවාහුය.


දෙඅත් පපුව මත තබාගෙන අතීත සංසාර ගමන ආවර්ජනය කරමින් සිහි නුවණින් යුක්තව නුවණින් පිරිසිඳ දැන ආයුසංස්කාරය හැර වදාරණ මොහොත මෙහි නිරූපණය කරයි. දැඩි අධිෂ්ඨානයන්, ආවර්ජනීය ස්වරූපයන්, තීරණාත්මක මොහොතක දකිය හැකි සියලු දේහ ලක්ෂණත් නිරූපණය වන පරිදි කලාකරුවා මෙම නිර්මාණය කරන්නට ඇත. පරිණත කලාකරුවකු වෙතින් නිමවූ ද්‍රවිඩලතා ගනයේ ප්‍රතිමාවක් ලෙස මෙම පිළිමය නම් කළ හැකිය.

මෙය සනාථ කිරීමට ඇති පැහැදිලි සාධකයක් වන්නේ මහ පොළොව කම්පා වූ ආකාරය නිරූපණය කිරීමට හිටි පිළිම වහන්සේ මුහුණ දී ඇති විශාල ගල් තලාව මත දෙපස කළ ගල් පර්වත දෙකක් දිස්වන්නට සලසා තිබීමයි. එසේ නොවන්නට අනියම විශාල වූ දෙකට වූ ගල් පර්වත දෙකක් පිළිරුව ඉදිරියේ දිස්වන්නට සැලැස්වීමට ඇති හේතුවක්ද දක්නට නොමැත. එසේම හිටි පිළිමයට දකුණු පසින් ඇති ගල් පර්වතයේද දෙදරා ගිය භාවිත ස්වරූපය නිරූපණය වීමෙන් ඒ බව සනාථ වේ.

ඉන් අනතුරුව ඇත්තේ තෙමසක් ඇවෑමෙන් පරිනිර්වාණයට පත් බුද්ධ ශරීරයයි. තම ශාස්තෘන් වහන්සේගේ අවසන් මොහොත මේ ලෙස නිරූපණය කරමින් ධර්ම සංවේගය දනවනු වස් නිමවූ මෙම විහාර සංකීර්ණය අනුරාධපුර යුගයේ පරිහානියට පත් මහා විහාර සම්ප්‍රදාය යළිත් නොසිරිනෙන ලෙසට ශ්‍රී ලංකාද්වීපයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම සංකේතවත් කරයි.

**ආචාර්ය රඹුක්වෙල ඥානසීහ හිමි**
**සිංගප්පූරුවේ සමාධි විහාරය,**
**මහනුවර මට්ටාරක්ෂගෙන සමාධි සංස්කෘතික කේන්ද්‍රය,**
**අනුරාධපුර කලුන්කොටුව සමාධි මහා විහාරය, නිර්මාතෘ.**

"විහාර අනුහිමේ දෙස් නොයන්නා වූ, අනුන් හෙළා කලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙති. ඔහු රහත් වීමෙන් දුරස්ය."



# මහා විහාර සංඝ පරපුරෙන් සංරක්ෂණය වූ බෞද්ධ අධ්‍යාපන ක්‍රම

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීමෙන් ආරම්භ වූ අනුරාධපුර මහා විහාරය, ථූපාරාමය, මිහින්තලය, රුවන්වැලිසෑය, මිරිසවැටිය, ශ්‍රී මහා බෝධිය වැනි සිද්ධස්ථාන ආශ්‍රය, නිශ්‍රය කරගෙන මහා සංඝරත්නය මහා විහාර සඟ පරපුර නමින් බෞද්ධ ඉතිහාසයේ සටහන් වන්නේය. ක්‍රමයෙන් මහා විහාරය පෙරදිග ආගමික, සංස්කෘතික ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් බවට පත්විය.

ලෝකයේ සෑම විෂයක්ම ආරම්භ වී පෝෂණය වීමට විචක්ෂණ බුද්ධියෙන් ප්‍රඥාවත් පුද්ගල සමූහයක් සිටිය යුතු අතර එය සමාජගත වීමට කේන්ද්‍රස්ථානයක් තිබිය යුතු වන්නේය. අනුරාධපුර රාජධානියේ ශ්‍රී විභූතිය මද කෙදවත් වීමට මහා විහාරය මූලික වූ වග පැහැදිලි වන්නේය. දේවානම්පියතිස්ස රජතුමා රන් නඟුලින් මහාවිහාර සීමාවන් සලකුණු කළ ආකාරයත්, මිහිඳු මහරහතන් වහන්සේ අනුමත කළ අකාරයත් මහාවංශයේ විස්තර වන්නේය.

මිහිඳු මහරහතන් වහන්සේ සවස් වේලාවක සැතපීයට වඩින්නට සුදුසුම වූ බිම රජතුමා නන්දන වනයෙහි පිහිය හැකි බව සැල කළත් එය නගරයට ඉතා සමීප බව ප්‍රකාශ කළ හෙයින් මහා මේඝ වනය රන් කෙණ්ඩියෙන් අත පැන් වත්කොට සංඝරත්නයට පූජා කළහ. ක්‍රමයෙන් පසුකාලීනව පිරිවෙන, උපෝසථාගාරය, උපට්ඨානශාලා, අග්ගිසාලා උද්‍යාන, උදකයාන සාලා ආදී නමින් භික්ෂු ජීවිතයට අත්‍යවශ්‍ය විහාරාංග සකස් වූයේ මහා විහාර පරිශ්‍රයේය.

දෙවන පැතිස් රජු විසින් කොළොම් තොට ඉවුරෙහි නගරයට දකුණින් පිහිටි මෙම මහාමේඝ වනය තුළ පිහිටු සඟරුවන මහා විහාරය නමින් ලෝකප්‍රකට විය. ක්‍රමයෙන් පැවිදි සිරිත් වශයෙන් හා උන්වහන්සේලාගේ ජීවන සුවපහසුව සඳහා ප්‍රධාන වශයෙන් පිරිවෙන ඇතුළු ගොඩනැගිලි දියුණු වන්නට විය.

ග්‍රන්ථධුර හා විදර්ශනාධුර දෙකින්ම සම්පූර්ණ වූ භික්ෂු පරපුරක් ඇතිවීමෙහිලා මහා විහාරය ක්‍රියාශීලී වූ වග මහාවංශාදී ග්‍රන්ථවලින් පැහැදිලි වන්නේය. බුදු සසුනේ චිරාස්තිත භාවය ප්‍රකට වීමට නම් ප්‍රතිපත්ති, ප්‍රතිවේධ, පර්යාප්ති යන ත්‍රිවිධාංගම පැවතිය යුතුය. මේ නිසා මහා විහාර භික්ෂු පරපුර ධර්මධර, විනයධර ප්‍රතිපත්ති මූලිකව ක්‍රියා කොට කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් සක්කෝ උජූ ආදී නමින් දක්වූ ශ්‍රමණ ජීවිතය ප්‍රගුණ කරන බෞද්ධ අධ්‍යාපනයක් ආරක්ෂා පෝෂණය කළහ.

ක්‍රි.ව. 5 වැනි සියවස වනවිට අනුරාධපුර රාජධානිය ආර්ථික, සාමාජීය, ආගමික, සංස්කෘතික වශයෙන් ලොව අසහාය අභිමානවත් නගරවරයක් ලෙස දියුණු වූයේ මහා විහාරයේ පැවති අධ්‍යාපන ක්‍රමවේදයන් නිසාය. එකල පැවති අධ්‍යාපන ක්‍රම හා විෂයන් පිළිබඳ දැනීමක් ලබාගැනීමට මූලාශ්‍ර කීපයක් උපයෝගී වන්නේය.

1. වංශ කතා, 2. අටුවා ග්‍රන්ථ,
3. ශිලා ලේඛන, 4. සාහිත්‍ය ග්‍රන්ථ

මෙම මූලාශ්‍ර අනුව අනුරාධපුර මහා විහාරය කේන්ද්‍ර කරගෙන විහාරාරාමයන්හි ඉගැන්වූ විෂයන්

1. ත්‍රිපිටක ධර්මය, 2. භාෂා ශාස්ත්‍රයන්,
3. ආයුර්වේදය, 4. නක්ෂත්‍රය

මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලාංකික ජනතාවට හඳුන්වා දුන් ථෙරවාදී බුදු දහම හෙළ බසට පරිවර්තනය කොට අටුවා ටීකා සහිතව මහා විහාර ග්‍රන්ථාගාර පුස්තකාලයේ පැවතීම වූ කලී මිහිතල අභිමානවත් ඥාන වස්තුව වුවද, මහා විහාරය විනාශ කිරීම නිසා එය ලොවට අහිමි විය. මහා විහාර භික්ෂූන් විසින් ආරක්ෂා පෝෂණය කළ ත්‍රිපිටක ධර්මය ප්‍රවේශනෝත්මකව පරිශීලනය කරන්නට දෙස් විදෙස් උගතුන් පැමිණීම සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියට මූලාධාර විය.

භාරතයේ පැවැති බ්‍රාහ්මණ අධ්‍යාපන ක්‍රමයේ පරතෙරට පැමිණි බුද්ධඝෝෂ, ධම්මපාල වැනි ප්‍රවීණ ආචාර්යයන් වහන්සේලා අනුරාධපුර මහාවිහාරයට ඇයත් මහා ග්‍රන්ථාගාරයේ නැවතී එකල පැවති හෙළටුවා පාලි භාෂාවට පරිවර්තනය කළ වග ලංකා සම්බුද්ධ ශාසනය පිළිබඳ ශ්‍රේෂ්ඨතම ප්‍රවෘත්තිය වන්නේය. මහාවිහාර භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටක ධර්මය සමකාලීන සිංහල බසට පරිවර්තනය කිරීම පමණක් නොව ටීකා, ටිප්පනී අර්ථවර්ණනා ආදී වශයෙන් විස්තර කොට ඒවා ග්‍රන්ථගත කිරීමද උන්වහන්සේලාගේ විචක්ෂණ බුද්ධි විශාරද භාවය ප්‍රකට කෙරෙන්නේය.

අනුරාධපුර මහා විහාරය කේන්ද්‍ර කරගෙන ව්‍යාප්ත වූ බෞද්ධ අධ්‍යාපනය ජාතික අධ්‍යාපනයක් වශයෙන් සමස්ත ජනතාවගේ 'ම අවශ්‍යතා සපුරන අධ්‍යාපන ක්‍රමවේදයක් වූ බවට ඓතිහාසික තොරතුරුවලින් ප්‍රකට වන අතර පැවිදි ජීවිතය අර්ථවත් කරගැනීම සඳහා පාලි භාෂාව මාධ්‍ය කරගෙන බුද්ධාගම, ඉතිහාසය, සමයාන්තර දර්ශන ආදී විෂයන්ද, රජවරුන්, ඇමති ඇමැතිවරුන් සඳහා සිංහල භාෂාව මාධ්‍ය කරගෙන දේශපාලනය, අර්ථ ශාස්ත්‍රය ආදී විෂයන්ද, එමෙන්ම පොදු ජනතාවට අවශ්‍ය වෙළෙඳාම, කෘෂිකර්මාන්තය, ගණිත, මිනින්දෝරු විෂයන් ගැඹුරෙන් හා විචාරශීලීව අධ්‍යයනය කිරීමට පහසුකම් පැවති වග පෙනී යන්නේය.


**පූජ්‍ය අඹුණුපුර පියරතන හිමි**

# සදහම් ප්‍රහේලිකා අංක - 86

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ත්‍යාගයක් තිළිණ කෙරේ.. දුරකථනය - 011-2695773

## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේලිකා අංක 78, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, ශ්‍රීමත් එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය ජූනි මස 22 වැනිදා බව සලකන්න.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.



### ▶ හරහට

1. මිහිඳු අනුබිමි සමග මිහින්තලාවට පැමිණි පිරිසෙන් එක් අයෙකි.
3. පස්වග මහණුන්ගෙන් කෙනෙකි.
7. රසකැවිලි වර්ගයකි.
8. බුදු පුදයට ගෙන යයි.
9. අපායේ රජුය.
10. බුදුරජුන් තමා බුදුයයි මුලින්ම පැහැදිලි කළේ මෙම ආජීවකයාටය.
12. අපේ පැරණි ගම්වල ගොවි ජනතාව වී ගබඩා කිරීම සඳහා මෙය භාවිත කළහ.
13. එදා ලක්දිව මෙම ගෝත්‍රයට අයත් ජනතාවන්ද විසූ බව ඉතිහාසයේ සඳහන් වේ.
14. අටලෝ දහමට අයත් වේ.

### ▼ පහළට

2. නිරෝගී භාවයෙන් අගතැන් පත් ධූරය දැරූ තෙරණුවෝ.
4. සැම බෞද්ධයෙක් විසින්ම මෙය රැකිය යුතුය.
5. පස්වග මහණුන්ට බුදුන් වහන්සේ සිය පළමු දම් දෙසුම දේශනා කළේ මෙම වන පෙත තුළ සිටය.
6. දස පාරමිතාවලට අයත්ය.
7. "දුකින් පසුවීම" යන තේරුම ගෙන දෙන වචනයකි.
10. පැණි රසැති පලතුරකි.
12. බොහෝ දෙනා මේ කරුණ නිසා පව් නොකරති.

**ප්‍රහේලිකා අංක 85 ජයග්‍රාහී වාසනාවන්තයෝ**

- එස්. ඩී. එම්. වික්‍රමසිංහ
  35, රාගල පාර,
  පිහිල්ලගස්සර

ඔබට යථාකාලයේදී දයාවංශ ජයකොඩි පොත් සමාගමේ වටිනා පොතක් තෑගි වශයෙන් ලැබෙනු ඇත.

**විමසීම් :**
011-2695773
(සුසිල්)

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම නව අදහස් [illegible]

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගාව, මහනුවර



- අන්තර්ජාලයෙන් පහසුවෙන් "දළදා වරුණ" කියවන්න
  www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# පොහොය දින වීදි සරණ පොසොන් පෙරහර

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ පොසොන් මහා පෙරහර ජූනි දෙවැනිදාට යෙදෙන පොසොන් පෝය දින සම්ප්‍රදායානුකූලව පැවැත්වේ. මෙදින සවස ශ්‍රී දළදා මාලිගාව මහ වාහල්කඩ අභියසෙන් පිටත් වන පෙරහර මාලිගා චතුරශ්‍රයේ ගමන් කර රැඳී යෙදේ.

ශ්‍රී දළදා මාලිගා ඇත් හත්තියේ අලි ඇතුන්, සංස්කෘතික කණ්ඩායම් සම්ප්‍රදායානුකූලව පොසොන් පෙරහරට සහභාගි වෙති.

මේ අතර පූජාපිටිය පලිපාන උඩුමුදන ශ්‍රී පූර්වාරාමාධිපති, අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ කාරක සභික අධිකරණ සංඝනායක මිනිවන්ගමුවේ රතනසාර නාහිමි අනුශාසනා පරිදි විහාර කාර්ය සාධක සමිතිය, පොසොන් උත්සව කමිටුව මගින් සංවිධානය කරන ශ්‍රී පූර්වාරාම පොසොන් පෙරහර ජූනි 2 වැනිදා 90 වෙනි වරටත් පැවැත්වේ. සවස 2 ට විහාර මළුවෙන් පිටත් වන පෙරහර වීදි සංචාරය කර සවස 6 ට විහාර මළුවෙන් යෙදේ. අම්බැන්න හපුගොඩ ශ්‍රී සුභද්‍රාරාම මහජන විහාරයේ ශ්‍රී සුභද්‍රා දහම් පාසල සංවිධානය කරන මිහිඳු මහ පෙරහර මෙවරද විහාරාධිපති ඔවුගොඩ සංඝබෝධි හිමි අනුශාසකත්වයෙන් පැවැත්වේ.

බොදු පුවත්

## දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්ම නාහිමිපාණෝ 75 වැනි වියට එළඹෙති



මහා විහාර වංශික සියම් උපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක ගෞරවාර්හ දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්ම නාහිමිපාණන්ගේ 75 වැනි ජන්මෝත්සවය අප්‍රේල් 16 වැනිදාට යෙදී තිබුණි.

යටිනුවර වතුරකුඹුර කනිෂ්ඨ විද්‍යාලේ ධර්මාචාර්ය නමින් වශයෙන් අධ්‍යාපන සේවයට පිවිස නියෝජ්‍ය විදුහල්පති, විදුහල්පති වශයෙන් වසර පනහළාවක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත වූ විමලධම්ම අනුනායක හිමියෝ, කුල දරුවකු වශයෙන් මල්වතු මහා විහාරයට වර්ෂ 1950.12.23 මුලින්ම පැමිණ බාල අවධියේදීම මල්වතු මහා විහාරීය සංඝරාජ මහ පිරිවෙන ධර්ම මූලස්ථානය කරගෙන ධර්ම ශාස්ත්‍රය ප්‍රගුණ කර ගත්හ. අඹුළුගම ශ්‍රී රාජගුරු විපස්සි මහානායක මාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා පණ්ඩිත රත්මිත්දේ අනෝමදස්සි, ලේඛකාධිකාරී පණ්ඩිත රඹුක්වැල්ලේ සුමංගල පඩිමහ තෙරවරුන්ගේ කර්මාචාර්යත්වයෙන් ඓතිහාසික මංගල උපෝසථාගාරයේදී 1965.12.30 වෙනි ජනම දින පැවිදිව, උපසම්පදාවක් ලබා ගත්තේ ගුරු දෙවියන් වහන්සේලා වන ඉලුක්වත්තේ ධම්මානන්ද, වතුරකුඹුරේ ඤාණවිමල මහ තෙරවරු දෙනමගේ ආචාර්යත්වයෙනි. පසුව තෙතත්, මහා සඟ පරපුරත් හැබිල වූ අඹුළුගම රාජගුරු ශ්‍රී විපස්සි පණ්ඩිත පහමුණේ ගුණානන්ද, පණ්ඩිත ලේඛකාධිකාරී යටිගම්මන ඤාණවිමල, පණ්ඩිත රත්මිත්දේ අනෝමදස්සි යන මල්වතු මහා විහාරයේ බහුශ්‍රැත පඬිවරුන් වෙතින් සංඝරාජ පිරිවෙන් දිස්තිමත්, ධර්මධර මහා රත්නයක් විසිට විමලධම්ම අනුනායක හිමිපාණන්ට හැකිවූයේ කෙටි කාලයකිනි.

එම අධ්‍යාපනයේ ප්‍රගුණතාවය නිසාම 1970-1975 යුගයේ කොළඹ විශ්වවිද්‍යාලයේදී ඉතිහාසය විෂය පිළිබඳව ගෞරව උපාධිය හිමිකර ගත් විමලධම්ම අනුනායක හිමියෝ පණ්ඩිත සිරිමල්වත්තේ විමලකීර්ති ශ්‍රී සුමන මල්වතු මාහිමිපාණන් විසින් මල්වතු මහා විහාරීය කාරක මහා සංඝ සභාවට පත්කරනු ලැබූහ. අවස්ථා දෙකකදීම ශ්‍රී දළදා සමිඳු සේවාවෙහි නිරතව ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් සිදුකරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර, වත් පිළිවෙත් ඉටු කරමින් ශ්‍රී දළදා මාලිගාවේ ආගමික කටයුතුවල නිරත විය. පසුව මල්වතු මහා විහාරීය විශාල වර්ගික කාරක මහා කාරක සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වශයෙන් තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමි විසින් පත්කරන ලදී. මල්වතු මහා විහාරීය අනුනායක පදවියට කාරක මහා සංඝ සභාවේ සම්මානිත්‍යෙන් තෝරී පත්වූ විමලධම්ම නාහිමියෝ ගැට ජිපිටිය රණවන යන පුරාණ විහාරයන්හි ආධිපත්‍යය දරමින් එහි අද සටතිත ශාසනික දියුණුවේ ආදි කර්තෘවරයෙක්ද විය.

## පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන්ට දිඝාසිරි



මහනුවර මල්වතු මහා විහාරීය කාරක මහා සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අංශයේ වැඩ බැලූ අංශාධිපති, ඓතිහාසික සෝමාවතී රජමහා විහාරාධිපති, ද්විභාෂා රාජකීය පණ්ඩිත පහමුණේ ශ්‍රී සුමංගල නායක හිමිපාණන්ගේ අප්‍රේල් 25 වෙනිදාට යෙදී තිබුණු 63 වෙනි ජන්මෝත්සවය නිමිත්තෙන් උන්වහන්සේට දිඝාසිරි ප්‍රාර්ථනා කිරීමේ ආගමික වැඩසටහන් මාලාවක් ඓතිහාසික රජමහා විහාරයේදී පැවැත්වීමට දායක සභාව කටයුතු යොදා තිබුණි.

වර්ෂ 1954 අප්‍රේල් මස 25 වෙනි දින වැලේවිල්ලි ගත්පත්තුවේ පහමුණේ (මීගොල්ල) දී උපත ලබා 1959 සිට 1967 දක්වා ඉඹිමාගමුව මධ්‍ය මහා විද්‍යාලෙන් ගිහි අධ්‍යාපනය ලබා 1968 මැයි 8 දින පණ්ඩිත පහමුණේ ධර්මකීර්ති ශ්‍රී සරණංකර ගුණානන්ද අනුනායක හිමිගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ලෙස පණ්ඩිත සිරිමල්වත්තේ ආනන්ද මාහිමිපාණන්ගේ උපාධ්‍යායත්වයෙන් පැවිදි බිමටත් 1974.06.12 දින උපසම්පදා ශීලයටත් ඇතුළත් වූ සුමංගල නාහිමියෝ සංඝරාජ පිරිවෙනෙන් ධර්ම ශාස්ත්‍රය ලබා එහි නියෝජ්‍ය පරිවේණාධිපති ධුරයටත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අංශයේ වැඩ බැලූ අංශාධිපති ධුරයටත් පත්වූහ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ භාෂා අංශයන්හි විවිධ තනතුරුද දරමින් ධර්ම ශාස්ත්‍රීය සේවාවන්හි නිරත වන සුමංගල නාහිමියෝ ග්‍රන්ථ කර්තෘවරයකු මෙන්ම ප්‍රවෘත්ති බෞද්ධ විශේෂාංග සංස්කාරකයකු ලෙස ලියා ඇති ලිපි, ග්‍රන්ථ සිය ගණනකි. පහමුණේ සුමංගල නාහිමිපාණන්ට අපිද දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමු.

කේ. බණ්ඩාරනායක

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැසීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බලු ඇණිය කොටත් ඇත් ඔහු උත්තමයෙකි."



# අටලෝ දහම දැක කම්පා නොවෙමු අප

බුදුරජාණන් වහන්සේගේ දේශනා අතර තවත් සුවිශේෂී ධර්මතාවක් ලෙස අටලෝ දහම හැඳින්විය හැකිය. උන්වහන්සේගේ චරිතය තුළ එම සුවිශේෂී ගුණාංගය මනාව පිළිබිඹු වේ. බෝධිසත්ව අවධිය තුළදීද, බුද්ධත්වයෙන් පසුවද ජීවිතය පුරාම අටලෝ දහමට මුහුණ දුන් ආකාරය ඉතා ශ්‍රේෂ්ඨය. අසූවරුද අසූවක් පමණ වූ කාලයක් තුළ ලෝක සත්වයා වෙනුවෙන් මුළු ජීවිතයම කැප කළ ඒ උත්තමයාණන් වහන්සේගේ චරිතය තුළින්ම අපට අටලෝදහම පිළිබඳ කරුණු දක්විය හැකිය.

ලෝකයේ කාටත් පොදු වූ ධර්මතා අටක් පිළිබඳවයි ඉහත ගාථාවෙන් පැහැදිලි වන්නේ. සෑම පුද්ගලයකුටම කිසිම භේදයකින් තොරව අටලෝ දහමට මුහුණ පාන්නට සිදුවේ.

1. ලාභ 2. අලාභ 3. අයස 4. යස 5. නින්ද 6. ප්‍රශංසා 7. සැප 8. දුක් යන ඒ අටලෝ දහමය.

**ලාභ අලාභ** - ලාභ නම් මිනිසුනට ලැබෙන ධන සම්පත් හා වෙනත් සම්පත් වැනි ලැබීමයි. සමහරෙක් පෙර කළ පාප කර්ම නිසා කිසිදු සම්පතක් නොමැති තැන්වල උප්පත්තිය ලබන අතර සමහරෙක් කළ පින් නිසා සැප සම්පත් ඇතිව උපත ලබති. කර්ම ශක්තිය දායාදයක් හැටියට සත්වයා භවයෙන් භවයට ගෙන යනු ඇත. සියල්ලෝම එකම ආකාරයෙන් උප්පත්තිය ලබන අතර සමාජය තුළ පුද්ගල විෂමතාවක් දක්නට ලැබෙන්නේ තුමන කරුණක් නිසාද යන්න දස ධම්ම සූත්‍රය, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය වැනි දේශනා තුළින් පැහැදිලි වේ.

"කම්මස්සකෝම්හි, කම්ම දායාදෝ, කම්ම බන්ධු, කම්ම පටිසරණෝ යං කම්මං කරිස්සාමි, කල්‍යාණංවා පාපකං වා තස්ස දායාදෝ භවිස්සාමිති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං."

සත්වයා කර්මය දායාද කොට ඇත්තේ යැයිද, කර්මය ඥාති කොට ඇත්තේ යැයිද මම කර්මය පිළිසරණ කොට ඇත්තේ යැයිද, යහපත් හෝ අයහපත් හෝ යම් කර්මයක් කරම්ද එය උරුම කොට ඇත්තේ යයිද... බුදුරජාණන් වහන්සේ වදාළහ.

මේ ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ එකම සත්වයා විෂමතා ඇතිව උපදිනවා පමණක් නොව විෂම ලෙස ජීවිතය ගතකරන බවය. දුප්පත් පොහොසත්, උගත් නූගත්, කුලවත් කුලහීන, ලස්සන අවලස්සන, උස් මිටි ආදී පුද්ගල ප්‍රභේද සඳහා කළ පින් පව් බලපාන බව බුදුදහමේ උගන්වන බවය.

බුද්ධ කාලයේ සිටි ධනවත්ම සිටුවරයකු ලෙස මරණැක් සිටුවරයා හැඳින්විය හැකිය. එසේ වුවද අටලෝ දහමෙන් ගැලවීමට නොහැකි විය. අසූ කෝටියක් තරම් වූ විශාල ධන සම්පතක් තිබූ එම සිටුවරයා පසුකාලීන වන විට සුරා සූදු දුරාචාරවලට ඇබ්බැහි වී මුළු ධන සම්පතම විනාශ කර ගත්තේය.

"ඉත්ථි ධුත්තො සුරා ධුත්තො අක්ඛ ධුත්තෝච යෝ නරෝ ලද්ධං ලද්ධං විනාසේති තං පරාභවතො මුඛං".

ස්ත්‍රී ධූර්ත වීම, සුරාවට ලොල් වීම, දුරාචාරයට ඇබ්බැහි වීම ආදී දුශ්චරිත තුළින් තම ධන සම්පත් කොතෙක් තිබුණද විනාශ වේ. එය පිරිහීමේ කරුණක් ලෙසත්, මෙලොව පරලොව දෙලොවම දුක් විඳීමට සිදුවන කරුණක් ලෙසත් දක්වා ඇත. එම සිටුවරයා කොතෙක් තම සැප විඳදත් පසුකාලීන වන විට යාචකයකුගේ තත්ත්වයට පත්විය. අන් අයට අසාධාරණ තමන්ගේ දුක් ගැනවිල්ල කියා සිනාසෑමට තරම් මෙම මරණැක් සිටුවරයා පත්විම ලාභ අලාභ යන ධර්මතාවය වටහා ගැනීමට හොඳම සාධකයක් ලෙස දක්වීමට පුළුවන. තවද අනේපිඬු සිටාණන්ගේ චරිතයද මේ සම්බන්ධව වැදගත් වේ.

අනේපිඬු සිටුතුමා බුද්ධ ශාසනය වෙනුවෙන් මහඟු සේවයක් කළ සිටාණන් කෙනෙකි. එම සිටුවරයා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට නිරන්තරයේ සැදැහැ සිතින් දන් පැන් දුන් ශ්‍රේෂ්ඨ සිටුවරයෙකි. එසේ වුවද එම සිටුවරයාටද ලාභ අලාභ නම් වූ ධර්ම චක්‍රයට හසුවීමට සිදුවිය. එම සිටුවරයාට මුලදී විශාල ධනයක් තිබිණි. කොතෙක් විශාල ධනයක් තිබුණද යත්න පනස් හතර කෝටියක් වියදම් කොට රමණීය ආකාරයෙන් දෙව්රම් වෙහෙර තනවා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කරන ලදී. මෙම දෙව්රම් වෙහෙර සිට බුදුරජාණන් වහන්සේ වැඩි සංඛ්‍යාවකින් සූත්‍ර පවා දේශනා කොට ඇත. ඒ බව බොද්ධ සූත්‍ර ග්‍රන්ථවලින් මනාව පිළිබිඹු වේ.

ලාභය සේම අලාභයද නම් සැප විඳින සත්වයාට මුහුණ පාන්නට සිදුවන ධර්මතාවකි. සමාජයේ කිසිදු භේදයකින් තොරව අටලෝ දහම චක්‍රීයව කැරකෙමින් සත්වයාට ඒ ඒ අවස්ථාවලදී එල විපාක ලබාදෙනු ඇත.

ලක්දිව ප්‍රකට රජකෙනෙක් හැටියට දුටුගැමුණු රජතුමා රට, ජාතිය, ආගම වෙනුවෙන් කළ සේවය අති විශාලය. විශාල පිරිසක් හා බලයක් තිබූ දුටුගැමුණු රජතුමා චූලංගනී යුද්ධයෙන් පැරදීලා වනගතව සිටියදී ලඟ සිටි මෙහෙකරුට කෑමක් මොනවත් නැද්ද කියා ඇසීමට තරම් අලාභ නම් ධර්මතාවට ඔහුට එද මුහුණ පාන්නට සිදුවිය. තවද රණශූර අභීත වීර පුරුෂයකු ලෙස ප්‍රසිද්ධියක් ඉසිලූ සීතාවක රාජසිංහ රජතුමා අන්තිම හුස්ම හෙළුවේ උණ කටුවක් පයේ ඇනීමෙන් අනාථව ඔරු කබලක් මතය. එලෙසම ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නොයෙක් දුක් කරදර කම්කටොලු විඳ හිරගෙදරදී මරණයට පත්වීමට සිදුවිය. ඉන්දියාවේ සිටි කොසොල් රජතුමා නම් වික්‍රමය දසත පතුරුවාගෙන සිටි රජ කෙනෙකි. එසේ වුවද එම ධර්මතාවෙන් වෙනස් වූයේ නැත. අවුරුදු අසූවේදී පාලු අම්බලමකදී මරණයට පත්විය. ඒ රජුටද අන්තිම සමයේ තම ජීවිතයේ දුක් විඳිමින් ඒ ධර්මතාව ඉස්මතු කොට පෙන්වා ඇත. මිසරයේ ෆාරුක් රජුට රාජ්‍ය අත්හැර හාර්මින් සිසට සමඟ පැය හයක් ඇතුළත රටෙන් පලා යාමට සිදුවීමත් ලාභ අලාභ නම් වූ ධර්මතා පෙරළියට නිදසුනක් වශයෙන් දක්වීමට පුළුවන. මේ ආදී වශයෙන් රජ රජ මහාමාත්‍යාදීන්ට පවා එම පොදු වූ ධර්මතාවට මුහුණ පෑමට සිදුවීම ලොව ඇති ධර්මතාව හොඳින්ම ප්‍රකට විණි.

බුදුරජාණන් වහන්සේගේ චරිතය තුළද ඒ පොදු ධර්මතාව මනාව පැහැදිලි වේ. බුදුරජාණන් වහන්සේටද නොයෙක් අවස්ථාවලදී ලාභ අලාභ නම් වූ ධර්මතාවට පත්වන්නට සිදුවිය. එයට හොඳම උදාහරණයක් ලෙස වේරංජාවේ වස් විසීම දක්විය හැකිය. උදය බමුණා වේරංජාවේ වස් විසීමට ආරාධනා කළත් දන් දීමට අමතක විය. වස් තුන් මාසයම බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නයට දානය නොමැති විය. බුදුරජාණන් වහන්සේට සෘද්ධි ප්‍රාතිහාර්යයෙන් මිහිරි ආහාරපාන ලබාගන්නට තිබිණි.

**පූජ්‍ය ගලගෙදර රතනවංස හිමි**